## 2020 මාර්තු මස 03 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරු සභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මී හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ර්.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |

❖ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව.9.35 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )**

**01.01** 2020.02.11 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

2020.02.11 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන නැත

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා කොඩි කණු ඉල්ලා විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ධර්මාශෝක විද්‍යාලයේ 2020.02.27 දින පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා අවශ්‍ය වන කොඩි කණු 50ක් 2020.02.27 වන දින පෙ.ව. 6.00 ට ඔබ ආයතනය මගින් අප පාසලට නොමිලේ ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින ලෙස ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉල්ලීමක් කරනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි , මාගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.නිවාසාන්තර මළල ක්‍රීඩා උළලේදී අපේ නම සඳහන් නොකළත් වහෙන් හොරා අපට පහර ගනවා. එමනිසා මා මාගේ විරෝධතවාය ප්‍රකාශ කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, එය ිදිලා අවසන් ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ඒ අවස්ථානුකුලව සභාව දැම්මට බැරි නිසා . මේ සම්බන්ධව තින්දු තීරණ ගැන මට විශ්වාසයක් තබා ගත නොහැකි නිසා මුදල් ගෙවීමක් කර තිබෙනවා. ඒ අනුව නැවත ගෙවීමක් සිදු කළ හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මෙහෙමයි. අපි අම්බලන්ගොඩ ධර්මශෝක විද්‍යාලයට මා ගරු උප සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා විද්‍යාලය සම්බන්ධව ගැටළු තබා ගන්න එපා. ළමුන්ගේ නිවාසාන්තර මළල ක්‍රිඩා උත්සවයට ඉල්ලා තිබෙන්නේ. විදුහල්පතිතුමාගේ පෞද්ගලික අවශ්‍යතාවයකට නෙමේ ඉල්ලා තිබෙන්නේ. ගැටළු තිබෙන්න පුළුවන්. අපටත් ගැටළු තිබෙනවා. එමනිසා මා ගරු උප සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේකට විතරක් මෙය සිදුකරන්න. විදුහල්පතිතුමා සමඟ තිබෙන ප්‍රශ්න අපි විසඳා ගන්නා ලෙස.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ ගරු මන්ත්‍රිවරු දන්නේ නැහැ. ලේකම්තුමියට මේ වන විට විදුහල්පතිතුමා දුරකථනයෙන් කතා කරන බනිනවා. අපේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට දුරකථනයෙන් කතා කර බනිනවා. මේක මෙහෙම ගෙනියන්න බැහැනේ. මේ වනවිට මුළු ලංකාවේම ලෝකයේම ප්‍රසිද්ධ පාසලක් තමයි ධර්මාශෝක විද්‍යාලය. එම පාසල සමඟ අපේ කිසිම තරහක් නැහැ. නමුත් විදුහල්පතිතුමා මේ වන විට ඒකාධිපති පාලකයෙක් විදියට කටයුතු කරනවා.මා ගරු මන්ත්‍රිවරුන්ට කියන්නේ එකයි. ඔහුට ඕන විදියට මේ නගරයේ තිබෙන පාසල පාලනය කරනවා. ඔහුට ඕන විදයට මේ පාසල පාලනය කරන්න පුළුවන් ඔහුගේ පරිපාලනය හරහා. නමුත් අපි නගරයේ දරුවන් වෙනුවෙන් කතා කරන්න ගිහින් අපට පහර ගහනවා නම් දිගින් දිගටම අපි මොකක්ද කරන්නේ එතකොට. දිගින් දිගටම. ගරු ලේකම්තුමියට හොඳටම දොස් කියා තිබුණා . මට කුණු වර්ගිකරණය කරන්න බැහැ කියා. ගරු මන්ත්‍රිවරුන් දැන ගත යුතුයි . අපි මුලින්ම ළමයින්ට තමයි ඉගැන්විය යුත්තේ කුණු වර්ගිකරණය කර වෙන්කිරිම. වෙන වෙනම බඳුන් දමා වෙන් කිරිමට. පොලිතින් , ඉඳුල් හා කඩදාසි . එක කරන්නේ නැතිව මෙතැන නගර සභාවේ ලේකම්තුමියට දොස් කීම වැරදියි. මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට දොස් කියන එකගැන වරදක් කර තිබෙනවා ද කියා . අපි බැලිය යුතුයි අපේ ආයතනයේ නිලධාරින්ට දොස් කීම වරදක් කර තිබෙනවා ද  කියා. වරදක් නොකර එහෙම දොස් කියන එක තේරුමක් නැහැ. විදුහල්පතිතුමන් සමඟ තිබෙන ගැටළුවට අපි පාසැල සමඟ සංසන්දනය කරන්නේ නැහැ. මෙම පාසැල ලංකාවේ ප්‍රසිද්ධ පාසලක්. පාසලත් සමඟ අපේ කිසිම ගැටළුවක් නැහැ. දිගින් දිගටම මේ විදියට පහර ගහන්න බැහැ. අපි ඔබතුමලා ගියා. විපක්ෂයේ ගරු මන්ත්‍රිවරු ගියා ගරු අමාත්‍යතුමා මුණ ගැසෙන්න. අපි අමාත්‍යතුමා මුණ ගැසීමට ගියේ නගරයේ දරුවන් ගැන කතා කරන්න. එය ගිය එකට ඔහු වෛරයකින් කතා කරනවා නම් මොකක්ද කරන්නේ. එතකොට අපට අයිතියක් නැද්ද නගරයේ දරුවන් වෙනුවෙන් කතා කරන්න. අපි ස්තුතිවන්ත වෙනවා. ගරු ආණ්ඩුකාරතුමාට. නගරයේ තිබෙන විශේෂ ගැටළු 3ක් විසඳුවා. ගරු නගර සභා මන්ත්‍රින් වන රාහුල මහතා, නන්දන රාජපක්ෂ මහතා, ධනසේන මාදුවගේ මහතා, ශ්‍රේෂන් කෙරමිණියගේ

මහතා අපි ගිහින් ගරු ආණ්ඩුකාරතුමාට කිවුවාම කුලරත්න විද්‍යාලයේ පන්තියක් වැඩි කර දුන්නා. ඒ හින්දා තල්ගස්ගොඩ , කෙරමිණිය, පොල්වත්ත, පින්නදූව , ඕකන්ද කියන ප්‍රදේශවල පාසලට හසු නොවූ දරුවන් කුලරත්න විද්‍යාලයට ගත්තා. අපි කතා කරන්නේ දරුවන් වෙනුවෙන්. අපි ගිහින් කතා කර සැහෙන මහන්සියක් ගත්තා. අන්තිමට ලේකම්තුමා දුන්නේ නැති වුණාම ගරු ලේකම්තුමාටත් දොස් කියා කෑ ගැසුවා. අන්තිමට මා කිවුවා මා මෙතැන වාඩිවෙනවා මෙය දුන්නේ නැතිනම් කියා. එහෙම කියා තමයි අපි නිර්දේශය අරගෙන ආවේ. ඒ අපි නගරයේ දරුවන් වෙනුවෙන් අපි කතා කරන්නේ. ඒ වෙනුවෙන් කතා කළ අපි ගැන වෛරයක් බඳිනවා නම් ඒ පිළිබඳව පිළිකුල් සහගතව හෙලා දකිනවා. අපි පාසැල සමඟ කිසිම වෛරයක් නැහැ.මාධ්‍යවේදි මහතුන්ට කියන්නේ අපි පාසැල සමඟ කිසිම තරහක් නැහැ. අපිට කරන්න පුළුවන් සියළුම දේවල් අපි සභාවේ මේ වනකම් කර තිබෙනවා. මේ මසක් වැනි කෙටි කාලයක තමයි මේ සිද්ධිය ඇතිවුණේ. මා ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට කියන්නේ අපේ පාසල සමඟ මාගේ කිසිම අමනාපයක් තරහක් නැහැ.විදුහල්පතිතුමා කරන අත්තනෝමතික ක්‍රියා නිසා තමයි ගරු මන්ත්‍රීවරු මේ විදියට ක්‍රියාත්මක වෙන්නේ. ඔබතුමලා දන්නේ නැතිව ඇති ලේකම්තුමියට හා මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ට දුරකථනයෙන් කතා කර දොස් කියනවා. එක වැරදි වැඩක්. විදුහල්පතිවරයෙකුට එහෙම කරන්න කිසිම අයිතියක් නැහැ. මේ වගේ ජනප්‍රිය පාසලක් කියා විදුහල්පතිවරයෙක් අපේ නිලධාරින්ට දුරකථනයෙන් තර්ජනය කිරිම ඉතාමත් පහත් ක්‍රියාවකි. අපිට එහෙම අනුමත කරන්න බැහැ. සභාවේ ඒවැනි ක්‍රියාමාර්ගයක් ගත්තේ එකයි. හෙට අනිද්දා වනවිට ගරු සභාපතිතුමාටත් කතා කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීවරුන් වන අපටත් කතා කරන්න පුළුවන්. ගරු ලේකම්තුමියට එහෙම කතා කරන කොට අනිත් අයට එහෙම කතා කරන එක අහන්නත් දෙයක් නැහැ. අපේ අතින් ධර්මාශෝක විද්‍යාලයට එහෙම කිසිම වරදක් වෙලා නැහැ. අපි වැරුද්දක් කරන්නෙත් නැහැ. එම නිසා මේ විදුහල්පතිතුමා සමඟ තිබෙන ගැටළුව අපි විසඳා ගත යුතුයි. එතුමා නටන මේ නාඩගමට අපි ඉඩ තියන්නේ නැහැ කියන ප්‍රකාශය මා කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ විදුහල්පතිතුමා මේ ධර්මාශෝක විද්‍යාලයට මුවාවෙලා තමයි මේ සේරම දේවල් කරන්න හදන්නේ. එතුමා දන්නවා මේ නගර සභාවවත් ගරු මන්ත්‍රීවරුවත් මේ විදුහල්පතිට විරුද්ධව කිසි දෙයක් කරන්නේ නැහැ.නගර සභාවෙන් ඉල්ලීම් කරන සියළුම දේවල් ධර්මාශෝක විද්‍යාලයට ලබා දෙනවා.මෙයා මේ ධර්මාශෝක විද්‍යාලයට මුවාවෙලා මේ දේවල් කරනවා. දැන් අපේ ලේකම්තුමියට හා නිලධාරි මහත්මින්ට ඔහු බනිනවා. මෙය නතර විය යුතුයි. විදුහල්පතිතුමා ගැන මෙතැන තීරණයක් ගන්න වෙනවා.මා නම් මෙයට විරුද්ධයි. එම විදුහල්පතිතුමාගේ ක්‍රියා කලාපය මා හෙලා දකිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, අපි අධ්‍යාපනය ලැබූ ධර්මාශෝක විද්‍යාලය, ධම්සෝ මාතාව පිළිබඳව අද මාධ්‍ය වල මේ සම්බන්ධව දමා තිබුණා. අපේ 90 කණ්ඩායම විසින් පාසලේ පවත්වනු ලැබූ සංගිත ප්‍රසංගයක් තිබුණා. ඔබතුමාට කතා කර තිබුණා මා කතා කරන්න කලින් කිහිපදෙනෙක්. ධම්මික

කොඩිකාර මන්ත්‍රීතුමා හා චම්පික මහතාත්. මාත් කතා කළා ගරු සභාපතිතුමා විදියට ඔබතුමාට. අපි නියෝජනය කරන්නේ ඔබතුමාණේ. සභාවේ වැඩ කිරිම පිළිබඳ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමාට ගරුත්වය නැතිවෙන විදියට විදුහල්පතිතුමා වැඩ කරන කොට ඒ වගේම අප සභාපතිතුමාටට විරුද්ධව විද්‍යාලය වැඩ කටයුතු කරන විට ඔය දෙගොල්ලන් දෙපැත්තකට යන විට විශාල ගැටළුවකට මතු වෙනවා. අපේ අම්බලන්ගොඩ සියළුම මහජනතාව බලාගෙන සිටින්නේ යම්කිසි වැඩ කොටසක් ඉටු වෙනවා දැකීමටයි. දැන් මේ කුණු කතන්දරයට මාත් ලොකු අපහසුතාවයකට පත් වුණා. මොකද මාගේ පාසැලේ අප සමඟ එකට ඉගෙන ගත් යාළුවන් මට කතා කරන විට ඔබතුමලාත් වැඩක් නැහැ. ගරු සභාපතිතුමාත් වැඩක් කියා ප්‍රකාශ කරන විට. ඇත්තටම හරිම අශෝභන විදියට තමයි එම කුණුටික දමා තිබුණේ. මමත් ගිහින් බැලුවා. මටත් නොයෙකුත් චෝදනා ආවා. එතනට ලොකු කළු ඉටි කොළයක් දමා ආවරණය කර තිබුණා. ගොඩක් අය එම ප්‍රසංගය නැරඹීමට පැමිණියා. ඉතිං මා ඔබතුමාට කතා කරද්දි මා මේ ඔබතුමාට චෝදනා කරනවා නෙමේ.ඔබතුමා මට කිවුවා කුණුටික අතුලාගේ ගෙදර ගිහින් දමා ගන්න කියා.දැන් ඔබතුමාට අපි ගරු සභාපතිතුමා විදියට ගෞරුත්වයක් ඇතිව කතා කරනවා නම් අපිට එහෙම සෘජුව මේ ටික හරියට කෙරෙන්නයි අවශ්‍යා . මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාටත් කියා තිබෙනවා එහෙමම .කුණුටික ගෙදර අරන් යන්න ඕන කියා.තව එකක් ඔබතුමා කිවුවා කසළ වෙන්කර නැහැ කියා. අපි ඇත්තටම හිතනවා පොඩි දරුවන් තමයි ප්‍රාථමික පැත්තේ ඉන්නේ. ඒ කුඩා දරුවන්ට තෙරෙන්නේ නැහැ. එම කසළ වෙන්කර දැම්මට. ඒ සඳහා විදුහල්පතිතුමා කවුරුහරි සේවකයෙක් එතැනට යොමු කළ යුතුයි. මේක අපේ පාසැල. පාසැල සමඟ විදුහල්පතිවරු මාරු වෙනවා. මොකද මේ විදුහල්පතිතුමා ගනු ලැබුවේ අපේ සංවිධායකතුමා. ඇත්තටම මෙතුමා කියන දේවලුත් විදුහල්පතිතුමා අනුමත කරන්නේ නැහැ. නගරයේ ප්‍රධාන පුරවැසියා විදියට පාසැලේ දේවල් වලට ඔබතුමාට ආරාධනා කරන්න ඕන. විදුහල්පතිතුමා ගරු මන්ත්‍රීවරුත් සමඟ ලේකම්තුමියට ඔහොම චෝදනා කරන එක වැරදියි. අපි ගරු මන්ත්‍රීවරු විදියට පාසැල ගැන මීට වඩා අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම කසල ප්‍රශ්නය. අපට ලොකු චෝදනාවක් වෙනවා මේ පිළිබඳව පුවත්පත් වල පළ වු පසු. මොකද කැත විදියට අපි ගැන හිතන්නේ. ඔබතුමාටත් අපිත් ගරු මන්ත්‍රීවරු විදියට ලොකු අපහසුතාවයට පත්වෙනවා. අපි දෙගොල්ලන්ගේම ගෞරුත්වය තිබෙන විදියට වැඩ කළ යුතුයි. විදුහල්පති ඉන්නත් පුළුවන් යන්නත් පුළුවන්. විදුහල්පතිතුමා සමඟ මාගේ කිසිම ගැටළුවක් නැහැ. පාසැල පිළිබඳ කිසිම ගැටළුවක් නැහැ. මා පාසැලේ කිසිම දෙයකට සම්බන්ධ වෙන්නේ නැහැ. 90 කණ්ඩායමේ දෙයකට හැරෙන්න. අපේ නංගිගේ දරුවා දමා ගන්න බැරි කතන්දරයට. අපි ගරු මන්ත්‍රීවරු කියා අපේ ළමයි දමා ගන්න කතන්දරය නෙමේ. චක්‍රලේඛණයක් තිබෙනවා. එයට පිටින් යන්න බැහැ. ගරු අමාත්‍යාවරු දමනවා. දේශපාලන බල අධිකාරිය දමනවා. පංතියකට 40ක් තිබෙන්නේ. එක ළමයෙක් හරි ඇතුළත් වෙනවා මෙයට. අපි සෘජුව විදුහල්පතිතුමාට චෝදනා කරන එකත් වැරදියි. අපි සභාවක් විදියට ගරු සභාපතිතුමාට තැන නැතිවෙනවාටත් කැමැති නැහැ. පුටුවේ අපේ සංවිධායකතුමා හිටියත් ජනතා විමුක්ති පෙරමුණේ කෙනෙක් හිටියත් අපේ සභාවේ ගරුත්වය නැති වෙනවාට කමැති නැහැ ගරු මන්ත්‍රීවරු විදියට. ඒ වගේම පාසැලේ ගරුත්වයත් අපි නැති කරගන්න හොඳ නැහැ. අපි කාරුණිකව ගරු උප සභාපතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා මේ ගැටුම තියා ගන්න එපා. අපි අවධානය යොමු කරන්න කියා සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ධර්මාශෝක විද්‍යාලයට මෙවැනි ප්‍රශ්න ඇතිවීමට මූලික වුයේ විදුහල්පතිතුමාගේ අත්නෝමතික ක්‍රියා කලාපය නිසා . කිසිසේත් ගරු සභාවේ සභාපතිතුමා කවුද ඔබද කියන කිසි දෙයක් නැත. අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාට එම මන්ත්‍රිකට ගරුත්වයට කැළලක් වන දෙයක් විදුහල්පතිවරයාගෙන් හෝ පාසැලේ එම වගකිව යුතු පුද්ගලයන්ගෙන් සිදු වෙනවා නම් ප්‍රකාශ වෙනවා ඒ පිළිබඳව බලවත් අප්‍රසාදය හා කනගාටුව ප්‍රකාශ කරනවා. එය එසේ නොවිය යුතුයි කියා කියනවා. එහෙම වෙනවා නම් අපිටත් යම් තින්දු තීරණ ගැනිමේදි එක පාරක් නෙමේ දහපාරක් ධර්මාශෝකය ගැන හිතලා තමයි තින්දු තීරණ ගන්නේ.මමත් ධර්මාශෝකයේ ආදි ශිෂ්‍යයෙකි. දැන් අපේ ලේකම්තුමියට දුරකථනයෙන් විදුහල්පතිතුමා තර්ජනාත්මක විදියට කතා කළානම් ඒ නම නෙමේ ඒ තනතුරේ ගෞරුත්වය ආරක්ෂා කිරිම ඔබතුමා ඇතුළු අප සැමගේ වගකිමකි. එයට අපට ක්‍රියා මාර්ග ගත යුතු වෙනවා. මින් ඉදිරියට එසේ නොවිමට එම පාර්ශවය දැන ගත යුතු වෙනවා. මා ඉල්ලිමක් කරනවා ඒ පිළිබඳව ලිඛිතව තිබෙනවා නම් විද්‍යාලය දැනුවත් කරන්න. අනිත් එක ඔබතුමා ඇතුළු අපිත් දරුවන් සිටින දෙමාපියන්. අපේ දරුවනුත් යනවා පාසැල් වලට. ඕනැම පාසලක ප්‍රථමික අංශයේ ඉඳලා ඉහළ පන්ති වල 1වෙනි පන්තියේ සිට කසළ දැමිය යුතු තැන උගන්වනවා. නොදිරන , දිරන කසළ වෙන් කිරිමට බඳුන් තිබෙනවා. අපි පන්ති සුද්ද කර තිබෙනවා අපේ ළමයින් පාසලට යන විට. මාසයකට දිනයක් ගොස් අපිත් පන්ති සුද්ද කරනවා. එතකොට එම පන්තිවල බඳුන් තබා තිබෙනවා. එතකොට පාසැල් වල කම්කරුවන් ඉන්නවා. ධර්මාශෝකයේත් කම්කරුවන් ඇති 25කට වඩා. අපේ නගර සභාවේ සිටින සේවකයා එතැනට ගිහින් කසළ බඳුන ගෙන එම කසළ වෙන්කරන්න ඕන නම් එය නොකළ යුතුයි. අපේ සේවකයා ඉන්නේ එය එකතු කරගෙන ගෙනියන්න. අපේ සේවකයන් නැහැ එම ධර්මාශෝක විද්‍යාලයේ , දේවානන්ද විද්‍යාලයේ කසළ බඳුන් ඇඳ ඒවා වෙන් කරන්න. එයට කොහොමත් ඉඩ දෙන්න එපා . අපි එකට විරුද්ධයි. එහෙම දෙන්න බැහැ. එතකොට විදුහල්පතිවරයා එක බලාපොරොත්තු වෙනවා නම් ඒක නතර කළ යුතුයි. විදුහල්පතිතුමා දැනුවත් කරන්න කුණුටික වෙන්කර තබන්න. එතකොට අපි එම කුණුටික අරගෙන යන්නම් කියා. මොකද අපි කිසිම පාසලක් අපහසුතාවයට පත් නොකළ යුතුයි. අපි නගරයේ සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රිවරු විදියට. අපි ඉන්නේ නගරයට වැඩ කරන්න. අපි ඉන්නේ මේ ලස්සන තියාගෙන මේ නගරයට සේවයක් කරන්න. එහෙමනම් අපි එම සේවය කළ යුත්තේ අපිට තිබෙන නීතිරීතිත් සැලකිල්ලට ගෙන. මා ඉල්ලිමක් කරනවා ධර්මාශෝක විද්‍යාලයට මෙතැන කිසිම නිලධාරියෙකු නගර සභාවට , කිසිම නිලධාරියෙකුට අපහාස නොවන විදියට කටයුතු කළ යුතුයි. අනෙක් දෙවන කරුණ නගර සභාව අනෙක් මහජනතාවට දි තිබෙන පරිදි කසළ වෙන්කර තබන්න. එම කසළ ගෙන යාමට. එතකොට කසළ ගෙනියනවා. ඒ නැතිව අපේ සේවකයන් දමා කුණු වෙන්කරන්න යන්න එපා. මාගේ බලවත් කනගාටුව හා අප්‍රසාදය නගර සභාවට එහෙම කතා කිරිම සම්බන්ධව , අපේ ලේකම්තුමියට එසේ කතා කිරිම පිළිබඳවත් මින් ඉදිරියට එසේ නොවේවි කියා මා හිතනවා. එසේ නොවුණහොත් අපිට ඊට වඩා දේවල් වලට ගරු මන්ත්‍රිවරු වශයෙන් නගරයේ ජනතාව වෙනුවෙන් ගමේ ජනතාව වෙනුවෙන් අපිට පාරට බහින්න දවසක් එයි. වැඩි ඇතක නැතිව.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මා හිතන්නේ මෙහි අර්ථය වෙන්නේ කොඩි කණු 50ට රු.10 ගණනේ රු.500 ක් අයකර තිබෙනවා. එම මුදල විද්‍යාලයට ගෙවනවාද නැද්ද කියන එකයි මෙතැන සාකච්ඡා වෙන්නේ. ඒ අශ්‍රිතව අවශ්‍ය කරුණු වලට මුලින් උත්තර දෙන්නම්. මෙය ගෙවන්න කැමතිද ? අකමැතිද ? නිසිවේලාවට මෙය ඉදිරිපත් කරන්න පාසැල විසින් ලිපිය ඉදිරිපත් කර තිබුණේ නැහැ. මෙම ගාස්තු නිදහස් කරන්න සභාවෙන් ඉල්ලීමක් කරන්න. එම ලිපිය තමයි මේ තිබෙන්නේ. එතකොට මේ මුදල් ගෙවන්න අකමැත්තක් තිබෙනවාද?

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් මේ කොඩි කණු ඉල්ලි ඇති ලිපියනේ ඉදිරිපත් කර තිබෙන්නේ. අපි මෙහෙම ඉල්ලුවාම පාසැල වෙනුවෙන් දෙන්නේ. විදුහල්පතිතුමාගේ පෞද්ගලික දෙයකට නෙමේ . එතකොට විදුහල්පතිතතුමා සමඟ වෙන වෙන ප්‍රශ්න තිබුණා නම් අපි සභාව දැනුවත් කරන්න. එකට අදාළ නිත්‍යානුකූල කටයුතු ගතහැකියි. මේ පාසලට දෙනලද එකට එම මුදල් නිහදස් කරන්න. අපි මෙය කරන්නේ පාසැලේ දරුවන් වෙනුවෙන්.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙය නිදහස් කරන එකට කවුරුහරි විරෝධතාවයක් තිබෙනවාද? ඒකමතිකව අපි ගෙවන්න තින්දු කරනවා. ඒ වගේම අර කසළ ප්‍රශ්නය සම්බන්ධව ගරු මන්ත්‍රීවරු දෙදෙනෙක් අපහසුතාවයට පත් වුණා. මාගේ හිටපු ලේකම්වරයෙකුත් අපහසුතාවයට පත්වුණා. චම්පික ප්‍රයශාන්ත මහතා මට මුලින්ම දුරකථනයෙන් ප්‍රකාශ කළා. හිටපු ලේකම්වරයෙක් 1997 කාලය වන විට. ඊට පසු ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාත් , ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතාත් කතා කළා. මේ කසළ වෙන්කිරිම සම්බන්ධව අපේ ලේකම්තුමියට බොහොම බලහත්කාරි අන්දමින් දුරකථන ඇමතුමක් ලබා දී තිබෙනවා. ධර්මාශෝක විදුහලේ ගරු විදුහල්පතිතුමා. කසළ වෙන්කර අදින්න බැහැ. කසළ තිබෙන විදියට අදින්න කියා. ඔගොල්ලන් නගරයේ අනිත් තැන්වල අදිනවා නම් මේක අදින්න බැරි ඇයි කියා.අපි පිළිගන්නවා නගරයේ විනයක් තිබ්බේ නැහැ කියා. අපි දැන් විනයක් හදාගෙන යනවා. ඒ කියන්නේ කොහොන් හරි කවදා හරි මේක පටන් ගන්න ඕන. දැන් විනයක් හදාගෙන යනවා. දිරන සහ නොදිරන වශයෙන් කසළ වෙන්කර ලබා ගන්නවා. ඒ වගේම මේ සභාවට කියන්න ඕන නොදිරන කසළ වශයෙන් සතියකට රු.10000/= ක වගේ ආදායමක් අපි ලබනවා ඒවා විකුණා සභාව. අපි කසළ ඇදිමට පමණක් ලක්ෂ 400ක් පමණ වැය කරනවා වසරකට මේ සභාව. මුළු වරිපණම් ගෙවන්නේ අපේ සියළුම දෙනා ලක්ෂ 200කි. සියළු දෙනාම ගෙව්වත්. මෙහි හැමදාම ලක්ෂ 100 ක පමණ හිඟයක් එනවා. නමුත් අපි ලක්ෂ 400ක වැඩ කොටස කරන ගමන් තමයි මේ කොටස කරන්නේ. ඉදිරියට වන විට මේ කොටස කරන ගමන් අවශ්‍ය තැනට ගියේ නැතිනම් මේ සභාව කවදා හරි එකපාරට කඩා ගෙන වැටෙනවා. මෙහි පුටුවේ කවුද ඉන්නේ කියන එක නෙමේ. මෙහි ඔබතුමලාට අත්දැකිම තිබෙනවා ගරු හිටපු සභාපති ජී.එම්. සිල්වා මහතාගේ කාලයේ එකපාරට උසාවියෙන් තහනම් නියෝගයක් ගෙන එනු ලැබුවා. අම්බලන්ගාඩ නගරයේ කසළ මාස තුනක් ඇදිමට බැරි වුණා. අපි ඒ කාලයේ ගුණරත්න විරකොන් ඇමතිතුමාගේ කාලයේ කරන්දෙණියේ වළක් කපා කසළ වළ දැම්මේ. ඉතිං ඒ විදියට තමයි කටයුතු කළේ. මෙය

අපට ඉදිරියට එනවා. මේ තත්ත්වය ලේහෙසියෙන්ම විසඳගත යුතු තැන තමයි පාසල. පාසැලෙන් තමයි මේ පණිවුඩය ගමට යන්නේ. අද අම්බලන්ගොඩ නගරය තුළ පාසැල් තුළ ශිෂ්‍යයින් 13000 ක් විතර ඉගෙන ගන්නවා. මේ 13000 මෙය ඉගෙන ගෙන නිවසට යවන්න පුළුවන් වුණානම් මේ කසළ වෙන්කිරිම සහ කසළ තුළින් මුදල් උපයන්න පුළුවන් සම්පතක් කියා ඉගැන්වීමට පුළුවනි.පාසැලක ගුරුවරයකු වුණාම ඉගෙන ගත්ත දරුවෙකුට ඉගැන්වීම හොඳ ගුරුවරයෙකු වෙන්නේ නැහැ. මෝඩ ළමයෙකුට උගන්වා ඔහු උගතෙක් වීම තමයි වඩා වැදගත් වෙන්නේ. එමනිසා උගතුන්ට උගන්වන්න ධර්මාශෝකයේ විදුහල්පති අවශ්‍ය නැහැ. අපට නූගත් ළමයා උගතෙක් කිරිමට ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පති අවශ්‍ය වෙනවා. ඉතිං ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා බලන්නේ අපේ දරුවන් ආපසු එම කුණු ගොඩටම තල්ලු කර දමන්න. අපේ අම්බලන්ගොඩ මුළු ශිෂ්‍ය පරපුර අපි රටට ආදර්ශමත් වෙන්න ඕන. අපි යම්කිසි ආදර්ශයක් ගෙනියන්න ඕන. අපිට තරම් මේ වගේ සම්පතක් වෙන කිසිම නගර සභාවකට නැහැ. එක පාරට 13000ක් පමණ ශිෂ්‍ය සම්පතක් තිබෙන පාසැල් තිබෙන නගරය වන්නේ මේ අම්බලන්ගොඩයි. ඉතිං මේ පොඩි කැල්ලේ අපට ගමට යම්කිසි පණිවුඩයක් දෙන්න පුළුවන් නම් ඒ ගම තුළ ඇතිකරන්න පුළුවන් නම් අපි ඒක ඇතිකරන්න ඕන. අද වෙනවිට දේවානන්ද විදුහලේ මේ ප්‍රශ්නය නැහැ. අද වෙනවිට කුලරත්න විද්‍යාලයේ මේ ප්‍රශ්නය නැහැ. ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රශ්නය නැහැ. පොල්වත්ත පාසැලේ මේ ප්‍රශ්නය නැහැ. ඒ අය මෙයට අනුගතවෙලා ඉවරයි. ඇයි ධර්මාශෝක විද්‍යාලයට විතරක් අනුගත වෙන්න බැරි. එහි කුණු දමන්න තැන් ඕන තරම් තිබ්බා. විදුහල්පතිතුමා ඕනකමින්ම මේ ශාලාව ඉදිරිපිට කුණු ගොඩ ගසා ජනතාවට පෙන්වනවා නගර සභාව අප්‍රිය කිරිමේ චේතනාව තුළ. මා දුටුවා මුහුණු පොතේ අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ආදි සිසුවෙකු ලෙස මේ ටික එකතු කරගෙන ගිහින් දමනවා. එතුමා පාසැලේ සිටින පුද්ගලයෙකු වශයෙන්. අපිත් ධර්මාශෝක විද්‍යාලයේ ඉගෙන ගත්ත කෙනෙක්. අපි හැමදෙනාටම පාසැල වෙනුවෙන් කැක්කුමක් තිබෙනවා. මේ පාසැල වෙනුවෙන් ගම වෙනුවෙන් කැක්කුමක් නැති කෙනෙක් මෙයට ආවම ඕක තමයි. අපි සියළු දෙනාටම කියන්න ඕන ධර්මාශෝක විද්‍යාලයට ඕන වේලාවක අපි උදවු කර තිබෙනවා. හැම වේලාවෙම කර තිබෙනවා. අද ධර්මාශෝක විද්‍යාලය අම්බලන්ගොඩ නගර සභාව නැති වුණාම නම් ක්‍රිඩා සඳහා අදි ශිෂ්‍යයන් වශයෙන් ක්‍රිඩාව කරගෙන යාම සඳහා තව ලක්ෂ 200 ගනක් දෙන්න වෙනවා මේ ක්‍රිඩා ටික කරගෙන යාම සඳහා. මේ සියළුම පහසුකම් ලබා දි තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාව. අම්බලන්ගොඩ නගර සභාවේ සම්පත් තමයි පාවිච්චි කරන්නේ මේ හැම කෙනාම. අපි කවදාවත් ඒවා මුදල් ලබා දි දිලා නැහැ. නොමිලේ ලබා දි තිබෙනවා. අපි හැමදාම ඒ ශිෂ්‍යයන් වෙනුවෙන් ඒ දේවල් කරදි තිබෙනවා. අද ක්‍රිඩාංගණය හදාගෙන යනවා. වියදම් බැලුවාම අපි කොයිතරම් වියදමක් කර තිබෙනවාද එය හදාගෙන යන්න. ඒ වගේම ක්‍රිඩාංගණ පාවිච්චි කරන්න. ලංකාවේ තිබෙන හැම පාසලක්ම පුහුණු වීම් සඳහා විශාලය මුදලක් ගෙවනවා. අම්බලන්ගොඩ නගරයේ කිසිම පාසලක් ඒ පුහුණුවිම් සඳහා කිසිඳු මුදලක් ගෙවිම් කරන්නේ නැහැ. අපි එය නොමිලේ ලබා දි තිබෙනවා. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයේ පැයකට අයකරන මුදලයි අම්බලන්ගොඩ නගර සභාවේ බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයේ පැයකට අයකරන මුදලයි සංසන්දනය කර බලන්න. පාසැල කොතරම් ළමයින්ගේ මුදල් හූරාගෙන කනවාද? අපි ඊට වඩා අඩුවෙන් දරුවන්ට සෙල්ලම් කරන්න පහසුකම් ලබා දි තිබෙනවා. ඉතිං ඒක තමයි තත්ත්වය. අද පිහුනුම් තටාකය ගත්තොත් එහෙම ධර්මාශෝක විද්‍යාලයේ සියළු පාසැල් අයින්

කරලා ධර්මාශෝක විද්‍යාලයෙන්. දේවානන්ද විද්‍යාලය පුහුණුවීම් කරනු ලබන්නේ ගඟේ. එහි විදුලි අලෝකය දමාගෙන කරනු ලබන්නේ ජේනරේටර් යොදාගෙන. ඒ අය ඉල්ලීමක් කරනවා මෙයට විදුලි ආලෝකය කර දෙන ලෙස. ඉතිං එවැනි තත්ත්වයක තිබෙන්නේ. බොහොම හිතුවක්කාරයි. අනිත් පාසැල් සමඟ තිබෙන සුහදතාවය. ඒ වගේම අනිත් ක්‍රීඩකයෝ කෙරෙහි දක්වන සුහදතාවය. කිසිවක් නැහැ. දැන් පාසලේ සිටින ඔබට ඒ වගේ තත්ත්වයක් නම් මා කල්පනා කරන කාරණය මේ විදුහල කසළ වෙන්කිරිම කියන එක හරියටම කරන්න ඕන. මොකද මේ විදුහලේ 6000 පමණ ළමයින් ඉන්නවා. එම ළමුන් 6000 ගමට මෙය ගෙනියනවා. ගමට ගෙනගියාම ගෙදරත් මේ දෙයම කරනවා. පොඩි දරුවන්ට ඒ දේවල් කියා දුන්නාම ඔවුන් ඒ දේවල් කරනවා. මේ දේ වඩා වැදගත් වෙනවා. ඒ වගේම ධර්මශෝක විදුහලේ ශිෂ්‍යයන් වෙනුවෙන් මේ කියන දේවල් ලබා දෙන්නේ මේ කියන නිලධාරින්ගේ බලපෑම් මත නෙමේ. ඒ ශිෂ්‍යයන්ගේ, දරුවන්ගේ යහපත වෙනුවෙන් කියා අපි මතක් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මට දැනගන්නට ඕනේ ඇත්තටම කසළ වෙන්කළයුතුද කියා. අපේ පැත්තේ නම් කසළ වෙන්කර අරගෙන යනවා. කසළ අංගනයේ මේවා වෙන්කර දමනවාද කියා සියයට සියයක් ඔබතුමා දන්නවාද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

කසළ අංගනය සඳහා අපි වෙනදා කරනු ලැබුවේ මේවා වළ දැමීම. නමුත් දැන් එන කසළ වල අපි වෙනම පරික්ෂා කිරිම සඳහා වැඩ පරික්ෂකවරයෙකුත් , තවත් සේවකයන් දෙදෙනෙකුත් කසළ අංගනයට දමා තිබෙනවා. ඒ එන ඒවා අපි වෙන වෙනම වෙන්කර එතැන රැස් කරනවා. වෙන්කළ පසු සමහර කසළ තිබෙනවා මොන විදියකට වත් අපිට භාවිතා කරන්න බැරි ඒවා තිබෙනවා. එතකොට ඒ කොටස බැහැර කරන්නම වෙනවා. අනිත් ඒවා ටික අපි විකුණනවා. තවම ගිහින් නැත්තේ කොම්පොස්ට්න් විතරයි. මේ කොම්පෝසට් වැඩ පිළිවළත් ඉදිරියට අපි කරගෙන යනවා. වෙන්කිරිම තුළ තමයි අපිට යන්නේ. එකපාරට අපිට කරන්න බැහැ. වසර ගණනක වැරදි පුරුද්දක් අපි අනුගමනය කර තිබෙන්නේ. අපි වැරදියි. එතකොට අපි මෙය පිළි අරගෙන අපි වෙනස් විය යුතුයි. ඇයි අපි වෙනස් වෙනවා නම් මේ සියළු දෙනාට මේ වෙනස් විම තුළ අනුගත වෙන්න බැරි.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

කසළ වෙන්කිරිමේදි කසළ අංගනයට එකපාරටම කසළ ගෙනහින් දමනවාද කියා දන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

වෙනදා අපි එතැනට සේවකයෙක් යොදවා තිබෙනවා. උදාහරණයක් වශයෙන් මෙහි වැඩ පරිපාලක ලෙස මා මෙහි යෙදෙව්වේ ඔබ කණ්ඩායමේ ඉල්ලීම පරිදි සුමිත් මහතා. ඔහුගේ සේවාව හොඳ නැහැ කියා නිලධාරි මහත්මීන් විසින් මට වාර්තාවක් ලබා දුන්නා . එතැනට වෙනත් සේවකයෙකු යොදවා තිබෙනවා. තව සේවකයන් තුන්දෙනෙකු අපි එතැනට දමනවා. ඒ

තුන්දෙනා මඟින් කසළ වෙන්කර යම්කිසි මුදලක් උපයා ගන්නවා. මට එම කසළ විකුණා ගනු ලැබූ ආදායම පිළිබඳ ගොනුව ඉදිරිපත් කරන්න කියන්න. එම වෙන්කිරිම අපි සතිපතා විකුණනවා. විකිණිම තුළ අපි ලාභයක් ලබනවා. දැන් අපි ඊළඟට යන්න ඕන කොම්පෝස්ට් කර ඊළඟට අයින් වෙන්න ඕන. මෙහෙම දෙයක් තිබෙනවා. ගෙන එන විට සමහර වේලාවට කවලම් වෙන ඒවා තිබෙනවා. අපි උපරිම උත්සාහ කරන්නේ අන්තිම දක්වා මෙය සිදු කරන්න. අපිට මේ දෙය අවුරුද්දකින් දෙකකින් කර නිම කරන්න බැහැ. හැබැයි ටික කාලයක් යනවිට මේ නගරය හොඳ තත්ත්වයට මේ නගරය පත්කර ගැනීමට හැකිවෙනවා. නැතිනම් මේක කරන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම අපි දන්නේ නැහැ ගරු ලේකම්තුමියටයි, මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාටයි මේ වගේ තත්ත්වයක් ඇතිකර තිබෙන බව.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා තව දෙයක් කිව යුතුයි. අපට අලුත් මහජන සෞඛ්‍ය පරික්ෂක මහතෙකු පත්වුණා. අම්බලන්ගොඩ නගර සභාව වෙනුවෙන්ම පත්වීමක් ලැබී පැමිණ තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, දැන් ඔබතුමා ඉතාමත් හොඳින් මේ නගරයේ කුණු එකතු කරනවා. එතකොට පාසැල් තුළ ඔබතුමා දැනුම් දිම තුළ සිදුවෙනවා. දැන් කුලරත්න විද්‍යාලය ගත්තාම වෙනම කාමර තුනක් හාදා තිබෙනවා. එම විදුහල්පතිතුමා. එය සාදා තිබෙන්නේ එම පිළිවෙළ තුල ඒ ක්‍රමවේදය තුළ අනුගත වෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් කුලරත්න විද්‍යාලයේ තිබෙනවා දිරන, නොදිරන, ප්ලාස්ටික් කියා ගසා කාමර තුනක් ඉදිකර එම කාමර තුනෙන් තමයි කසළ ගන්න තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නගරයේ ප්‍රධාන පාසලක් වන ධර්මාශෝක විද්‍යාලයේ මොන මොන ප්‍රශ්න තිබ්බත් දැන් නගරයේ නගර සභාවත් සමඟ සහායෝගයෙන් කටයුතු කළ යුතුයි. අපි ගරු මන්ත්‍රිවරු පාසැලට ළමයින් ඇතුළත් කිරිම ඒ වගේ එක එක ප්‍රශ්න වලදි කතා කරනවා. ඒක අපේ රාජකාරියක්. මොකද අපි නගරයේ ජනතාව වෙනුවෙන් පෙනි හිටින්න ඕන. එතකොට ඔබතුමා තමයි නගරයේ විධායකයා. දැන් මොනවා හරි ප්‍රශ්නයක් ගැටළුවක් ඇති වුනාම වුණත් ගරු මන්ත්‍රිවරුන්ට කතා කළ කිව හැකියි මෙන්න මේ ගරු මන්ත්‍රිවරයා මේ වගේ ප්‍රශ්නයක් ඇති කර තිබෙනවා. එතකොට ඔබතුමාට මන්ත්‍රිවරයාට වුණත් කිව හැකියි. මොකද නගරයේ ප්‍රධාන පාසැලක විදුහල්පතිවරයා අත්තනෝමතිකව වැඩ කළ යුතු නැහැ.මේක අපි අවබෝධ කරගත යුතුයි. නගර සභාවේ ප්‍රධාන විධායකයා ලෙස කටයුතු කරන ලේකම්තුමියට එසේ දෝෂාරෝපණය කිරිම වැරදියි. එතකොට ධර්මාශෝක විද්‍යාලයේ සේවකයින් 27කු සිටිනවා. එතුමාගේ භූමිකාව විය යුත්තේ මේ පරිසරය

තුළ මේ දරුවන් හැඩ ගස්වා එම සේවකයන් ලවා හරි මෙය කරන්න. එයට අනුගත වෙන්න. මහජනතාව වෙනුවෙන්. ඩෙංගු උවදුර හැම තැනම තිබෙනවා. පාසැල් වලට බෝවුණොත් ගැටවවක්. අපේ ලේකම්තුමියට හා මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාට මොනවා හරි ප්‍රශ්නයක් සිදු වී තිබෙනවා නම් නිත්‍යානුකූලව කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. මේ නගරයේ වගකීම ඉටුකරන නිලධාරින්ට ඒ වගේ කටයුත්තක් සිදු වෙනවා නම් එය වැලැක්වීම අපේ වගකීමකි. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් මෙයට අනුගත නොවී වැඩ කරන වා නම් මේ විදුහල්පතිද තනතුර පිළිබඳ ප්‍රශ්නයක් නෙමේ නීතිය ක්‍රියාත්මක කරන්න ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රතිචක්‍රීකරණයට පෙළඹීලා අපි දැන් භාණ්ඩ විකුණනවා. ඒ අනුව අපි මෙය ආරම්භ කළේ 2019 වර්ෂයේ. දෙවැනි මාසයේදි අපි රු.11838/= ලබා ගෙන තිබෙනවා. තුන්වෙනි මාසයේ රු.22926/=ක් ලැබී තිබෙනවා. අප්‍රේල් මාසයේ 5428/=ක් ලැබිලා තිබෙනවා. පස්වන මාසයේ රු.5404/=ක් ලැබී තිබෙනවා. 11වෙනි මාසයේ රු.1745/= ලැබී තිබෙනවා. 12 මාසයේ රු.2977.50 ලැබී තිබෙනවා. මේ වසරේ පලවෙනි මාසයේ රු.9652/=ක් ලැබී තිබෙනවා.දෙවෙනි මාසයේ රු.6135ක් ලැබී තිබෙනවා. ඒ අනුව පසුගිය වසරේ අපි රු.50318.50කුත් , මේ වසරේ රු.15787කුත් වශයෙන් කසළ වෙන්කිරිමේ පෙළඹීම තුල එම ආදායමක් සභාව ලබා තිබෙනවා.

තීරණය

**03.02 ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙලක් පැවැත්වීම සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය වෙන්කරවා ගැනීම සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණය වෙන්කර ගැනීම . ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය.46 වැනි ජාතික මහ ක්‍රිඩා උළෙලේ ප්‍රථම අදියර තරග ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන අන්තර් ක්‍රිඩා සමාජ ක්‍රීඩා උළෙල සඳහා 2020.03.28 වන සෙනසුරාදා දින ඉහත සඳහන් ක්‍රීඩාංගණය නොමිලේ වෙන්කර දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා තිබෙනවා. ඊට අමතරව ඒ අශ්‍රිතවම ලිපියක් එවා තිබෙනවා . ක්‍රීඩා උළලේ පවත්වන අන්තර් ක්‍රිඩා තරඟ සඳහා 2020.03.08 ඉරිදා හා 2020.03.12 බ්‍රහස්පතින්දා 2020.03.27 සිකුරාදා යන දිනයන් වලදි ඉහත සඳහන් ක්‍රිඩාංගණය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. එයටත් අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

**03.03 විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළකිරීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත. විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම. අම්බලන්ගොඩ නගර සභාව. ඒ අනුව 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 10 වන වගන්තිය අනුව ඔබ නගර සභාවේ පරිපාලන සීමාව තුළ පනවන ලද ගාස්තු පිළිබඳ ගැසට් නිවේදන භාෂා ත්‍රිත්වයෙන් සකස් කර ගැසට් පත්‍රයේ පළ කිරිම සඳහා 1989 අංක 12 දරණ පළාත් සභා ( ආනුශාංගික විධිවිධාන ) පනතේ දෙවන වගන්තියේ ( 1) වන උප වගන්තියේ ( අ ) ඡේදය සමඟ කියවිය යුතු විනෝද බදු පනතේ 2 වගන්තියේ ( 2 ) වන උප වගන්තියේ පැවරි ඇති බලතල ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වා ඇති බවට පළාත් පාලන නියෝජ්‍ය කොමසාරිස් නිරූපා පී. මානගේ මහත්මිය විසින් දැනුම් දීමක් සිදු කර ඇත. ගැසට් කිරිම කරන්න. එය ක්‍රියාත්මක කරන්න පුළුවන්. විනෝද බදු සංශෝධනය කරන්න පුළුවන්.

තීරණය

**03.04 2020.03.21 දින පැවැත්වෙන පාපැදි තරඟාවලිය සඳහා ලංකා බැංකුව අසල ඇති බිම් තීරුව සහ කොඩි කණු 15 ක් නොමිලේ ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ ක්‍රීඩා හා පාපැදි සමාජය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ , ක්‍රිඩා හා පාපැදි සමාජය , නගර සභාව සතු භූමිය ලබා ගැනිම සඳහා. අප ක්‍රිඩා සමාජය 04 වන වරටත් පවත්වනු ලබන පාපැදි තරඟාවලිය 2020 මාර්තු 21 උදේ 8.30 ට අම්බලන්ගොඩ ලංකා බැංකුව අසලින් ආරම්භ වේ. එම ලංකා බැංකුව අසළ බිම් තිරුව හා කොඩි කණු 15ක් නොමිලේ ලබා දිමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. එය ලබාදිමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය -

**03.05 අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ ගිනිගල් සැකසීම හා නව රේල් පීලි සවිකිරීම සම්බන්ධවයි යන මැයෙන් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ පොල්වත්ත ආදාහනාගාරයේ ගිනිගල් සැකසීම හා නව රේල් පීලි සවිකිරීම සම්බන්ධවයි. ඒ අනුව අප ආයතනයේ ඉංජිනේරු මහතෙකු සහ සේවක මහතකු විසින් ස්ථානිය පරික්ෂාවක් සිදු කරන ලද අතර පහත සඳහන් අළුත් වැඩියා කටයුතු කිරිමට සිදුවන බව දන්වා ඇත.

01. ඇදවී ඇති රේල් පීලි ඉවත් කොට අලුතින් පීලි සවිකිරිම හා ඊට අදාළ බඳාමයන් දමා පිළිසකර කිරීම.

02. පළුදු වී ඇති ගිනිගල් මාරු කිරීම.

03 රේල් පීලි සවිකිරිමට අවශ්‍යC - Chanel අලුතින් යෙදීම.

04. වැඩ නිමවූ පසු අදාළ පරීක්ෂාවන් කොට බාර දීම.

ඉහත අළුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු මුදල රු296000 වේ. අද දින සිට මාස තුනක් වලංගුයි කියා තිබෙනවා. ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ආදාහනාගාරනේ. ඒවා අවශ්‍යයි.

තීරණය

**03.06 අම්බලන්ගොඩ පබැදිමුල්ල ආදාහනාගාරයේ ගිනිගල් සැකසීම හා නව රේල් පීලි සවිකිරීම සම්බන්ධවයි යන මැයෙන් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ පබැදිමුල්ල ආදාහනාගාරයේ ගිනිගල් සැකසීම හා නව රේල් පීලි සවිකිරීම සම්බන්ධවයි. එකමයි. එයට රු.432000 ක මුදලක් වැයවෙනවා. එක අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එයත් කළ යුතුයිනේ. එයත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය දෙකම එකට කරන්න එපා. එකක් කරලා අනිත් එක කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය මේ ආදාහනාගාර දෙකෙම වැඩ එකට කරන්න එපා. එකක් කර අවසන් වුණාම අනිත් එකේ වැඩ පටන් ගන්න. නැතිනම් දෙකම වසන්න වෙනවා.

තීරණය -

**03.07 වසා දමා ඇති ගා/ධම්මකුසල විද්‍යාලය පිළිබඳව අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කලාප අධ්‍යාපන කාර්යාලය , අම්බලන්ගොඩ වසා දමා ඇති ධම්මකුසල විද්‍යාලය පිළිබඳ. දකුණු පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපියේ පිටපතක් අපට එවා තිබෙනවා. දකුණු පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂකගේ දප/අදෙ/ජාපා 05/02/01/01 හා 2020/01/01 හා 2020/01/31 දිනැති ලිපිය හා බැදේ. ගා ධම්මකුසල විද්‍යාලයේ භූමිය පහත සඳහන් කාර්යන් සඳහා මේ වන විට ඉල්ලුම් කර ඇත.

01. අධ්‍යාපන ලේකම්ගේ /12/02/60 හා 2019/07/25 දිනැති ලිපියට අනුව අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා සංවර්ධනය සඳහා ඉල්ලා සිටි.

02. අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ දප/අදෙ//ජාපා 05/02//01/01 හා 2020/01/31 දිනැති ලිපිය මඟින් ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ( ක්‍රීඩා පහසුකම්) භාවිතා කිරිම සඳහා ඉල්ලා සිටි.

ඉල්ලිම් 2ක් ඉල්ලා සිටිනවා. නගර සභාවත් ඉල්ලිම් කර තිබෙනවා . දේවානන්ද විද්‍යාලයෙනුත් ඉල්ලා සිටිනවා. ඉහතින් සඳහන් ඉල්ලිම් සඳහා පාසල් භූමිය ලබා දීමට හැකි වන්නේ එම භූමිය තුළ ද්විතියික පාසලක් පෝෂණය කරන ප්‍රථමික පෝෂිත පාසලක් ආරම්භ කිරිමෙන් පසුව බව සඳහන් කරයි. මීට පෙර ද වසා දැමු පාසල පිළිබඳ පෝෂිත ප්‍රාථමික පාසලක් ආරම්භ කිරිමට යෝජනා කර තිබුණි. එම යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ ගරු අභියාචනාධිකරණයේදී විභාග වී අවසන් වූ නඩු අංක C,A, 10/2012 හා 2013.05.07 දින නඩු තීන්දුවට අදාළව බව සඳහන් කරයි. එම නඩුවට අදාළ ලේඛන ඇමුණුම් I,II,III වශයෙන් ලිපියට අමුණා ඇත. ඊළඟට පාසල පිළිබඳ විස්තර තිබෙනවා. විශේෂයෙන් දක්වා ඇති කරුණු පඔනක් කියන්නම්. අභියාචනා අධිකරණය හමුවේ ඉදිරිපත් වූ කරුණු වනුයේ, හිටපු පළාත් පාලන අමාත්‍යතුමාගේ ලේකම්තුමාගේ දිවුරුම් ප්‍රකාශය අනුව පෝෂිත පාසලක් අනුමත කළ යුතුව ඇත. වෙනම නමකින් පෝෂිත පාසලක් නම්කිරිම එය සාර්ථක වීමට පහත සඳහන් ප්‍රායෝගික බාධා පැන නැගෙන බව සඳහන් කර ඇත.

01. අම්බලන්ගොඩ නගරයේ ජනප්‍රිය පාසල් 05ක් පවතින අතර ඒ සියල්ලෙම 1 වසර සඳහා පන්ති 22ක් පැවතිම. ධර්මාශෝක විද්‍යාලයේ පන්ති 6, දේවානන්ද විද්‍යාලයේ පන්ති 5, ප්‍රජාපති විද්‍යාලයේ පන්ති 4, බුද්ධ දත්ත විද්‍යාලයේ පන්ති 3, කුලරත්න විද්‍යාලයේ පන්ති 4. ඉදිරියේදි කුලරත්න විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණි වලට පන්තියක් වැඩි කරන ලෙස මේ වන විට ඉල්ලා ඇත.
02. අම්බලන්ගොඩ නගර සීමාව තුළ ග්‍රාම නිලධාරි වසම තුළ වර්ෂයකට උපත් සංඛ්‍යාව 300-305 ක් අතර සාමාන්‍ය අගයක් පවති.
03. එක් පන්තියකට 35 නා බැගින් පන්ති 22 කට ගණනය කිරිමේදි සිසුන් 770 ගණනේ දැනටමත් ජනප්‍රිය පාසල් තුළ ලැබි ඇත.

04. නගර සභා සීමාව තුළ ඉපදෙන ළමුන් 350කට ආසන්න ප්‍රමාණයක ළමුන් ඇතුළත් වීමෙන් පසු ළමුන් 350 කට පමණ සියළු පාසැල් වලට ඇතුළත් වීමට හැකිවෙනු ඇත. එසේ තිබියදී ධම්මකුසල විද්‍යාලය පිහිටි ප්‍රදේශය අම්බලන්ගොඩ ඕනෑම දරුවෙකුට ඉහත සඳහන් ඕනෑම ජනප්‍රිය පාසැලකට ඇතුළත් වීමට හැකියාව ඇත. එම නිසා අළුතින් වෙනම නමකින් ප්‍රාථමික පාසලක් ආරම්භ කරනවා වෙනුවට ප්‍රජාපති ගෝතමී බාලිකා විද්‍යාලයේ පෝෂිත පාසලක් ආරම්භ කිරිම යෝග්‍ය බව යෝජනා කරමි.දැනටමත් ප්‍රජාපති ගෝතමී විද්‍යාලයට යාබදව ගොඩනැඟිලි තදබදය පවතින අතර ඉඩකඩ පහසුකම් නොමැතිව බරපතල ගැටළුවක සිටි. ප්‍රජාපති විද්‍යාලයේ සිට ධම්මකුසල විද්‍යාලයට මීටර් 400 වැනි අඩු දුරක් පවති. ගා පි/ දි එස් කුලරත්න විද්‍යාලයට දැනට යෝජනා කර ඇති 1 ශ්‍රේණියට තවත් අළුත් සමාන්තර ශ්‍රේණි පන්තියක් වැඩි වුවහොත් ඉදිරියේදි බුද්ධදත්ත විද්‍යාලයේ දැනට පවතින සමාන්තර ශ්‍රේණි 3 ට සිසුන් ඇතුලත් කිරිම ඉතා අඩුවේ. නගර සීමාවේ පවතින පෝෂිත පාසලක් වන බුද්ධ දත්ත විද්‍යාලයට දැනටමත් සිසුන් ඇතුළත් වනුයේ සිසුන් 40ක ප්‍රමාණයකි. එම සිසුන්ගෙන් වැඩි ප්‍රමාණයක් ගා / පී. ද එස් කුලරත්න විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණිවල පන්තියක් වැඩි වුණහොත් ඉදිරියේදි බුද්ධදත්ත විද්‍යාලයට සිසුන් ඇතුළත් නොවුනු ඇත. පිට ප්‍රදේශ වලින් බුද්ධ දත්ත විද්‍යාලයට ඇතුළත් වන සිසුන් නිකම්ම ප්‍රදේශයේ පාසැල් වල 6වෙනි ශ්‍රේණියට ඇතුළත් වේ. එම නිසා 6වෙනි ශ්‍රේණියෙන් ඉහළ පන්ති පමණක් පැවැත්වෙන ගාමිණි විද්‍යාලයේ හා බුද්ධ දත්ත විද්‍යාලයේ සිසුන් අඩු වී වැසියාමේ අවදානමකට ලක්වෙනු ඇත. ඉහත සඳහන් කරුණු අනුව වසා දමා ඇති ධම්මකුසල විද්‍යාලයේ අළුතින් ගොඩනැඟිලි ස්ථාපනය කර ප්‍රජාපති විද්‍යාලයේ පෝෂණය සඳහා පෝෂිත ප්‍රාථමික පාසලක් ආරම්භ කරන ලෙස යෝජනා කරනවා. මෙහිදි වසරින් වසර ක්‍රමානුකුලව ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රාථමික අංශය ඉවත් වෙමින් පෝෂිත පාසලේ පන්ති ආරම්භ කළ යුතුය. ගා / ධම්මකුසල විද්‍යාලයේ අළුතින් ඉදිවෙන ගොඩනැඟිලි නම් කිරිමේදි ධම්මකුසල නාහිමි අනුස්මරණ ශාලාව නම් කිරිමට යෝජනා කරනවා. ධම්මකුසල විද්‍යාලයට පර්චස් 125ක් පවතින නිසා නගර සභාවට යෝජනා කර ඇති ක්‍රිඩා කටයුතු වලට ධම්මකුසල පෝෂිත පාසලක් ආරම්භ කිරිමෙන් පසුව යම් භුමි ප්‍රමාණයක් නිහදස් කිරිමට හැකියාවක් තිබේද දැයි සොයා බැලිය හැකිය. වසා දමා ඇති ධම්මකුසල විද්‍යාලය ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රාථමික අංශය වෙනුවට පෝෂිත පාසැලක් ආරම්භ කිරිමට යෝජනා කරන බවට නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලිපියක් එවා තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඕක කුමන හේතුවක් නිසා වත් අධිකරණයේ තින්දුව දි තිබෙන්නේ පාසලක් මිසක් වෙනත් කිසිදු කර්තව්‍යයකට මෙය භාවිතා කළ නොහැක. සංවර්ධන කමිටුවේදි හිටපු ප්‍රධාන අමාත්‍යතුමාත් , මාත් ඔය පිළිබඳව අවධානය යොමු කරලා කිවුවේ මෙම ධම්මකුසල පාසැල තිබුණේ පළාත් සභා යටතේ. එම නිසා මෙය පළාත් සභාව යටතේ තිබෙන පාසලකට ලබා දිම තමයි සුදුසුම ක්‍රියාව. එමනිසා ළඟම පිහිටි පාසල ප්‍රජාපතිය නිසා එවකට හිටිය විදුහල්පතිතුමියටත් , කළාප අධ්‍යක්ෂකතුමියටත් කිවුවා ඔබතුමියලා ඉල්ලිම කරන්න සංවර්ධන

කමිටුවට. එතකොට මෙය ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රාථමික් අංශය හෝ අංශ කිහිපයක් එතැනට ගෙනියන්න කියන ඉල්ලීම කළා. එමනිසා කුමන කටයුත්තකට ඉල්ලුවාත් අධිකරණයේ අවසාන තීන්දුව දී තිබෙන්නේ ප්‍රථමික පාසලක් පිහිටු විමට හැර වෙනත් තෘතියික හෝ කාර්මික විද්‍යාල ආදි කිසිම වෙනත් දෙයකට දෙන්නේ නැහැ. හැබැයි අර ලිපියේ තියෙනවා යම් තැනක ප්‍රජාපති විද්‍යලයේ ප්‍රාථමික පාසලක් ආරම්භ කළ පසු අපට යම් කොටසක් ලබා දීමට සලකා බලන්නම් කියා. ඒක හොඳ ප්‍රවණතාවයක්. ප්‍රජාපතියට යම් කොටසක් අරගෙන අපට පිට්ටනියට යම් කොටසක් ලබා ගැනිමට හැකිනම් එය ඉතා හොඳ දෙයකි. අපි කොච්චර උත්සාහ කළත් වැඩක් නැහැ. එහි තිබෙනවා පැහැදිලිවම. මා මේ නඩු වාර්තාව කියෙව්වා. පැහැදිලිවම තිබෙනවා. කිසිම කටයුත්තකට දෙන්නේ නැහැ කියා. එමනිසා අපි මෙය ප්‍රජාපතියට දෙන්න කියා. අපිටත් ඔය ක්‍රිඩා කටයුතු සඳහා ඔය කෙලින් තිබෙන ප්‍රමාණයක් දෙන්න කියා අපි ඉල්ලීමක් කරන්න.මේ නගරයේ තිබෙන සියළුම පාසැල් වලට මේ ක්‍රිඩා පිටිය පාවිච්චි කරන්න පුළුවන්. මෙය පාසලට ගන්න විට සභාවෙන් පිට්ටනියට යාබදව තිබෙන තීරුව ලබා දෙන්න කියා ඉල්ලීමක් කරන්න. එහිදි අපට යම්කිසි දෙයක් ගන්න පුළුවන් . මොකද මෙය පාසැල් ළමුන්ට පාවිච්චි කරන්න දෙන නිසා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ ධම්මකුසල විද්‍යාලයේ නඩු තින්දුව ලබා දි තිබුනේ නැවත පාසලක් අරම්භ කිරිමට තමයි ලබා දි තිබුණේ. අපි ඉල්ලීමක් කරනවා අධිකරණයෙන් නැවත ඉල්ලීමක් කර හරි එය නවත්වන ලෙස. දැනටත් ගැහැණු දරුවෙකුට ප්‍රජාපතියට ලකුණු 5ක් හා කුලරත්න විද්‍යාලයට ලකුණු 5 බැගින් කැපෙනවා. අළුතින් පාසලක් ඇරියොත් ධම්මකුසල විද්‍යාලයට ලකුණු 5ක් කැපෙනවා. මහ අම්බලන්ගොඩ, පනියන්දුව , එඬේරමුල්ල දරුවෙකුට පාසලකට යාමේ අවස්ථාව නැති වෙනවා. මොකද ගොඩක් අය මෙය අරින්න හැදුවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විෂය භාර අමාත්‍යවරයා සිටින කාලයේ. ඕක ප්‍රජාපතියට ප්‍රථමිකය ගෙන්න උත්සාහ කළා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිතුමා මේ ලිපියේත් කියන්නේ 1 ශ්‍රේණියට අම්බලන්ගොඩ පාසැල් වලට ළමුන් 700ක් ඇතුල් කරන්න පුළුවන්. ඇතුල් කිරිමට ඉන්නේ ළමුන් 350 කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු හිටපු ප්‍රධාන අමාත්‍යතුමා විෂයභාර අමාත්‍යවරයාව සිටින කාලයේ මෙය ප්‍රජාපතියේ ප්‍රාථමිකයට මෙය ඇතුළත් කරන්න හැදුවා. මෙය මොකක් හරි බලපෑමක් මත මෙයට පිටින් ගෙන්න එපා කියා උද්ඝෝෂණය කරලා තමයි කොහොම හරි මෙය නැවතුනේ. අපි ඉල්ලීමක් කරන්න මෙය ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රාථමිකය ගෙන්නත් , ක්‍රිඩා පිටියේ එම රවුම ගැනිමට පොඩි අඩුපාඩුවක් තිබෙනවා. එම නිසා යම්කිසි කොටසක් ක්‍රිඩා පිටියටත් ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවට අපි යෝජනා කර යවන්න කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකට.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ ධම්මකුසල විද්‍යාලය ගැන කතා කරන කොට මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ධම්මකුසල මහ විද්‍යාලයට ගිය කෙනෙක් හැටියට කතා නොකොළහොත් එය ලොකු අඩුපාඩුවකි. මා හිතන විදියට අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ නිර්දේශයක් වෙන්නැති ඔබතුමාට එවා තිබෙන්නේ. ඒ අනුව දැන් අවුරුදු සැහෙන ප්‍රමාණයක් තිස්සේ ගොඩනැඟිලි කිසිම පරිහරනයකට ගන්නේ නැතිව නඩු තීන්දුව උඩ දිරා පත්වෙලා යනවා. මෙහි විදුලිය තිබෙනවා. ජලය තිබෙනවා. ඇත්තටම බුදු මැදුර දුටුවාම මට මතක් වෙනවා පාසැල තිබෙන කොට අපි හැමදාම පාසැලේ බුදුන් වැද්දේ එම බුදු මැදුර ඉදිරිපිට. අද එය කැළෑවෙන් වැහිලා. මිට කලිනුත් සභාවේදි කියා තිබෙනවා මෙය එළි කර කැළෑව ඉවත් කර දෙන ලෙස. ඒ වගේම ඔය අධ්‍යාපන අධ්‍යක්ෂක කාර්යාලය නිතරම කියන දෙයක් තමයි එහි අයිතිය තිබෙන්නේ ඒ අයටනේ. නමුත් මේ ගොඩනැගිලි කඩා ගෙන යනවා. එක කාලයක එහි තිබෙන වහළේ තිබෙන හොඳම ලී ගලවාගෙන ගිහින්. එවාට විසඳුමක් දෙන්නේ නැතිව ඒවාට ප්‍රධාන තැන දිය යුතුයි. මේ වගේ අපේ සම්පත් ආරක්ෂා කිරිමට. කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයෙන් ඒ දේ වත් වෙන්නේ නැහැ. මා දිලිප් මහතා සමඟ කතා කළා. එතුමාට මේ ගැන උනාන්දුව තිබෙනවා. මේ පාසල යම් කාර්යක යොදවන්න. එතුමා තමයි මේ ටිකටවත් මූලික වෙලා කටයුතු කර තිබෙන්නේ. එමනිසා මා කියන්නේ මොන යම් දෙයක හෝ නඩුවක් තිබ්බට එම නඩුව අනුව ඉතා ඉක්මනින්ම යොදවා යම්කිසි කාර්යක යෙදවිම යම්කිසි වගකිමක් කියා මා සිතනවා. අපේ ගරු මන්ත්‍රිතුමා කියා සිටියා මේ පාසලෙන් මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට ලකුණු 5 ක් අඩු වෙනවා කියා. වෙන්න පුළුවන්. නමුත් මේ පාසැල ගැන කතා කරන්න ගියාම සැහෙන වේදනාවක් මට ඇති වෙනවා. මොකද ධම්මකුසල විද්‍යාලයට ගිය අය නොයෙකුත් උසස් රැකියාවල යෙදෙනවා. හොඳ පුරවැසියන් වශයෙන් සමාජයේ ජීවත් වෙනවා. මොකද අධ්‍යාපනය අතින් හොඳම අධ්‍යාපනයක් තිබුණ පාසැල. අද ඔය තත්ත්වයට වැටි තිබෙන්නේ. එම නිසා මෙයින් උපරිම ප්‍රයෝජන ගන්න. මා විශ්වාස කරන දෙයක් තමයි ළමයා මොන පාසැලට ගියත් එම ළමයා තම හැකියාවෙන් ඉදිරියට යනවා. දියුණු වෙන්න හොඳ පහසුකම් තියෙන්න ඕන තමයි. නොතිබුණත් එම දරුවා තම හැකියාවෙන් ඉදිරියට යනවා. මොන පාසැලට ගියත්. හොඳ පුරවැසියන් වශයෙන් දරුවන් බිහි වෙන්න අපි ප්‍රර්ථනා කරනවා වගේම මේ ධම්මකුසල විද්‍යාලය අපේ ගරු සභාපතිතුමාට නිර්දේශ කර තිබෙන ප්‍රජාපති විද්‍යාලයට ලබා දෙන්න. ගරු සභාපතිතුමනි, ප්‍රජාපති විද්‍යාලයට ලබා දෙන්න හිටපු ගරු ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් මැතිතුමා සියල්ල සූදානම් කළා. ඒ අවස්ථාවේ මොනවා හරි ප්‍රශ්නයක් උඩ උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඇතිවෙලා පිටතින් ආපු අය තමයි ඒ දෙයට විරුද්ධ වුයේ. එම කාර්ය කරන්න බැරිව ගියා. මා හිතන විදියට ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රාථමික විද්‍යාලය කරන්න මේ ධම්මකුසල විද්‍යාලය. කළුතර සිට ගාල්ල වෙනතුරු කාන්තා විද්‍යාලයකට තිබෙන්නේ ප්‍රජාපති විද්‍යාලය විතරයි. එම නිසා කාන්තා විද්‍යාලයක් වශයෙන් මේ ප්‍රජාපති විද්‍යාලයට මේ පහසුකම් ටික දුන්නොත් ලොකු සහායෝගයක් වෙනවා. එම නිසා මීට පසු මා ධම්මකුසල විද්‍යාලය ගැන කතා කරන්න බලාපොරෝත්තු වෙන්නේ නැහැ. අපි මිට කලිනුත් ඇවිත් සභාවේ මේ ගැන කතා කර තිබෙනවා.එම නිසා ඔබතුමලාට යම්කිසි බලයක් තිබෙන නිසා මේයට මැදිහත් වෙලා මේ කාර්ය සඳහා ප්‍රජාපති විද්‍යාලය හරි , කුලරත්න විද්‍යාලයට හරි මොන විද්‍යාලයකට මේ සම්පත දිලා උපරිම ප්‍රයෝජනය ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ඒ සඳහා ඔබතුමාගේ දැඩි සහායෝගය බලාපොරෝත්තු වෙන බව පවසමින් මා නිහඬ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ ධම්මකුසල විද්‍යාලය ගැන කතා කරන විට නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා තමයි මේ ලිපිය එවා තිබෙන්නේ.එතකොට මෙහි අන්තර්ගතය බැලුවාම මා පලමුවෙන්ම පෙන්වා දෙන්න කැමතියි. මෙහි ඉදිරිපත් වෙලා තිබෙන සංඛ්‍යාලේඛණ අනුව ළමුන් 700ක් ඇතුළත් කර ගන්න පුළුවන් කිවුවාට මේ ජාතික පාසැල් වලට චක්‍ර ලේඛණය අනුව මෙයින් ඇතුළ් වෙන්නේ 50% කි. එතකොට 50% ක් එළියේ. එය මා පෙන්වා දෙන්න කැමතියි වැරදි අර්ථ කථනයක් වෙන නිසා. නමුත් මා නැගි සිටියේ මේ විද්‍යාල පරිශ්‍රය මේ විද්‍යාල 5න් කොයි පාසැලට දුන්නත් ගන්නවා. මේ පාසැල් 5ට දැඩි ඉඩම් හිඟයක් තිබෙනවා. එහෙම බලනවා නම් ධර්මාශෝකය වැදගත් වෙන්න බැහැ. මේ පැත්තෙන් මහ පාර. එහි පුද්ගලික ගෙවල්. මොකද ඊට එහා ඒ අයට යන්න බැහැ. ජාතික පාසැලක් . විශාල ළමුන් පිරිසක් ගැහැණු පිරිමි ළමුන් සිටිනා. දෙවැනි තුන්වෙනි පන්තියේ. එතකොට ඊට අවශ්‍ය සියළුම පහසුකම් දෙන්න ඕන. ගරු සභාපතිතුමනි, දේවානන්ද විද්‍යාලයට වුණත් එහෙමයි. අපි ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රිවරුන් නිලධාරින් නෙමේ. මේ නගරයේ පාලකයෝ. අපිට බුද්ධියක් හා අවබෝධයක් තිබෙන්න ඕන තව අවුරුදු 10කට 20කට කොහොමද මේ නගරය තිබෙන්න ඕන කියන එක. මේ නගරයේ දූ දරුවන්ට, මේ නගරයේ පුද්ගලයින්ට , වැසියන්ට අවශ්‍ය පහසුකම් දීම පිළිබඳව. එමනිසා අපට ඉතා කුඩා කෝණ වලින් මේ දිහා බලන්න බැහැ. මේ නගරයේ පාසැල් සඳහා සහ මේ නගරයේ දරුවන්ගේ ක්‍රිඩා කටයුතු සඳහා අපට විශේෂ වූ තැන් දෙන්න තිබෙනවා. එතකොට මානාන ක්‍රිඩාංගණය සැහැල්ලු පන්දු ක්‍රිඩා තරඟ පැවැත්වීමට හා පාපන්දු ක්‍රිඩාවේ නියැලිමට තමයි අද තිබෙන පහසුකම් තිබෙන්නේ. එතකොට මේ පාසැල් 5ටම ප්‍රයෝජනයක් වෙනවා ක්‍රිඩා පිටිය සඳහා මේ භූමිය ලබා ගැනිමට පුළුවන් නම්. හැබැයි ගරු අධිකරණයේ නඩු තින්දුව තිබෙන නිසා හරස් විමක් වි තිබෙනවා. ඒ ගැන අපි කල්පනා කර සාකච්ඡා කරන්න තිබෙනවා. එයට ක්‍රමවේදයක් විදියට අපට අත්‍යවශ්‍ය නම් පුළුවන් අර කිවුව පහසුකමුත් තිබෙනවා. ගමේ මන්ත්‍රිවරයාගේ පහසුකමුත් තිබෙන නිසා ප්‍රජාපති විද්‍යාලයට 1 වසර සඳහා ගොඩනැගිල්ලක් ලබා දෙන්න. ඒ කොටස ලබා දුන්නාත් අපට 500 පථයකට හා 400 පථයකට යාමට හැකියාව තිබෙනවා. එතකොට ඒ සියළු පහසුකම් ඒ මානාන ක්‍රිඩාංගණයේ ඉදිකරන්න පුළුවන් වෙනවා. අනාගතයේදි එය ක්‍රිඩාගාර දක්වා වැඩිකිරිමට හැකියාව තිබෙනවා. මේ ගම් දියුණු වෙන්න ඕන. මේවා හැමදාම පනියන්දුව , මානාන විදියට තිබෙන්න බැහැ. මේවා මේ නගරයේ කොටස් දියුණු වෙන්න ඕන. අර්ධ දියුණු තත්ත්වයේ තිබෙන්නේ. මෙවැනි ක්‍රිඩාංගණ ඉදිකිරිම තුළ මේ ගම් නගර කරලා අපට ජනතාවට පහසුකම් දෙන්න පුළුවන්. අම්බලන්ගොඩ නගරයක් විදියට ලෝකය ඉදිරියට ගෙනියන්න පුළුවන් කම තිබෙනවා. මේ ජාතික මට්ටමේ පහසුකම් ක්‍රිඩකයන්ට නොදී අපි කරන්නේ ඒ අයට කරන අසාධාරණයකි. අද නාවික හමුදාපතිතුමාගේ සිට හමුදාපතිගේ සිට ධර්මාශෝකයෙන් බිහිවෙච්ච දායක වුණා මේ පහසුකම් දෙන්න. මේ ක්‍රිඩාංගණය දායක වුණා. පහසුකම් දෙන්න. එතකොට අනාගත ක්‍රිඩකයන්ට මේ ක්‍රිඩාංගණය ලබා දිය යුතුව තිබෙනවා. පාසැල් 5 බැලුවාත් අත්මාර්ථකාමි විදියට තමයි බලන්නේ. හැම පාසලක්ම බලන්නේ තමන්ගේ ගොඩ ලොකු කර ගන්න තමයි ඉල්ලන්නේ. නමුත් අපි බලන්න ඕන පාසැල් 5ටම ප්‍රයෝජනවත් වෙන විදියට මෙය ලබා දෙන්න. මෙය පාවිච්චි කරන්න. පාලකයින්ගේ වගකිම වෙන්නේ ඒක. මා නම් යෝජනා කරන්නේ අපට නිතිමය බාධාවක්

තිබෙනවා නම් එය 100% අයින් කරන්න බැරි නම් ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ 1 වසර සඳහා ගොඩනැඟිල්ලක් ලබා දුන්නොත් එම ලකුණු 5 අඩු වීමේ එම ප්‍රතිලාභයත් ලැබෙනවා. ඉදිරියට බාධාවක් අයින් වෙනවා. ඒ වගේම අපට පිට්ටනිය රවුම් කිරිම සඳහා සියළු කොටස් අවශ්‍ය වෙන්නේ නැහැ. කොනේ කොටස ප්‍රජාපති විද්‍යාලයට වුණත් දෙන්න පුළුවන් හැකියාව තිබෙනවා. එමනිසා ඔබතුමා කතා කර මේය ඉදිරියට ගෙනියන්න කියන කාරුණික ඉල්ලීම මා කරනවා මහජනතාව වෙනුවෙන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයක් නිසා අපට කතා නොකර බැහැ. මා දැන ගන්න කැමතියි ඔය කියන ධම්මකුසල විද්‍යාලයට ප්‍රජාපතිය සම්බන්ධ කළාම පිරිමි ළමුනුත් ගන්නවාද , ගැහැණු ළමුන් විතර ද ගන්නේ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රජාපති විද්‍යාලය කාන්තා විදුහලක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගැහුණු ළමුන් විතරයි ගන්නේ. එයට පිළිතුරු ලැබුණා. එම පාසැල ආසන්නයේම සිටින අපේ ගරු මන්ත්‍රීතුමා ජගත් කුමාර මහතා ප්‍රකාශ කරනවා අපට ලකුණු 5ක් කැපෙනවා මේම පාසැල නිසා . එතකොට මේ ප්‍රජාපතිය කියන්නේ අම්බලන්ගොඩ ඉදිරි පෙළේ හොඳ පාසැලක්. එතකොට මේ ප්‍රදේශයේ වැසියන් මේ ප්‍රධාන පෙළේ පාසලක් වෙන ප්‍රජාපති විද්‍යාලයේ ප්‍රාථමිකයට මේ දරුවන් යවන්න අකමැති. මොකද ලකුණු 5ක් කැපෙනවා කියන්නේ අනියම් වශයෙන් යවන්න කැමති නැහැ කියන එකනේ. මෙතැන කතා නොවුණ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. නොකියවුණු මේ පොඩි පාසැල් වලට අනිත් ලොකු පාසැල් වලට ලැබෙන පහසුකම් ලැබෙන්නේ නැහැ. අන්න එකයි මේ ප්‍රශ්නය. දැන් අපේ ගෙවල් ළඟ තිබෙන බුද්ධදත්ත විද්‍යාලය බැලුවාම අපි කැමතියි අපේ දරුවා බුද්ධදත්ත විද්‍යාලයට යවන්න. එය අපට ඉදිරියට ගෙනියන්න දෙන්නේ නැහැ. ඒවා නවත්වා තිබෙන්නේ. මා හැමදාමත් මෙය කතා කරනවා. කොච්චර කිවුවත් මේක තමයි ස්වභාවය. මට මතුකරන්න උවමනා වුයේ විදුහලට ආසන්නයේම සිටින ගරු මන්ත්‍රීවරයා කැමති නැහැ . මේ විද්‍යාලය නැවත ආරම්භ කරනවාට. මොකද ලකුණු 5ක් කැපෙනවා. එහෙම වෙන්නේ තමන්ගේ ඒ කුඩා දරුවාට අවශ්‍ය පහසුකම් නොලැබී යාවි කියන සැකය නිසා. මා අන්න ඒ කාරණය මෙතැනදි ඉස්මතු කර පෙන්වනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා ඔය පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලයේත් , ප්‍රජාපති විද්‍යාලයේත් වාර්තා ගෙන්වා ගෙන තිබෙනවා නගර සභාවට. ග්‍රාමසේවා කොට්ඨාශය තුළ ප්‍රජාපතියට ඇතුල් වී තිබුණේ එක් කෙනෙකු පමණයි. බුද්ධ දත්තෙන් එක්කෙනෙක්වත් නැහැ. එක තමයි ඇත්ත තත්ත්වය. ඔය සියල්ලම මේ පෝෂණය වෙලා තිබෙන්නේ මේ අම්බලන්ගොඩ කියන සාධකය උඩ. අම්බලන්ගොඩට ඇවිත් ඉගෙන ගන්න ඕන කියන සාධකය උඩ පිටිතින් පැමිණ දමන අයගෙන්

තමයි ඔය දෙකම පිරි තිබෙන්නේ. අධ්‍යාපනය උදෙසා තිබුණු තැනක් තමයි අම්බලන්ගොඩ කියන්නේ.ඔය තත්ත්වය තිබෙන්නේ. අඩුම ගණනේ ඔබතුමාගේ පුතෙක්වත් ඔය කියන කාගේවත් පුතෙක් වත් නැහැනේ. දැන් මෙතැන සිටින 21 නාගෙන් එක්කෙනායි ආදි ශිෂ්‍යයෙක්වත් සිටින්නේ. ධම්මකුසල විද්‍යාලයේ. මේකට යන්නේ නැහැ. අපි නෙමේ. අපේ තාත්තාලා , අම්මලා , අපේ සියලාවත් කරලා නැහැ ඔය වැඬේ. හැමෝම බලන්නේ ධර්මාශෝකයට දාන්න එක්කෝ දේවානන්ද විද්‍යාලයට දමන්න. ජනප්‍රිය පාසැල් වලට දමන්න තමයි හැමෝම උත්සාහ කරන්නේ. එක දෙමාපියන්ගේ ස්භාවය . අපි දෙමාපියෙක් වූ පසු අපි බලන්නෙත් ඒක තමයි. ඉතිං අපිට කරන්න දෙයක් නැහැ. මෙහි හොඳම යෝජනාව තමයි අපේ ක්‍රීඩාංගණයට යාබද තිබෙන කොටස කඩන් වැටිලා තිබෙන්නේ . අවශ්‍ය නම් සභාවට පුළුවන් එම ගොඩනැඟිල්ල තව ටිකක් එහායින් හදලා දිලා . අපිට යම්කිසි තීරයක් ඉල්ලා ගන්න පුළුවනි. මොකද ප්‍රජාපතියට දෙනවා නම් අපිට විශේෂයෙන්ම ඉල්ලීමක් කරන්න පුළුවන්. අම්බලන්ගොඩ නගර සභාවෙන් තමයි අක්කර 2ක් ලබා දී තිබෙන්නේ ක්‍රීඩාංගණය ඉදිකිරීමට. මුදල් වලට නෙමේ ලබා දුන්නේ . අම්බලන්ගොඩ නගර සභාවෙන් නිකන් ලබා දුන්නේ. දැනට ප්‍රජාපති විද්‍යාලයට ක්‍රීඩාංගණයක් ලබා දුන්නෙත් අම්බලන්ගොඩ නගර සභාවෙන්. දැන් ඔය හා සමානම ඉල්ලීමක් දේවානන්ද විද්‍යාලයෙන් ඉල්ලා තිබෙනවා. අපි ඒ අනුව කටයුතු කරන්න ඕන. එගොල්ලන්ටත් ක්‍රීඩාංගණයක් ලබා දෙන්න ඉඩ දෙන්න ඕන. කුලරත්න විද්‍යාලයට වෙන් කළා කොටසක්. ඒ වගේ වෙන්කර ගන්න ඕන. විද්‍යාල වලට ලබා දෙන්න ඕන. විද්‍යාල පෝෂණය කරන්න ඕන. විද්‍යාලය පෝෂණය වුණාම තමයි අම්බලන්ගොඩ වටිනාකම වැඩි වෙන්නේ. එමනිසා අපි එය කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් මොකක්ද තීරණය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තින්දුව කියන්නේ මෙකයි. ඒ අය දිලා තිබෙන්නේ අධ්‍යාපනවේදීන් වශයෙන් ඒගොල්ලන්ගේ තීන්දුවක්. ඒ තීන්දුවේ දැනට අධිකරණ නියෝගත් එක්ක අපි බැඳිලා ඉන්නවා. එතකොට වෙනසක් කරනවා අපි අධිකරණ සමඟ කතා කළ යුතුයි. හොඳම දේ තමයි අපේ ක්‍රීඩාංගණයට යම් කොටසක් අවශ්‍යයි නම් මේ ක්‍රීඩාංගණය අසළ තිබෙන ගොඩනැඟිල්ලේ වහළ මා දුටුවා කඩා ගෙන වැටිලා තිබෙනවා. සභාවට අවශ්‍ය නම් යම්කිසි කොටසක් එම ගොඩනැඟිල්ල ඉදිකර සභාවට අවශ්‍ය කොටස ඉල්ලා ගන්න. එක තමයි කරන්න ඕන. වෙන දෙයක් නෙමේ. ඉදිරියට එනවිට . උදාහරණයක් විදියට අපි බස්නැවතුම්පොළ හදන විට අපි දුම්රිය දෙපාර්තමේන්තුව සතු නිල නිවාස දෙකක්. එම නිල නිවාස දෙකට නිල නිවාස දෙකක් අපි ඉදිකර දුන්නා. ඉතිං ඒ විදියට මොකක්හරි හුවමාරුවක් කර ගත යුතුය. නැතිනම් ප්‍රජාපතියට දෙනවා නම් හුඟක් හොඳයි. මීට ඉස්සර වෙලා. ප්‍රජාපතියට අපි කිසි දෙයක් ලබා නොගෙන නිකම්ම ලබා දි තිබෙනවා. අද ප්‍රජාපතියේ ක්‍රීඩාංගණය කියන්නේ නගර සභාවේ තිබෙන ක්‍රීඩාංගණයයි. අක්කර 7ට ඉතිරිකරන ලද ක්‍රීඩාංගණය තමයි අපි දිලා තිබෙන්නේ. මෙය අපේ හිටපු ගරු අමාත්‍ය රිචඩ් පතිරන මහතාගේ ඉල්ලීම පරිදි අපි ලබා දුන්නා. මොකද කාන්තා විදුහලක්. එම විදුහලට වෙනම

ක්‍රීඩාංගණයක් තිබිය යුතුයි කියා එදා හිටපු ගරු සභාපතිවරයා හා ගරු මන්ත්‍රීවරුන්ගේ තීරණය මත එම ක්‍රීඩාංගණය ලබා දුන්නා. ඒ දිනවලම අපි කුලරත්න විද්‍යාලයට අක්කර 8ත් වෙන් කළා. දැනුත් එම වෙන්කරන කොටස තිබෙනවා. කුලරත්න විද්‍යාලය විශාල වීමේදී එම අක්කර ගණන යොදාගෙන ක්‍රීඩාංගණය හා අනෙකුත් පාසැලේ අවශ්‍ය සියළුම දේවල් ඉදිකිරීමට අවස්ථාව තිබෙනවා. ඉතිං දේවානන්ද විද්‍යාලයටත් අපිට ලබා දෙන්න පුළුවන් . ඒ විදියට. ඒ කියන කාරණා අපට කරන්න පුළුවන්. මේකේ තීන්දුවක් නැහැ. මේක දැනුම් දීමක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

නැහැ. එක තමයි . ඔබතුමා දැන් තීරණය කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක කරනවා නම් කළ යුත්තේ එක දෙයයි. ක්‍රීඩාංගණය පළල් කිරීමට අවශ්‍ය වන බිම් තීරය සඳහා නගර සභාවෙන් ගොඩනැගිල්ලක් ඉදි කරලා එම භූමිය ලබා දෙන්න.එතකොට අපි පාසැලේ කිසිම අඩුපාඩුවක් කරන්නේ නැහැ. අපි අළුතින් හදා දෙනවා ගොඩනැඟිල්ලක්. අපට අවශ්‍ය බිම්තීරුව අපි ලබා ගන්නවා. මුලින් එය අවශ්‍යයි කිවුවට හරියන්නේ නැහැ. එය මිනුම්දොරු සැලැස්මක් සමඟ බලන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

එහි පිටපතක් ඔනේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමියට එහි පිටපතක් ලබා දෙන්න.

**03.08 පරිසර සංරක්ෂණයට අදාලව නාම පුවරු ස්ථාපිත කිරීම යන මැයෙන් අංක 86 පොල්වත්ත වසමේ සංවර්ධන නිලධාරී ඩබ්.එච්.කේ.ගනීර මහතා විසින් එවූ ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පරිසර සංරක්ෂණයට අදාලව නාම පුවරු ස්ථාපිත කිරීම . 86ඒ පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ පුංචි පාලම අසළ සිට තල්ගස්ගොඩ පුංචි පාලම දක්වා අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම වැලැක්වීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම සම්බන්ධව එම මාර්ගය දෙපස නාමපුවරු සවිකිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටි. පොල්වත්ත ප්‍රදේශයේ සංවර්ධන නිලධාරි ගනීර මහතා විසින් ඉල්ලීමක් කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එය ලබා දෙන්න.

තීරණය

**03.09 2020.02.18 හා 19 යන දෙදින අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ භූමිය පිරිසිදු කිරීම සඳහා තණකොළ කපන යන්ත්‍ර දෙක එහි ක්‍රියාකරවන්නන් සමග ලබාදෙන ලෙස ඉල්ලා අම්බලන්ගොඩ පොලිස් ස්ථානාධිපතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ලොඩ පොලිස් ස්ථානාධිපතිතුමා විසින් තණකොළ කපන යන්ත්‍රයක් ඉල්ලා තිබෙනවා. අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ භූමිය පිරිසිදු කරන බැවින් ඔබතුමාගේ ආයතනයේ තණකොළ කපන යන්ත්‍රය ක්‍රියාකරු සමඟ 2020.02.18 හා 19 දින වල ලබාදෙන ලෙස ඉල්ලා සිටී. පෙර අවස්ථාවේදි ලබාදුන් සහායෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. එය සභා අනුමැතියට යටත්ව ලබා දී තිබෙනවා. තෙල් ලබා දීමේ පදනම මත ලබා දි තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

**03.10 2020 මාර්තු 01 දින සිට අප්‍රේල් මස 13 දින දක්වා තාවකාලික අවරණයක් (ටෙන්ට් එකක්) ආර්.පී.ආතර් ද සිල්වා මාවත ඔස්සේ ඉදිකිරීමට අවසර ඉල්ලා අම්බලන්ගොඩ, ගාලු පාර, අංක 11 –G ලිපිනයේ පදිංචි ලලිත් හැලඹගේ මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ලලිත් හැලඹගේ මහතා, 2020 මාර්තු 01 දින සිට අප්‍රේල් මස 13 දින දක්වා තාවකාලික අවරණයක් (ටෙන්ට් එකක්) ආර්.පී.ආතර් ද සිල්වා මාවත ඔස්සේ ඉදිකිරීමට අවසර ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමා, එය ලබා දෙන්න. ඒ වගේම දැන් අවුරුදු කාලයට කෘෂි කර්ම සංගම්වල මල් වවන අය , ඒ අයටත් ගාලු පාර දිගට හාට් ටිකක් ගසා ලබා දෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒක නම් සුදුසු නැහැ. ගාලු පාර සුදුසු නැහැ. අපි ඕන නම් හිරේවත්ත පාලම දෙපැත්ත ඒ හරියේ කරන්න.එහෙම නැතිව අතන කරන්න එපා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඒ හරියේ දැන් කඩ වගයක් ගසා තිබෙනවා. ඒ හිරේවත්ත ඒ තීරුවේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒවා අයින් කරන්න.

තීරණය

**03.11 කාර්යාලයේ දෛනික වැටුප් ලබන සේවක මහත්ම මහත්මීන්ගේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් පරිවර්ථන සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කාර්යාලයේ දෛනික වැටුප් ලබන සේවක මහත්ම මහත්මීන්ගේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් පරිවර්ථන වැඩිවීම සම්බන්ධවයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එය ලබා දෙන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එම වැටුප් වැඩි වන විට දෛනිකව වැඩ කරන සේවකයන්ගේ අතිකාල දීමනා දෙන්නේ නැහැ කියා කියනවා. ඒවා ගෙවන්න ඕනනේ. දෛනික සේවකයන් කියා අපිට බලකිරීමක් කරන්න බැහැනේ. ඒ අය වැඩ කරනවා නම් ඒ අයට ගෙවන්න ඕනේ. ගරු සභාපතිතුමනි ඉල්ලීමක් කරනවා. මේ අයට අතිකාල දීමනා ගෙවීමට කටයුතු කරන්න කියා.

තීරණය

සභාව කල්තබන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කරනවා. කාපට් කිරීම සඳහා අපට කිලෝමීටර් 15ක් ගරු සභාවට ලැබී තිබෙනවා. එම 15ම කැඳවුම්කරු වශයෙන් මට ලැබුණා. එය මා නගරයේ හැම තැනම විසිරෙන්න දමා තිබෙනවා. මහ අම්බලන්ගොඩ පාර , කළුවඩුමුල්ල පාර හැම පාරම දමා තිබෙනවා. සංඝරාජ පාර දමා තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි පොල්වත්ත පරණ පාර දැම්මාද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැම්මා. මෝදර දේවාල පාර දැම්මා. තල්ගස්ගොඩ පාරත් දැම්මා.

**03.12 ගා/ශ්‍රී බුද්ධදත්ත ආදර්ශ විද්‍යාලයේ පැවැත්වෙන නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය සඳහා ගාස්තු රහිතව කොඩි කණු ඉල්ලා විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගා/ශ්‍රී බුද්ධදත්ත ආදර්ශ විද්‍යාලයේන් ඉල්ලීමක් කරනවා. නිවාසාන්තර මළල ක්‍රීඩා උත්සවය සඳහා ගාස්තු රහිතව කොඩි කණු ඉල්ලා තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩි කාරණයක් තිබෙනවා කියන්න. නිවාසාන්තර මළල ක්‍රිඩා උත්සවය අවසන්. එහි බඩු අස්කරද්දි පොඩි ළමයින් එකතු වෙලා තමයි එම නිවාස වල බඩු අස්කරනු ලැබුවේ. එහි ඒ වේලාවේ පාපන්දු ක්‍රිඩාව පටන් ගත්තා. එතකොට ඒ ළමයෙකුට එම බෝලය වැදුනා.එහිදි විදුහල්පතිතුමා සමඟ කතා කළාම එතනදි ඒ අය කතා කළ විදිය එච්චරම සුදුසු නැහැ. පසුව විදුහල්පතිවරයා මට පැමිණ කිවුවා මා කතා කළාම විදුහල්පතිවරයා විදියට මට මේ අය කතා කළේ මෙහෙමයි කියා. එහෙම නම් ක්‍රිඩා භූමිය වෙන්කරනවා නම් යම්කිසි දිනයක එදින සවස පාපන්දු හෝ වෙනත් ක්‍රිඩා කරන්න බැරි වෙන්න ඕනේ. මට වුණත් ඒ වේලාවේ ගිහින් එතනදි ඒ අය හසුරුවන්න .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි, ගරු මන්ත්‍රිතුමා එයට මැදිහත්වෙන්න තිබුණා. ක්‍රිඩාභූමි භාරකරු ඔතන සිටින සවස 5ට වැඩ අවසන් කර යනවා. විදුලි ආලෝකය දමන කෙනා විතරයි ඊට පසු ඔතන සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඒ වේලාවට විදුලිය විසන්ධි කර තියන්න ඕනේ සෙල්ලම් කරන්න බැරි වෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැ ඉතිං එකත් හරි නැහැනේ. ගමේ ළමයින් ටික ඔබතුමා කතා කර එය බේර ගන්න තිබුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ළමයින් කියන්නේ . එතන කතා කරන්න පුළුවන් මට්ටම් පිරිසක් නෙමේ සෙල්ලම් කරන්නේ. පනාපිටිය ඒ වගේ ඈත ප්‍රදේශවලින් පැමිණ තමයි සෙල්ලම් කරන්නේ. ගමේ ළමයින් නෙමේ සෙල්ලම් කරන්නේ. පිටත ප්‍රදේශවලින් තමයි සෙල්ලම් කරන්නේ. මැර බලය තිබෙන්න ඕන එහෙමනම් එහෙමයි කියා පාවිච්චි කරන්න. මට එහෙම හැකියාවක් නැහැ. අපි සිල් අරගෙන ඉන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ ගරු නගර සභා මන්ත්‍රී රාජපක්ෂ මහතා මොකද කියන්නේ මේ ගැන. ගමේ ඔබතුමා එතැන වාඩිවෙලා ඉන්නවා . මා දැක තිබෙනවා. ඕක බැලුවේ නැද්ද? මේ වගේ තත්ත්ව විටින් විට ක්‍රීඩාංගණ වල ඇති වෙනවා. මානානෙත් දැන් ඇතිවෙලා තිබෙනවා ඔය වගේ තත්ත්වයක්. ඉතිං එමනිසා ඒ වගේ තිබෙනවා. අපි ඉදිරියට බලන්නම්. කවුරු වුණත් විදුහල්පතිවරයෙකුට ගරු කරන්න ඕනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, බුද්ධදත්ත විද්‍යාලයට එදින භාර දුන්නා නම් එදින සම්පූර්ණ අයිතිය තිබෙන්නේ බුද්ධදත්ත විද්‍යාලයට. කිසිම ක්‍රීඩාවක් කරන්න අයිතියක් නැහැ වෙන කෙනෙකුට. මා එය හෙලා දකිනවා. පාපන්දු ක්‍රීඩා කරපු අය පිළිබඳව. එදින බුද්ධදත්ත විද්‍යාලයට අයිති ක්‍රීඩාංගණය වෙනත් කෙනෙකුට අයිතියක් නැහැ කියා මා ප්‍රකාශ කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා, දැන් මෙහි අපි වෙන්කිරිම කරන්නේ සවස 6වෙනතුරු පමණයි. ඔය දැන් 6.30 ,7.00 විතර වෙච්ච දෙයක් ඔය.රාත්‍රී 8.00 විතර සිදු වු දෙයක් ඔය.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

දැන් නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් තිබෙන කොට සවස 6.30 පසුවෙලා තමයි එය අවසන් වෙන්නේ. තෑගි එහෙම ලබා දි අවසන් වෙනවිට 7.30 විතර වෙනවා. එදාට ඒ කට්ටිය දැන ගන්න ඕනේ එය නොකර ඉන්න. පොඩි ළමයින් නෙමේනේ. ඒ අයත් එම පාසලට ගිය කට්ටියනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඔය ක්‍රීඩා පිටි ගැන කතා කරද්දි මටත් දෙයක් තිබෙනවා කියන්න. මානාන ක්‍රීඩා පිටියේ ලොකු ගැටළුවක් ඇතිවුණා. ඒ වුණාට මෙය ප්‍රකාශ කරන්න ඕනේ. ක්‍රීඩා කමිටුවේ යෝජනා කරලා

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එය ක්‍රීඩා කමිටු වාර්තාව යටතේ කතා කරන්න.

තීරණය

**03.13 2019 දෙසැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019 දෙසැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව.මාසය තුළ ප්‍රතිකාර කරනු ලැබූ රෝගීන් සංඛ්‍යාව 366, මාසය තුළ බෙහෙත් ශාලාව විවෘතව තැබූ දින ගණන 17, මාසයට වැයවූ ඖෂධවල වටිනාකම රු.36696.44, එක් රෝගියෙකු සඳහා රු.100.26 ක් වැය කර තිබෙනවා.

තීරණය-

2019 දෙසැම්බර් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදි.

**03.14 2020 වර්ෂය සඳහා පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය රාත්‍රී වෙන්කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2020 වර්ෂය සඳහා පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණය රාත්‍රි වෙන් කිරිම පිළිබඳව අයකරන ගාස්තු පිළිබඳවයි. ඉහත වර්ෂය සඳහා පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණය රාත්‍රි වෙන්කිරිමේ ගාස්තු පිළිබඳ කිසිම සටහනක් නොමැති විම හේතුවෙන් සභාපතිතුමාගේ උපදෙස් පරිදි පහත සඳහන් ලෙස ගාස්තු ගෙවිම සුදුසු බවට යෝජනා කරයි.

- විදුලිය සඳහා ( ප.ව.6.00 - රාත්‍රි 10.00 දක්වා ) රු.6000/=
- ඇප තැන්පතුව රු.5000/=
- රාත්‍රි 10.00 ට පසුව වැඩිවන සෑම පැයක් සඳහාම රු.3000/= ක මුදලක් අය කිරිමට යොජනා කරයි.

මෙය 2020 වර්ෂය සඳහාම බල පැවැත්විම සඳහාම සභාව වෙත යොමු කර සභා අනුමැතියක් ලබා ගැනිම සුදුසු බවට යෝජනා කරයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

එය අයකිරිම හොඳයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

එම මුදල අයකිරිම හොඳයි.

**තීරණය**

**03.15 2020 කෘෂි නායකත්ව ප්‍රදර්ශනය සඳහා අම්බලන්ගොඩ, ස්ථානභාර කෘෂිකර්ම උපදේශක එම්.එච්.එම්.ප්‍රියාශනී මහත්මිය විසින් කොඩි කණු 10 ක් හා බැනරයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමැතියට යටත්ව එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ , ස්ථානභාර කෘෂිකර්ම උපදේශක. කෘෂි කර්ම ව්‍යාපෘතිය 2020. දකුණු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුග්‍රහය යටතේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලය (බටහිර ) මඟින් පවත්වාගෙන යන විකසිත කෘෂි ව්‍යවසායකත්ව සමිතිය මඟින් සංවිධානය කරනු ලබන ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය පෙබරවාරි මස 26 හා 27 දෙදින සමුපකාර රථගලේ දි පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඉහත ප්‍රදර්ශනය වෙනුවෙන් සකස් කරන ලද බැනරය අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉදිරිපිට පරිශ්‍රයේ නොමිළේ ප්‍රදර්ශනය කිරිමට අවසර ලබා දෙන මෙන් ඉල්ලා. තවද ප්‍රදර්ශනය වෙනුවෙන් පෙබරවාරි 25,26,27 දින සඳහා නොමිලේ ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

**03.16 වැසි ජලය අපවහන වැඩි දියුණු කිරීමේ පද්ධතිය (SWDI)ව්‍යාපෘතිය සඳහා ලබාගෙන ඇති ණය මුදල සම්බන්ධයෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල සමග පැවති සාකච්ඡා වූ කරුණු සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

වැසි ජල අපවහන වැඩි දියුණු කිරිමේපද්ධතියේ යටතේ දේශිය ණය හා සංවර්ධන අරමුදල යටතේ පැවති සාකච්ඡාව සම්බන්ධයෙනි. ගරු මන්ත්‍රිවරුන්ට මා කියන්න ඕන. අම්බලන්ගොඩ නගර සභාව වැසි ජලය බැස යාමේ ව්‍යාපෘතිය යටතේ ලක්ෂ 600ක මුදලක ණයක් ලබාගෙන තිබෙනවා. මෙය තවම එක දවසක්වත් ගෙවා නැහැ. කිසිම සභාවක් එදිනවල ගෙවිම ප්‍රතික්ෂේප කර තිබෙනවා. එමනිසා නගර සභාව ණය ගැනීමේ ගැටළුවක සිටිනවා. මේ ණය ගෙවීමේදි 80%ක් 20%ක් ගෙවන්න තිබෙනවා. ඒ අනුව ලක්ෂ 600න් ලක්ෂ 120ක් තමයි අපට ගෙවන්න තිබෙන්නේ. මේ සම්බන්ධව කරුණු දක්වන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

යම්කිසි හේතුවක් මතනේ ඒ කාලයේ සිටි සභා ගෙවීම ප්‍රතික්ෂේප කර තිබෙන්නේ. මොකක්හරි හේතුවක් කියා. දැන් අපි එය ගෙවන්න කියා තීරණය කරනවා නම් එයට විරුද්ධවනේ මේ තීරණය ගන්න වෙන්නේ. ඒ අය කියපු නෙමේනේ එය වෙනස් කරලා මේ තීරණය ගන්න වෙන්නේ. මෙහිදි අපට හානියක් වෙයි කියන ප්‍රශ්නය තිබෙන්නේ. මේ හේතුව සම්පූර්ණයෙන්ම අත්හැර දමා තමයි අපට ගෙවන්න වෙන්නේ. අපි ණය ගෙවන එක නතර කර තිබෙන්නේ විශේෂ හේතුවක් හින්දානේ. ගෙවන්න බැහැ කියා නැහැ. මෙය සම්පූර්ණ වුවහොත් අපි ගෙවනවා කියා තිබෙනවා. දැන් එය සම්පූර්ණ නොවි අපි ගෙවන්න තීරණයක් ගන්න විට සභාව ගන්න තීරණය වෙනස් වෙලා ඕනේ අපි ගෙවන්න වෙන්නේ. එහිදි අපට ගැටළුවක් එනවාද කියන එකයි මා අසන්නේ. ඒ අය කියනවා මෙය දුන්නොතින් අපි ගෙවනවා. හැබැයි දැන් අපි තීරණය කරන්න යන්නේ එක නැතිව ගෙවන්න .

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් ඒ අයගේ තාක්ෂණසේවා නිලධාරි කෙනෙක් නැහැ කියන එක නම් දැන් තාක්ෂණසේවා නිලධාරියෙක් නැතිව ඇති. දැන් ඒ දිනවල ඕක ටෙන්ඩර් කරනු ලැබුවෙත් එම ආයතනයෙන්. වැඩ බැලුවේත් එම ආයතනයෙන්.ගෙවීම් කරනු ලැබුවේත් එම ආයතනයේ. එතකොට ඒ අය දන්නවා හොඳකාරව දන්නවා වැඩ කෙරී ඇති ආකාරය. නිකන් ගෙවන්නේ නැහැනේ කොන්ත්‍රාත්කරුවෙකුට. කවුරුහරි තාක්ෂණසේවා නිලධාරියෙකු හරි තමයි නිර්දේශ කර තිබෙන්නේ. දැන් ඒ ගොල්ලන් කියන්නේ අපිට මිලියන ගණනක් ගෙවන්න කියා. එක විතරක් ගෙවන්න. හැබැයි මිලියන 12 අපි ගෙවන්න ඕනේ ලක්ෂ 600ක වැඩ කෙරිලානම් විතරයි. හදිස්සියේ ලක්ෂ 400 වැඩ කරලා තිබුණොත් එහෙම අපි ගෙවන්න ඕනේ ලක්ෂ 80ක් විතර. එතකොට ඒ අය කියනවා නම් අපේ තාක්ෂණසේවා නිලධාරි ලවා පරික්ෂා කරන්න කියා. මෙන්න මෙච්චර මුදලක වැඩ කරන්න කියා. මෙහි තිබෙනවාද වැඩ විස්තරයක් එක. ඒවා නැතිව ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාණෙනි පරික්ෂා කරන්න බැහැ. අපට ඒ දිනවල කරන ලද වැඩ විස්තරයක් නැතිනම් අපේ නිලධාරින් කොහොමද පරික්ෂා කරන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ ව්‍යාපෘතියේ ගිවිසුම අත්සන් කළේ මා.ගිවිසුම අත්සන් කළේ මා වුණාට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේ හිටපු ගරු සභාපති ජී.එම්.එස්. සිල්වා මහතා. ඒ කාලයේ අපි ලක්ෂ 600ක ගිවිසුමක් අත්සන් කළා. අම්බලන්ගොඩ වැසි ජලය බැස යාමේ ව්‍යාපෘතිය යටතේ එම ව්‍යාපෘතියට 80% ග්‍රාන්ට් එකක්. 20% ක තමයි ණය මුදල ගෙවන්න වෙන්නේ. ඇත්තටම සර්ව සාධාරණ ණය මුදලකට අපි අත්සන් කළේ. එය අත්සන් කර මේ කටයුත්ත කරනු ලැබුවේ හිටපු ගරු සභාපති ජී.එම්.එස්. සිල්වා මහතාගේ කාලයේ.2002,2006 ඒ කාලය ඇතුළත වැඩේ කරන කොට මේ සභාව තුළ මේ වැඩ කරන ක්‍රමය තුළ පැහැදිලිතාවයක් තිබුණේ නැහැ මේ සභාවේ සියළු මන්ත්‍රීවරුන්ට. ඒ ගරු මන්ත්‍රීවරුන් ඉල්ලා සිටියා මෙය අපිට වැඩ විස්තරයක් සහිතව ගෙන්වා ගන්න කියා. එම ව්‍යාපෘතිය කරනු ලැබුවේ නාගරික සංවර්ධන අධිකාරියේ Sector Project කියා අලුත්ම Project එකකින්. දැන් එම Sector Project කියන එක නාගරික සංවර්ධන අධිකාරිය තුළත් නැහැ. දැන් එය කරපු මිනිසුනුත් ලංකාවේ නැහැ කියන මට්ටමේ තිබෙන්නේ. මෙහි ලොකුම දූෂණයක් සිද්ධ වුණා කියන එදා හිටිය සභාවත් , දැනට එල්.එන්.ඩී.එෆ් එකත් පිළිගන්නවා මේගොල්ලන් ලංකාවේම ලොකු දූෂණයක් ඇති කළා කියා මේ මුදල් වල. මේ වගකිම ඉටු කරන්න වෙලා තිබෙන්නේ අපට . දැනට ඒ අය Sector Project වහලා ඉවර වෙලා මේ ණය මුදල අයකිරීම පවරා තිබෙනවා දේශීය ණය සංවර්ධන අරමුදලට. මේ ණය අරමුදල තමයි සභාවලට යම්කිසි ණයක් දෙනවා ණය ලබා දිමේ සහතිකය සහ ණය ලබා දීමේ සම්පූර්ණ කටයුත්ත කරනු ලබන්නේ. දැනට එම නිලධාරින් අපට කතා කර කියන එකක් තමයි මිලියන 60ක වැඩක් කරන කොට ඔගොල්ලන්ට ගෙවන්න තිබෙන්නේ මිලියන 12. අඩුම ගානේ මේ මිලියන 12 ගෙවන්න. අපි ඔගොල්ලන්ට වෙන ණය මුදලකට යාමේ අවස්ථාව ලබා දෙන්නම් කියා. එතකොට අපි ණය නොගෙවීම පිළිබඳව ලේඛණ ගත වෙලා තිබෙනවා එයිනුත් අපි අයින් වෙනවා. අපට වෙනත් ණය මුදලක් මේ ගෙවීම වෙනුවෙන්ම ලබා දෙනවා. අපට එක්කෝ නගර සභාවට හරි පොදු වෙළෙඳපොළ ඉදිකිරිමට හරි යොදා ගන්න පුළුවන්. මා දකින විදියට ලක්ෂ 600 ක වැඩක් සිද්ධ නොවුණත් ලක්ෂ 120 ක වැඩකි. දැනට පොරෝක් ඇළේ පැති බැමි බැන්දේ

ඔය මුදලින් , ඕකන්දේ සිට පහළට වෙනකම් කාණුව බැන්දා එතැන. කන්දගොඩ මායිමේ සිට. ඊට පසු නාමල් ඇළේ බෞද්ධ මධ්‍යස්ථානයේ කොනේ සිට හේප්පුමුල්ල කොන දක්වා කාණුව බැන්දේ එයින්. එතකොට පොරෝක් ඇණ වටේ තිබෙන කාණුව බැන්දේ ඔය ව්‍යාපෘතියෙන්. තව පොඩි පොඩි කාණු කොටස් වගයක් හැදුවා. ඇත්තටම මටත් පෙනෙනවා මෙතැන ලක්ෂ 600ක වැඩ කොටසක් සිද්ධ වෙලා නැහැ කියා. නමුත් මිලියන 120ක මුදලකට සරිලන වැඩ කොටසක් කෙරි තිබෙනවා. එතකොට ගණන් ටිකේ යම්කිසි අඩුවක් වෙනවා අපට. එතකොට මෙහි මිලියන 12ට අපට පොළී වෙලා තිබෙනවා මිලියන 10කුත්.එතකොට අපි මිලියන 22ක් ගෙවන්න ඕන. එතකොට දේශිය ණය සංවර්ධන අරමුදල ඉල්ලා සිටිනවා අපට මිලියන 12ක් ගෙවන්න. අපි මිලියන 10ක් කපා ඉවත්කර දමන්නම්. කිසිම පොළියක් නැතිව. ඊට පසුව අපට එම වගකිමෙන් මිදෙන්න පුළුවන් කියා. සභාවෙන් මෙය අහලා ලබා දෙන්නම්.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා කියන එක හරි. අපි දැන් ඒ වගේ තීන්දුවක් ගෙන තිබෙනවා නම් පරික්ෂා කර බලා ඉදිරිපත් කරන්න කියා කොහෙත්ම කරන්න බැහැ ගරු මන්ත්‍රීවරුන්ට. මොකද පියවපු එක්කක් මොනවත් නැතිනම් කොහොත්ම කරන්න බැහැනේ. මොකද අපේ තාක්ෂණික නිලධාරින්ටත් මුකුත් කරන්න බැහැ. හැබැයි මිලියන 12ක වැඩ කෙරි තිබෙනවා. එය පිළිගන්න පුළුවන්. අපට අර ණය සහන මුදල තමයි අඩු වෙන්නේ. එමනිසා අපි තීරණයක් අරගෙන මෙය ගෙව්වා නම් කොටස් වශයෙන් ගෙවන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මා යෝජනා කළා. අපට ගෙවිය යුතු මුදල ලක්ෂ 300ක් විතර තිබෙනවා. අපට ලබා දෙනවා නම් එකවිටම මෙම මුදල ගෙවන්නම් කියා. මේ දේශිය ණය සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටිනවා ප්‍රධාන ලේකම්තුමා. එතකොට ප්‍රධාන ලේකම්තමා මේ මුදල් ටික එවන්න අතනින් ගෙවන්න ලබා දෙනවා ද කියන එක තීරණය කරන්නේ. ඒ ටික දිලා අපේ තව ණය මුදලක් කැරකෙනවා ලක්ෂ 500ක. අපි අතන ලිස්ට් විම නිසා දැනට හික්කඩුව තෝරාගෙන තිබෙනවා. අපෙන් බැහැර කරලා. එය සාධණිය මට්ටමට යනවා නම් අපි මේක ගෙවා තිබෙන්න ඕන.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, නිත්‍යානුකුලව මා හිතන්නේ නැහැ සභාවට පාඩුවක් වෙලා ඇති කියා. මේ ලක්ෂ 120 ගෙව්වාට. ලක්ෂ 120 වැඩියේ වැඩ කෙරි තිබෙනවා. ලක්ෂ 120ට වැඩියේ වැඩ කෙරි තිබෙනවා. මා හිතන්නේ නැහැ සභාවට පාඩුවක් වෙයි කියා. අපි මේ ණය බරින් නිදහස් විය යුතුයි. සහනයක් ගන්න බැරි නම් තීරණයක් ගන්න මෙය සභාවෙන් ගෙවිමට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දේශිය ණය හා සංවර්ධන ආයතනය මඟින් තමයි සියළුම නගර සභා සහ අනෙකුත් පළාත් පාලන ආයතන සඳහා පහසු ගෙවීමේ පදනම මත මෙවැනි ණය මුදල් ලබා දෙන්නේ.මා ඔය දේශිය ණය මුදලේ අධ්‍යක්ෂකතුමා මුණ ගැසි සාකච්ඡා කළා මිට මාස 10කට

කලින්. ඊටත් වැඩියි. අවුරුද්දකට කිට්ටුව විතර. ඒගොල්ලන් කිවුව ඒ අය තැන්පත් කර තිබෙනවා පුත්තලමේ නගර සභාවට හෝටල් ව්‍යාපෘතියක් කර තිබෙනවා. ඒ අය මුලින්ම දුන්නේ මිලියන 200ක් කිවුවා. පස්සේ වැඩි කරලා තිබෙනවා මිලියන 600 දක්වා. දැන් එගොල්ලන් තව කැමතියි එයට මුදල් දෙන්න. මොකද ණය මුදල හරියට ගෙවනවා. හොඳ ආදායමක් තිබෙනවා සභාවට. මොනම හේතුවක් නිසා වත් අපි සියළු දෙනා දන්නවා නම් අපට ලක්ෂ 600ක් වුණත් අපට ගෙවන්න තිබෙන්නේ ලක්ෂ 12නම් මිලියන 10ක් කපා හරින්නත් එකඟ වුණා නම් . අනිත් එක තමයි අපිට මෙකෙන් තමයි මුදල් ලැබෙන්නේ. දැන් අපේ පොදු වෙළඳපොළ ගොඩනැඟිල්ල සාදා ගැනීමට. එහෙම නැතිනම් අපට පිටුපසින් අපේ නගර සභා ගොඩනැඟිල්ල සාදා ගැනිමට. අපි ණය මුදලක් පුද්ගලික බැංකු වලින් ගන්න බැහැනේ. අපට මෙතැන තමයි දෙන්නේ යම් සහන මුදලකට තමයි මේවා ප්‍රධානය කරන්නේ. අපේ සංවර්ධන කටයුතු සඳහා. එමනිසා මා හිතනවා කවුරුවත් විරුද්ධ වෙන එකක් නැහැ. මොකද දැන් ඔබතුමා කිවූ පරිදි අපට ලැබෙන්න තිබෙන ලක්ෂ 500ක මුදලක් හික්කඩුවට යනවා. හේතුව ණය නොගෙවන ලේඛණයේ සිටින විට දෙන්නේ නැහැ.ගත්ත මුදල නොගෙවා සිටින විට කාටවත් දෙන්නේ නැහැ. එය සාමාන්‍ය පිළිවෙත. අපි පුද්ගලිකව ගනුදෙනුවක් කළත් ආයතනයක් සමඟ ගනුදෙනුවක් කළත් ඕක බලපානවා. අපි බලන්න ඕන නගරයේ සංවර්ධනය. නගරයේ දියුණුව. ඒම නිසා මේ මිලියන 12කට හිරවෙලා අපි නගරයේ දියුණුව ආපස්සට ගෙනියනවාද නැතිනම් මෙය ගෙවා දමා අපේ ගරු සභාපතිතුමා කියන පරිදි අපේ නගර සභා ගොඩනැඟිල්ල අවශ්‍යයි. අපේ සුනාමියට හසුවී විනාශ වී තිබෙන පොදු වෙළඳපොළ සාදා ගන්න ඕන. එමනිසා මා හිතන්නේ අපේ ධම්මික මහතා කිවූ පරිදි අපේ නිත්‍යානුකුල ප්‍රශ්නයක් පැන නැගෙනවා. මොකද අපට ගෙවන්න තිබෙන්නේ මිලියන 12කි. පැහැදිලිව අපි 12ට වඩා වැඩ කරලා තිබෙනවා. අපි 60ක් ගෙන තිබෙනවා. අපිට 12ක් ගෙවන්න තිබෙන්නේ. ඉතිං එම 12ට වඩා වැඩ කර තිබෙනවා. මොකද අපේ නගරයේ ඉදිරි සංවර්ධන වැඩ කටයුතු ටික කරන්න නම් අපි මේ මුදල ගෙවා තිබිය යුතුමයි.එමනිසා මා හිතනවා මේ මිලියන 12ට සහනයක් විදියට පොළියත් අහිමි කර තිබෙනවා නම් මේ ණය මුදල ලබා ගැනීමට ඔබතුමා උත්සාහ කර අපේ මේ නගර සභා ගොඩනැඟිල්ලත් , තානායමත් හදා ගන්න ඉදිරියට ණය මුදල් දෙකක් හරි ගන්න. මෙය ගෙවන්න . මා හිතන්නේ නැහැ කවුරුවත් විරුද්ධ වෙන එකක් නැහැ කියා. අපි හැමෝම කැමතියි අපේ නගරය දියුණු වෙනවා දකින්න. අපට සභාවේ තිබෙන අඩුපාඩු ටික හැදෙනවා දකින්න. අපිට අඩුම ගණනේ සභාවක් විදියට සිටිනවා දකින්න. මේ පුස්තකාල ගොඩනැඟිල්ලෙන් එළියට යන්න. ඔබතුමාට නගාරාධිපතිවරයෙක් වශයෙන් හරියට කාමරයක් තිබෙනවා දකින්න. මේ සියළු දේවල් වලට අපි හැමෝම එකඟයි.එම නිසා එය කිසි ගැටළුවක් නැහැ. මා හිතන්නේ මේ මුදල් ටික ගෙවා අපි අලුත් ණය මුදලක් ඉල්ලා අපේ සභා ගොඩනැඟිල්ලත් , පොදු වෙළඳපොළත් සාදා ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙතැන මිලියන 60ක කතාවක් කතා වෙනවා. ඉන් මිලියන 12 පාවිච්චි කර තිබෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මිලියන 60ක වැඩක් කර තිබෙනවා. මිලියන 12ක් පමණයි ගෙවන්නේ. ඉන්48ක් අපට ප්‍රදාන කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මෙතැන වංචාවක් සිදුවෙලා තිබෙනවා කියා කතා වුණා. ඒ කරපු කට්ටිය රටේත් නැහැ කියා. එතකොට අපි තීන්දුවක් දෙනවා හා කමක් නැහැ ගෙවන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා, නැහැ මෙකයි සිදු වෙලා තිබෙන්නේ. මේ ව්‍යාපෘතියට අපි ගිවිසුම් අත්සන් කළා. නගර සභාව අත්සන් කළා නාගරික සංවර්ධන අධිකාරිය අපට මේ ණය මුදල ලබා දෙනවා කියා.නාගරික සංවර්ධන අධිකාරියෙන් වෙනම ව්‍යාපෘතියක් යොදවා තමයි මේය සිදු කරනු ලැබුවේ Sector Project කියා. නාගරික සංවර්ධන අධිකාරියේ Sector Project එකෙන් කරන කොට මේ Sector Project එකේ සම්පූර්ණ වැඩ කොටස් ටික අවසන්. මෙය ඒ,ඩී, බී. ණය මුදලක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මේ වැඩ කොටස් කිරිම ගැන ලියකියවිලි මුකුත් නැහැ අපි ළඟ. අපි හිතන්න මෙහි බැමි දැම්මා කියා කටින් කියනවා. එහි ලිඛිත සටහනක් අපි ළඟ නැහැ. ඔප්පු කරන්න සාක්කියක් නැහැ අපි මෙච්චර වැඩ කොටසක් කළා කියා. එහෙම විගණන විමසුමකට ගියොත් අපි මේ ගරු මන්ත්‍රීවරුන්ට සිද්ධ වෙනවා මිලියන ගණන අපට ගෙවන්න සිද්ධ වෙනවා. නැතිනම් හිරේ විලංගුවේ ලගින්න වෙනවා. ඒ හින්දා මේ ගරු මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව නීතිමය ගැටළුවක් නොවේනවානම් අපි කැමතියි . එහෙම නැතිනම් අපි මෙකට විරුද්ධයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ වැසිජල අපහරණ ව්‍යාපෘතිය 2002,2006 වර්ෂවල තමයි ඔබතුමා කිවු පරිදි ආරම්භ වුයේ. අපට අදාළ කාණු පද්ධති තමයි සිදු කරනු ලැබුවේ. නාමල් ඇළ සිට හෙප්පුමුල්ල ඇළට සම්බන්ධ වෙන එක. ඊළඟ එක ධර්මාශෝක විදුහල පිටුපසින් කරිත්ත කන්ද මුහුණතට නාවාරා පන්ති මුහුණතට වැටෙන කාණුව, ඊළඟට ඒ කරිත්ත කන්ද වටේ තිබෙන සම්පූර්ණ පැතිබැම් ඉදිකර ඇළ මාර්ගය, පොරුක් ඇළ මාර්ගයේ පැති බැමි සම්පූර්ණයෙන්ම ඉදිකිරිම සහ මහ පන්සල පාරට වැටෙන කාණු පද්ධතිය, මහ පන්සල පාරේන් ගිහින් ගොඩවින් මහතාගේ නිවස අසළින් වැටි මහ පන්සලේ ඉඩමට වැටෙන කාණු පද්ධතිය මානාන කුණු ඇළ දක්වා දිගටම. ඊට පසු ඕකන්දෙන් පටන් ගෙන පඤ්ඤාලෝක මාවතේ ළිඳ දක්වා සංවර්ධනය කිරිම. මා අහන්න කැමතියි මෙහි කිසියම් හෝ ලේඛනයක් ඔවුන් සතුව තිබෙනවාද ? නැතිනම් අපි සතුව තිබෙනවාද?ඔය ගොනුවේ තිබෙනවාද ? එතකොට ඒ අය ගාවත් නැද්ද? මෙහි ගරු සභාපතිතුමනි, කලින් හිටපු වැඩ අධිකාරි විදියට සිසිර මහතා තමයි වැඩ බැලුවේ. ඔහු තමයි සම්බන්ධ කර ගනු ලැබුවේ මෙන්න මේවා මේ විදියට වෙන්න ඕන කියා. එතකොට මෙහි අපට ප්‍රවේශයක් තිබෙනවා . නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘතියක් විදියට ඒ අය උපදෙස් දුන්නා මෙන්න මේ කාරණා ඉටුවිය යුතුයි කියා. එහිදි තමයි ඔය පොරුක් ඇළේ පැතිබැම් සංවර්ධනය කරන්න අවශ්‍ය වුයේ. එයට තමයි ඔය මිලියන 600න් මිලියන 200කට වඩා ගියේ. ලොකුම මුදලක් වියදම් වුයේ. එතකොට එය නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම.එතකොට සභාව

අනුමත කළා. නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම නිසා. සමහර ඒවා අපිත් යෝජනා කළා. ඔය පිට්ටනියට වැටෙන පාර, නාමල් ඇළට වැටෙන ඒවා. ඒ හැරෙන්න නාගරික සංවර්ධන අධිකාරිය විසින් අපට ඉල්ලීම් කරපු ඒවත් තිබෙනවා. ඒ ගොල්ලන්ගේ අණපණත් අනුව මේවත් සංවර්ධනය විය යුතුයි මේ ණය මුදල ඔගොල්ලන් පාවිච්චි කරනවා නම්. එතකොට මේ ටිකත් ඉදිරිපත් කරන්න තිබුණා එදා කමිටුවට. මගේ නමත් එදා කියවුණා. නමුත් මා කැඳවලා තිබුණේ නැහැ. මා ආචානම් කියනවා ඒ නිලධාරින්ට. දැන් අපි මේ නිලධාරින් එක්ක ගහගන්න නෙමේ කතා කරන්නේ. අපි සහනයක් ඉල්ලා ගන්න නම් මා යෝජනා කරනවා අපේ නිලධාරින් ලවා මේ ඇළ මාර්ග ටික වර්තමාන තක්සේරුවකට යන්න පුළුවනි. වර්තමාන තක්සේරුවකට ගිහින් අපිට පුළුවන් ඇහයිමක් කරන්න. මෙන්න මේකයි තත්ත්වය. ඒ නිලධාරින් ලවා මෙය අදටත් මිලියන 600ක් වැය වන්නේ නැතිනම් එතකොට ඒ කාල වාකවානුව තුළ මිලියන 600ක් යන්න විදියක් නැහැනේ. මගේ පුද්ගලික මතය අදටත් මෙය මිලියන 600කට තක්සේරු කරන්න පුළුවන්ද කියන එක. මේ කාණු පද්ධති ටික. සමහර විට පුළුවන් වෙයි. එතකොට මේ වසර 15ක කාලය තුළ මිළ ගණන් උච්චාවචේදනයත් සමග අපට පැහැදිලිව ඔප්පු කරන්න පුළුවන් මෙහි වංචාවක් හෝ දූෂණයක් සිදු වෙලා තිබෙනවා කියා ඒ කොන්ත්‍රාත්කරුවන් විසින්. එකයි ඉතිහාසයේ කවදා හරි දිනයක නගර සභාව මෙය භාර නොගත්තේ කියා. අපි එතනින් ඔප්පු කර පෙන්වනවා. ඒ හා සමානවම අපට ලියවිල්ලක් තිබෙනවා අපේ පළාත් සභාවේ විගණන මහත්වරුන්ට අපි මෙන්න මේ නිසායි මෙයට අනුමැතිය දුන්නේ අපේ පැහිදිලි මේක මෙයට අනුමැතිය දෙනවා නම් අපිට මෙම ගෙවීම කිරීමේ ගැටළුවක් නැහැ කියා. එතකොට මේ සභාවත් ඔබතුමලා සියළු දෙනාත් බේරෙනවා. ඉතිං මා හිතන්නේ අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා කිවු පරිදි හා ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතා කිවු පරිදි අපිට විගණන විමසුමකට ලක් වෙන්න පුළුවන්. ජාතියක් ජන්මයක් නැතිව මුදල් අනුමත කර අපට ගෙවන්න පුළුවන්ද කියන එක. අපි මේකට උප්පැන්න සහතිකයක් හදන්න වෙනවා. එතකොට අපි සතුව මේ දේපල තිබෙනවා. එයට හිටපු ගරු මන්ත්‍රීවරු වශයෙන් අපිට සාක්කි දෙන්න පුළුවන්. මේ ගොනුවේත් තිබෙනවා මේ කාරණාව ඉෂ්ඨ වුණා කියා. එතකොට අපිට යම්කිසි ඇහයීමකට එන්න පුළුවනි. වර්තමානය වනවිට මෙහි මිලියන 800ක 900ක වටිනාකම වෙන්න පුළුවනි.එතකොට මේ වටිනාකම වසර 15කට ණය නොගෙවීමට ලක් කළත් ඒ අයට යම්කිසි අවබෝධයක් එන්න පුළුවන් අවුරුදු 15කට උඩදි වුණත් මෙයට මිලියන 15ක් ගියේ නැහැ. මෙහි වංචාවක් දූෂණයක් වෙච්ච නිසා තමයි මේ නගර සභාව මෙය භාර නොගත්තේ කියා. එමනිසා මෙහි සාධාරණ වශයෙන් මුදලක් කපා හැරලා මිලියන 7ක 8ක් හරි සහනයක් කරන්න කියා ඉල්ලීමක් කරන්න.උත්සාහයක් ගන්න. ඒ නැතත් අපිට නිත්‍යානුකුලභාවයක් එන එක ගැන ඔබතුමා කල්පනා කරන්න. මේ කාරණාව මේ විදියට කරනවාද කියන එක. වෙන ක්‍රමයක් මට පෙන්න නැහැ. මා යෝජනා කරන්නේ එකයි. එය ප්‍රායෝගික නොවෙන්න පුළුවන්. හැබැයි මේ කාරණයේදි අපිට කිසිවක් ඉතිරිවෙලා නැහැ. අපි සභාව බේරෙන්න. මොකද ඒ මේවා එක පෙන්වන්න පුළුවන් අපිට බෙරෙන්න. මෙය සත්භාවයෙන් කරන වැඩක් මේ සභාව යෝජනා කරලා. මේ ණය මුදල ගෙවන් උවමනාව සභාවට තිබෙනවා. ඉතිං මේ ණය මුදල ගෙවා ගන්න බැරිව ඉදිරියට සභාවට විශාල ප්‍රශ්න තමයි. මෙහිදි අපි ණය නොගෙවීමේ ලේඛණ ගත වෙලා තිබෙනවා. මේ සභාවේ සියළුම මන්ත්‍රීවරු එකඟයි. මේ සභාව එකඟවෙනවා මේය ගෙවන්න. හැබැයි ඔබතුමන්ලාගේ අනුමැතිය අවශ්‍යයි. ඒ අනුමැතිය ඒ අයට නිකං දෙන්න බැහැ. විගණන විමසුමටත්.කියන්න පුළුවන් මෙන්න මේ විදියේ

දෙයක් කරන්න පුළුවන් අපිට මේ මුදල් ගෙවන්න පුළුවන්. මට තෙරෙන විදිය තමයි මා කතා කළේ. මේ ගැන බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අඩුම වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් හරි කියනවා නම් අඩුම ගණනේ මෙන්න මේ වැඩ ටික කර තිබෙනවා. මේ මුදල් ටික ගෙවන්න කියා ලිපියක් හරි එවනවා නම් ඒත් ඇති. අපට මොකක් හරි අපි සන්තකයේ තිබිය යුතුයි ලියවිල්ලක් මෙය ගෙවන්න නම්. අවම වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය නම් මෙය පාලනය කළේ ඔගොල්ලන් මෙච්චර කල් මුදල් ගෙවා නැහැ. මෙන්න මෙච්චර වැඩ කොටසක් කර තිබෙනවා. ඔගොල්ලන් මේ ණය මුදල ගෙවන්න. අපට ඒ අනුව ගෙවීම් කරන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාත් මෙය කලින් කල්පනා කළේ. සිසිර මහතා ඉදලා තිබෙනවා ඒ කාලයේ. සිසිර මහතාත් ,පළාත් පාලන දිස්ත්‍රික් ඉංජිනේරු තැනත් , පළාත් පාලන ඉංජිනේරු තැනත් යන තුන්දෙනාගෙන් යුත් කමිටුවකින් මෙය පරික්ෂණයක් කර මෙය මෙන්න මෙච්චරක් ඔගොල්ලන්ට කාණු හම්බවෙලා තිබෙනවා. මෙච්චරක් පැති බැම් ඉදිකිරීම් හම්බවෙලා තිබෙනවා. කියා වටිනාකම අරගෙන අපට වාර්තාවක් ලබාගෙන ඒ මත ගෙවීම තමයි යෝජනා කළේ. මිළ ගණන් වලට බලා අපට මේවා කරන්න පුළුවනි. එහෙමනම් අපට ඒ කමිටුව මඟින් ගන්න තීන්දුවක් සභාවට ඉදිරිපත් කරන්නම්. මේ කාරණය අපේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම මතක තබා ගන්න. අපි මෙය ඉක්මනින් ගෙව්වොත් අපට ඊට වාඩා දේශීය ණය සංවර්ධන අරමුදලේ තිබෙනවා මීට වඩා වැඩි ප්‍රතිලාභ තිබෙන ණය මුදල්. මේ වගේම . අපට ඒ තැන්වලට යන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වැසිජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු කෙරී තිබෙන්නේ ගරු හිටපු සභාපති ජී.එම්.එස්. ද සිල්වා මහතාගේ කාලයේදී. එතකොට ගරු උප සභාපති සරත් ශ්‍රී ලාල් මහතා තමයි හිටියේ. මට මතක හැටියට. ඔබතුමා ඊට පස්සේ අධීක්ෂණය කළේ. මෙහි පාලන තන්ත්‍ර වෙනස් වීම තුළ යම් යම් කටයුතු තිබුණා. නගර සභාවේත් වගකීමක් තිබෙනවා. එම වගකීම ඉටු වෙලා නැහැ. එක පැත්තකින් . එතකොට අපි ගත්තා කියා ගිවිසුම් අත්සන් කර තිබෙනවා. මේ ගැනීම සඳහා ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් අත්සන් කර තිබෙනවා. එතකොට මේකත් රාජ්‍ය ආයතනයක්. දැන් අපි මුදල් ගෙවන්නේත් රාජ්‍ය ආයතනයකට. මෙය හොර මැරකමකට ගෙවන එකක් නෙමේනේ. එතකොට ඔබතුමා කිවූ පරිදි ගරු නගර සභා මන්ත්‍රී කොඩිකාර මහතා කිවූ පරිදි ගරු සරත් මහතා කිවූ පරිදි එම ක්‍රමවේදය සාදා ගැනීම දුෂ්කර නැහැ. මොකද හේතුව මෙහි වැඩ කෙරී තිබෙනවා. එතකොට මෙහි තවත් වැදගත් දෙය මේ අය කියන්නේ මිලියන 12ක් ගෙවන්න කියා. එමනිසා පොඩි ගණනක් ගෙවන්න කියන්නේ. මෙහි මෙච්චර කාලයක් ගිහින් පොළියත් කපා හරිනවා නම් අපේ උනාන්දුවක් තියෙන්න ඕන මෙය කපා හැරීමේ ක්‍රම වේදයක් සාදා ගැනීමට. මෙය අතහරින්න එපා. මොකද අත හරින්න එපා කියන්නේ අපට ප්‍රශ්න ඇති වෙන නිසා නෙමේ. මෙහි වැඩ කටයුතු කෙරී තිබෙනවා. අපිත් දන්නවා. අපි යනවිට පැති බැම් හදලා ඒ

ටික ඔක්කොම කෙරි තිබෙනවා. කාණු පද්ධතිත් ඔක්කොම කෙරි තිබෙනවා. යම් යම් ප්‍රශ්න තිබ් තිබෙනවා. අපිට කාටවත් කියන්න බැහැ. අපි වංචාවක් කරා කියා. අපි අධික්ෂණයක් කළා කියා. දන්නේ නැතිව කාටවත් ඇඟිල්ල දික් කරන්න බැහැනේ. මෙහි වංචාවක් කළා කියා. එමනිසා ඒක අපට ඕන නැහැ. මෙය ගෙවීමේ ක්‍රමවේදය හදා ගන්න. හදා ගන්න නම් මෙය කළා කියා වැඩ කොටස දමා නාගරික සංවර්ධන අධිකාරියටත් කරුණු පැහැදිලි කර ඔබතුමා එතනින් හරි ගෙන්වා ගෙන මේවා කර මෙය අවසන් කර ගන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙය අමාරු කාර්යයක් නෙමේ. දළ වශයෙන් ගන්න පුළුවනි මැන. මෙහි පැති බැම් ටික මැන්නාම පුළුවනි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ පිළිබඳව දන්වා යවන්නම්. ණය මුදල ගෙවීමට එකගයි. අපිට මෙහි නිවැරදි වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොකද දැන් ඒ ගොල්ලන්ගේත් වගකීමනේ අපි ගෙවනවා නම් නාගරික සංවර්ධන අධිකාරියේත් වගකීමකි. එමනිසා එය කියන්න.

තීරණය

**03.17 නගර සභාව සතු අංක 252-0730 දරණ කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු ලෙස ටින්කරින්, පින්තාරු හා ස්පීඩෝ මීටරයක් යෙදීම සම්බන්ධ ලිපිගොනුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභාව සතු අංක 252-0730 දරණ කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු ලෙස ටින්කරින්, පින්තාරු හා ස්පීඩෝ මීටරයක් යෙදීම කළ යුතු බවට රියදුරු විසින් දන්වන ලදුව තාක්ෂණ සේවා නිලධාරි විසින් අදාල ඉල්ලීම පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු මහතාට ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගන්නා ලෙස වාර්තා කර ඇත. එම වාර්තාවක් ලබා ගෙන තිබෙනවා. ඒ අනුව මෙය අලුත්වැඩියා කටයුතු කිරිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි කියක් යනවාද මෙය අලුත් වැඩියා කටයුතු කිරිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කියක් යනවාද මෙය අලුත් වැඩියා කටයුතු කිරිමට. මෙයට මුලින් අනුමැතිය ඉල්ලා සිටිනවා. ඊට පස්සේ ඇස්තමේන්තුව ගන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

කොහොම වුණත් ඇස්තමේන්තුවක් ගන්න එක හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ටින්කරි කළාම හොඳයි සම්පූර්ණ කැඩිලා තිබෙන නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ. අපි බලමු ඉංජිනේරු මහතාගේ වාර්තාවක් සමඟ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ටින්කරු කළාම අවුරුදු 5ක් පාවිච්චි කරන්න පුළුවනි. කිසි කරදරයක් නැතිව.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි, අපට මෙය තින්දු කරන්න වෙන්නේ යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ තින්දුවෙන් පසුවයි. ඔහු විසින් දෙන තීන්දුව අනුව. අලුත් එකක් තියන්න කිවුවොත් අලුත් එකක් තියනවා. අළුත් වැඩියා කරන්න කිවුවොත් අළුත් වැඩියා කරන්න වෙනවා.

තීරණය

**03.18 පුස්තකාල පොත් සමීක්ෂණයේ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් අතිකාල දීමනා ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිගොණුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 වසරේ පුස්තකාල පොත් සමීක්ෂයේ රාජකාරි කටයුතු කිරිම වෙනුවෙන් අතිකාල දිමනා ලබා ගැනීම. ඒ.ඩබ්. ඉන්ද්‍රදාස අතිකාල පැය 82, බී.එච්. දයාලතා අතිකාල පැය 91, සුසිලා දීපානි 18 ½ ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

04. යථා පරිදි කල් දී ප්‍රශ්න නැත

05. යථා පරිදි කල් දී යෝජනා

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01 ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් මානාන ක්‍රීඩාංගනයේ කොටසක ඉදිකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා විසින් ඉදිරිපත් කරන යෝජනාව මා එය ලබන සභාව දක්වා කල් තියනවා. මොකද එතැන දැනට ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ගෘහස්ථ ක්‍රිඩාංගණයක් ඉදිකිරීමට අපි දැනට මානාන ක්‍රිඩාංගණය තමයි දැනට තින්දු කර තිබෙන්නේ.එතැන ක්‍රිඩා පිටියේ ඒ ගම්වැසියන් සහ අතර ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන නිසා එහෙම වුණොත් අපි මානානෙන් ඉවත් කර වෙනත් තැනක ඉදිකරන්න යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එයට අපි විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මානානේ නම් දැන් ප්‍රශ්නයට මැදිහත්වෙලා ඉන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් රුස්වීමක් දමා තිබෙන්නේ. සාකච්ඡාවක් දමා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සාකච්ඡාවට එන්න හෙට පස්වරු 2.30ට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හෙට නෙමේ 05දා දුන්නේ. එහෙම වෙනස් කරන්න එපා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා දන්නේ නැහැ. හරි 5දා තමයි . මා මෙය පොඩ්ඩක් පැහැදිලි කර දිය යුතුයි. මේ සමඟම අපි වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ක්‍රිඩා කමිටුවට. ක්‍රිඩා කමිටුවේ වාර්තාව තමයි අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින් කොඩ් හතරකින් යුතු අලුත් බැන්මින්ටන් ක්‍රිඩාංගණයක් ලබා දෙනවා අම්බලන්ගොඩට. අම්බලන්ගොඩට මෙය හදන්න අපට මානාන ක්‍රිඩාංගණය තමයි මෙතැන හදන්න අපිට ඉතිරිවෙලා තිබෙන්නේ. අපි එක කතා කරන්නම්. මානාන ක්‍රිඩාංගණය දැනට අපි දියුණු කරගෙන ගියා. එය කරගෙන යනවිට දැනට මානාන ක්‍රිඩාංගණයේ දැනට පිච් එක වෙනස් කරලා 17 වෙනකම් ක්‍රිඩා කරන්න පුළුවන් මට්ටමට තිබෙනවා. ඒක හදන්න තමයි අපි අලුත් පිච් එකක් හදන්න ගියේ. එය හදන්න යනවිට මේ ගම්වැසියන් සියළු දෙනා පැමිණ මෙය හදන්න එපා කියා ලොකු ප්‍රශ්නයක් ඇති කරලා දැන් එය හැදිම නතර කර තිබෙනවා. ගම්වැසියන් ප්‍රමාණයක් විරුද්ධ වෙලා තිබෙනවා. දැන් එමනිසා මේ සම්බන්ධව 05 සවස 2.30ට ගම්වැසියනුත් ඒ වගේම අපේ ක්‍රිඩා කමිටුවේ සිටින සියළු දෙනාත් , ගරු මන්ත්‍රිවරුන්ටත් මා ආරාධනා කරනවා. අවිල්ලා අපි ගම්වැසියන් සමඟ සාකච්ඡා කර ඔවුන්ට මෙය තේරුම් කර දිලා මෙය ඉදිකරනවාද නැද්ද කියන එක , ක්‍රිඩාංගණයම ඉදිකරනවාද කියන තින්දුවට ගන්න වෙනවා. අපේ ගරු මන්ත්‍රිතුමා ඔබතුමා කියන්න ගම්වැසියන් සම්බන්ධව.

**ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇත්තටම ක්‍රිඩා පිටියක් දියුණු එකට මාත් කැමතියි. ඔය ක්‍රිඩා පිටිය තිබුණ විදිය මා දන්නවා. මා කුඩා කළ සිට සෙල්ලම් කළේ ඔය ක්‍රිඩා පිටියේ. මොකද ගරු සභාපතිතුමා බනිද්දි බනිද්දි තමයි මා එය සංවර්ධනය කළේ. කරගෙන ගිහින් එය දැන් අතර මැදදි නතර වුණා. සම්පුර්ණම ක්‍රිඩා පිටිය ඒ කාලයේදි හැදුවා නම් දැන් අපටත් අපේ ගමේ උදවියටත් සෙල්ලම් කිරිමේ අපහසුතාවය මතු වෙනවා. මේ ගමේ උදවියගෙන් මා ඇසුවාම මොකද ඔගොල්ලන් විරුද්ධතාවය තිබෙන්නේ වයස අවුරුදු 17න් පහළ ළමුන්ට සෙල්ලම් කිරිමට ක්‍රිඩා පිටිය හැදුවාම ඔය ක්‍රිඩා පිටිය ඒ අය වෙන්කර ගන්නවා. එය වෙන්කළාම උදේ 8.00 ට මේ ක්‍රිඩා තරඟ පටන් ගත්තාම සවස 6.00 වෙනකම් මේවා පවතිනවා. පසුගිය මාස දෙක තුනකදි සභා වාර කිහිපයකදි මා මේ බව ප්‍රකාශ කළා. ක්‍රිඩා පිටියේ සවස 6.00 වෙනකම් සෙල්ලම් කළොත් මැටින් එක ගලවා යනවිට සවස 6.30 විතර වෙනවා. එතකොට ගමේ උදවියට සෙල්ලම් කරන්න විදියක් නැහැ. ඔතනට එනවා ගම් 5ක් 6ක ක්‍රිඩකයෝ. පොඩි දරුවන් සෙල්ලම් කරන්න එනවා. සතියකට දින 4,5ක් ක්‍රිඩා පිටිය වෙන්කර තිබුණොත් ඒ එන ක්‍රිඩකයන්ට සෙල්ලම් කිරිමේ අපහසුතාවය ඇති වෙනවා. මෙතැනට ක්‍රිඩකයින් විවිඟ වු අය ඇතුළු ක්‍රිඩකයන් 50 අධික පිරිසක් ඔතනට එනවා. එමනිසා කිසි කෙනෙක් ඔතැන මත්තද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා නැහැ. ගංජා , සිකරට් , අරක්කු වලට ගිහින් නැහැ. මා දන්නවා මේ ගරු මන්ත්‍රිතුමියගේ පුතාත් ඉන්නවා. සවස 5.00 ඔය ක්‍රිඩා පිටියට කට්ටිය එනවා. ආයි යන්නේ රාත්‍රි 7.30ට පමණ. එම වේලාවට ගිහින් ඇඟ සෝදා ගත්තාම ආයිත් පිට යන්න වේලාවක් නැහැ. ඔය ක්‍රිඩා පිටිය පාසැල් වලට වෙන්කර දුන්නාම සවස 6.00 විතර වෙනකම් ගහනවා. ක්‍රිඩාංගණයේ සෙල්ලම් කරනවා. ඉන්පසු මැටින් එක

අස්කර ඉවර වෙනකොට 6.30 විතර වෙනවා. ඒ වේලාවට ගමේ අයට සෙල්ලම් කරන්න බැරි වෙනවා. එහෙම බැරි වුණාම ඔය ක්‍රීඩාකයන්ගේ ක්‍රීඩා කිරීම එහෙම කැඩෙනවා. එහෙම වුණාම ඒ දරුවන් එක එක දේවල් වලට යොමු වෙනවා. ඇත්තටම ගරු සභාපතිතුමනි, සවස 6.00න් පසු පැමිණ බලන්න එතැන කී දෙනෙක් සෙල්ලම් කරනවාද කියා. හැබැයි ක්‍රීඩා පිටිය දියුණු කරනවාට මාගේ කිසි විරෝධතාවයක් නැහැ. එහි එක්කෙනෙක් දෙදෙනෙක් තමයි එහි අකුල් හෙලන්නේ. අපි ඒ අයට තේරුම් කර දිය යුතුයි. එහෙම දීලා මේ වැඩය ක්‍රියාත්මක කරන්න ඉතාමත් අත්‍යාවශ්‍යයි. මොකද පොල්වත්ත ක්‍රීඩාංගණයේත් වුණා ඕක. අර ගාමිණී විද්‍යාලයෙන් ක්‍රීඩාංගණය වෙන්කළා වගේ. එම ගමේ උදවියට සෙල්ලම් කරන්න නැති වෙනවා. එය නම් පොඩි ක්‍රීඩාංගණයක් නිසා එක දිනයයි. නමුත් අපේ ක්‍රීඩාංගණය විශාලයි. සතියේ දින හතම වෙන් කරන දින තිබෙනවා. එම දින 5, 7 වෙන්කළොත් ගමේ උදවියට සෙල්ලම් කරන්න විදියක් නැහැ. අපි ඒ අයට තේරුම් කර දෙන්නම්. එක්කෝ සෙනසුරාදා හෝ ඉරිදා ක්‍රීඩාංගණය වෙන්කිරීම නතර කරන්න. සෙනසුරාදා ඉරිදා වෙන්කිරීම් නොකරන්න, සවස 5.00න් පසු ක්‍රීඩාංගණය ගමේ උදවියට දෙන්න අන්න ඒ වගේ යෝජනාවක් කරන්න. දැන් රැස්වීමක් කැඳවා තිබෙනවානේ. ඒ වගේම ගමේ උදවියට ප්‍රමුඛතාවය දෙන්නත් ඕන. සවස 5.00න් පසුව දෙන්න. මගේ ගෝලයෝ, යාළුවෝ ඒ අය වෙනත් දේවල් වලට ඇබ්බැහි වෙනවා. ගංජා , කුඩු , අරක්කු වෙනවාට මා කැමති නැහැ. මට වැදගත් වන්නේ ගම. මොකද මා ගමේ ඡන්දයෙන් පත්වෙලා ආවේ. මා 2002 පත්වෙලා ආපු වේලාවේ මූලික ඉල්ලීම වුයේ ක්‍රීඩා පිටිය සාදා දෙනලෙසයි. මා එවන එවන මුදල් ඔක්කොම යට කරනු ලැබුවේ ඕකට. ගරු සභාපතිතුමා මට බැන්නා. මුදල් යට කරන්න එපා කියා. ඒ තත්ත්වයට ඔය පිට්ටනිය ගෙනාවේ. කොහොම හරි ගමේ උදවියට පුළුවන් නම් තේරුම් කර දිය යුතුයි. එහෙම දීලා අපි බලමු මෙය ඉදිරියට සංවර්ධනය කරන්න. ඇත්තටම මා කැමතියි ක්‍රීඩා පිටිය දියුණු වෙනවාට. මාගේත් ලොකු ආශාවක්. කුඩා කාලයේ සෙල්ලම් කළ නිසා. අපි බලන්නම් 5දාට මොකද කරන්නේ කියා. ගමේ උදවියගේ පැත්තේ මට ඉන්න වෙනවා. මොකද ගමේ අය ක්‍රීඩා කරනවා. ගමේ අය කැඩුණොත් එක එක දේවල් වලට ඇබ්බැහි වුණොත් එය මටත් බලපානවා, ගරු සභාපතිතුමාටත් බලපානවා. නගරයටත් බලපානවා. දැන් ඇත්තටම තල්ගස්ගොඩ පැත්තේ ගෙදරක ඇඳුමක් තියාගෙන ඉන්න දෙන්නේ නැහැ. දළුක්කන්ද පැත්තෙත් තිබෙනවා, මේ හල්වතුරේත් ඊයේ පෙරේදා වුණා. ගෑස් සිලින්ඩරය එළියේ තිබුණ එක අරගෙන ගිහින්. ගෑස් එකක් කඩෙන් ගෙන්න එළියේ තබා තිබුණ එක තමයි අරගෙන ගිහින් තිබෙන්නේ. අපේ පැත්තේ ඒ කරදරය නැහැ. අපේ ගමේ ඒ කරදරය නැහැ. මා කැමති නැහැ ගමේ උදවිය කැඩෙනවාට. ගමට ඕන ක්‍රීඩා පිටිය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම අර කියමනක් තිබෙනවා පැමිණෙන බාධක වෙස්වලාගත් ආශිර්වාදයක් කියා. ඉතිං එම නිසා අපේ ගරු සහෝදර මන්ත්‍රීතුමා කියපු දෙය ඇත්ත. අපි තරුණ ජවය ගැන හිතන්න ඕන. ඒ අයට ප්‍රධාන තැන දෙන්න ඕන. ඒ වගේම ඔය විද්‍යාල අතර ක්‍රීඩා කරන අයත් අපේම දරුවෝ. අපේම නගරයේ දරුවෝ. ඉතිං ඒ අයටත් යම්කිසි කාල සීමාවක් දුන්නාම ඒ අය සිටින්නේ පාසැල් යන කාල සීමාව තුළ තමයි. ඒ අය නගර සභා ක්‍රීඩාංගණයේ අවසර ලබා ගෙන ක්‍රියාත්මක වෙන්න. මා හිතන විදියට ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා එතුමාත් ක්‍රීඩා කළා කියා. ඇත්තටම ඔය ධම්මකුසල විද්‍යාලයට තිබුණ ක්‍රීඩා පිටිය. අපිනම් පාරේ තමයි

දිව්වේ. පිට්ටනියක් ඒ දිනවල තිබුණේ නැහැ. නමුත් විශේෂයෙන් කියන්න ඕන. අපේ ඒ දිනවල හිටියා ගරු මන්ත්‍රීතුමෙක් එන්.යූ ජයරත්න කියා. තරුණසේවා සභාවේ වැඩ කළේ. එතුමා හැදුවා යෞවන සමාජ ඒ කාලයේ. ඒ යෞවන සමාජ වල හිටපු අය අපි. මගේ සහෝදර ලක්ෂ්මී මන්ත්‍රීතුමිය. අපි දන්නවා අපි මෙහි උප්පැත්තියේ සිට දන්න අය. එමනිසා මේ ක්‍රීඩාංගණය ගැන අමුතුවෙන් කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මුළු සභාවේම සිටින ගරු මන්ත්‍රීවරුත් දන්නවා. මොකද පිට අය නෙමේ ඉන්නේ. ඔක්කොම අපේ නගරයේ අය. එමනිසා මේ ක්‍රීඩා පිටිය තරුණ ළමුන්ට පහසුකම් ඇති කරන්න ඕන. නමුත් ගමට ලැබෙන සම්පත් ඒවා නැති කරන්න ඔය එක්කෙනෙක් දෙනෙක් සිටිනවා. ඔය පැමිණෙන තරුණයින් කිහිපදෙනෙක් මා සමඟත් කතා කළා. මා කිවුවේ මල්ලි අපට මහ අම්බලන්ගොඩ ප්‍රදේශය දියුණු කරන්න ඕන. මොකද පොල්වත්ත ප්‍රදේශය දියුණු කරන කොට ඒ ගරු මන්ත්‍රීවරු එකතු වෙලා ඒ අය ඔක්කොම කර ගන්නවා. ඔබතුමාගෙන් අපිත් අපේ ගමට ඒ දේවල් ලබා ගැනිමට සහායෝගයෙන් උද්ගයොන් වැඩ කිරීම වැදගත් වෙනවා. විශේෂයෙන් ගරු ඉනෝකා මන්ත්‍රීතුමියත් පදිංචි වෙලා සිටින්නේ ඒ පිට්ටනිය අසළමයි. එතුමිය හිරේවත්ත ප්‍රදේශය නියෝජනය කළොත් හැම ප්‍රශ්නයක් සිදු වුණාම එතුමියත් එතැනට එනවා. එක තමයි අපේ තිබෙන බැඳිම. සහායෝගය. මොනවා හරි ප්‍රශ්නයක් වුනාම . ඇත්තටම මා එදා හිටියේ නැහැ. මාගේ ශෛල්‍ය කර්මයක් සඳහා ගිහින් හිටිය නිසා. නැතිනම් මාත් ඒ අවස්ථාවේ එනවා. මොකද ජනතාවගේ ප්‍රශ්න මේ. අපට කතා කිරමේ හැකියාව තිබෙනවා. ඒ අයගේ. අපි කතා කරලා ඒ අයට තේරුම් කළ යුතුයි. මා ඇත්තටම සතුටු වෙනවා ඔබතුමා නැවත සාකච්ඡාවක් දමා තිබෙනවා 05දාට. අපි සියළු දෙනා එයට සහභාගි වෙලා ඒ අයට ඒ අවශ්‍ය කරණ තත්ත්වය පැහැදිලි කර දිලා ඔබ අවේගශිලි නොවී ඒ සඳහා අප කටයුතු කරනවා. අපට ලබා දෙන්න තිබෙන ඒ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය අනිවාර්යෙන්ම ඒ ප්‍රදේශයට ලබා දෙන්න. අනිවාර්යෙන්ම එම ප්‍රදේශ දියුණු කරන්න ඕන. මොකද ඇත්තටම අම්බලන්ගොඩ නගරයද අද මහ අම්බලන්ගොඩ කියා හිතන තරමට මේවා වෙලා අර ධම්මකුසල විද්‍යාලයේ තත්ත්වය නිසා. කැළැවක් වැවිලා. මේ වගේ නගරයේ සිට බැලුවාම කිලෝමීටර් ½ වත් නැහැ. දැන් අපි කාපට් දානවාලු. එම කාපට් දමන විට ඔබතුමාට කියනවා පළමුව ජලනල පද්ධතිය හදන්න. නැතිනම් හැම තැනම කැඩෙනවා. ජල සම්පාදනයට කැඩෙනවා. එමනිසා කාපට් දමනවා නම් ජල නල පද්ධතිය දමන්න කියන ගමන් මේ පැමිණෙන බාධක වලට ඔබතුමා ප්‍රශ්නයක් වෙන්න එපා. මොකද ඔබතුමා ඒ තරුණ ජවයත් සමඟ සාකච්ඡා කර ගම් වාසින් සියළු දෙනා සමඟ එය පැහැදිලි කර ඒ සඳහා සූදානම් වෙන්න. එම සාකච්ඡාව සාර්ථකව නිම කරමින් ඒ පහසුකම ගමට ලබා දෙන්න .

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ මානාන ක්‍රීඩාංගණය ගැන අමුතුවෙන් මා කියන්න යන්නේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී නිලානි මන්ත්‍රීතුමිය කිවුවා. ඇත්තටම එම ක්‍රීඩාංගණය දියුණු කිරීම සම්බන්ධව ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාට හා ඔබතුමාට ස්තුති වන්ත වෙනවා. අපි කුඩා කාලයේ අපේ අම්මා අපි වැඩියේ එක්කගෙන යන්නේ නැහැ. සර්පයෝ සිටිනවා. ඒ වගේ තත්ත්වයක තිබුණු කැළැවක්. කැළැවක් තමයි අද ඔය තත්ත්වයට පත් කළේ. එමනිසා ගරු සභාපතිතුමනි, ඕන දෙයක් කරන විට බාධක එනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභාවෙන් කුණු වසර 50ක් දාපු තැන.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

එකනේ ඔබතුමාට මා ස්තුති කළේ. ඔය පාරෙන් එක්කගෙන යන්නෙත් නැහැ. හරි බයයි. සර්පයෝ එනවා. බල්ලෝ ලැඟ සිටිනවා. එම නිසා යන්නේ නැහැ. එමනිසා අපි ස්තුති වන්ත වෙනවා අපේ ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාට හා ඔබතුමාටත්. ඒ අවස්ථාවල ගරු මන්ත්‍රීවරු සහායෝගය දක්විම පිළිබඳව. කොහොම නමුත් බාධක එනවා වැඩ කරන කොට. මටත් පැමිණ කිවුවා දෙතුන් දෙනෙක්. මා කිවුවේත් එහෙම ආසාධාරණයක් වෙන්නේ නැහැ. ඒ අයට ක්‍රිඩා කරන්න බැරිවෙයි කියා බයක් තිබෙනවා කිවුවා. මා කිවුවා එහෙම වෙන්නේ නැහැ. දැන් පොල්වත්ත ක්‍රිඩා පිටියේ ගිහින් ක්‍රිඩා කරන්න පුළුවන්. එහෙම කවුරුත් ගිහින් අල්ලා ගන්නේ නැහැනේ. ක්‍රිඩා කරන්න පුළුවන්නේ. එහෙම ගතියක් තමයි ඒ අය පෙන්නුම් කරන්නේ. කෙසේ නමුත් ඕක දියුණු කරන්න ඕන. බැඩ්මින්ටන් ක්‍රිඩාංගණයක් හදන්න ඕන. මොකද අපේ ගමටත් දේවල් එනවාට අපි කැමතියි. එතකොට අපිටත් අභය කර කියන්න පුළුවන්. අපිටත් ක්‍රිඩාංගණයක් තිබෙනවා. බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයක් තිබෙනවා. ඒ සම්බන්ධව අපි පස්සට යන්න හොඳ නැහැ. මිනිසුන් ඕන දෙයකදි ඔය ඔන්නැති වචනයක් දෙකක් කියාගෙන ඕනම තැනක ජනතාව එනවා. දැන් මේ මහජන ක්‍රිඩාංගණය හදද්දි ඔබතුමාට කොච්චර චෝදනා අවාද? කොච්චර මුහුණු පොතොන් ගැහුවාද? කොච්චර පත්තර වලින් කිවුවාද? ඒ වුණාට ඔබතුමා සැලුනාද? අපි සැලුනාද? අපි කිවුවේ හදන්න පිට්ටනිය. ඉතිං දැන් හැදෙනවා පිට්ටනිය. ඒ වගේ දෙදෙනෙක් තුන්දෙනෙක් එයි පොලු මුගුරු ගෙන.කුණු හරුප දෙක තුනක් කියන්න පුළුවන්. අපි ඒ අයට කියන්න ඕන ඒ අයටත් සෙල්ලම් කරන්න දෙනවා කියා ඒ අයත් සනසවන්න ඕන. එහෙම කියා මෙය කොහොමහරි හදන්න ඕන. මොකද අපේ ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා මෙච්චර දෙයක් කර ගත්තානම් අපිත් එයට සහායෝගය දිලා ඉතිරි ටිකත් මේක හොඳ තත්ත්වයේ ක්‍රිඩාංගණයක් බවට පත්කර දෙන්න කියා ඉල්ලා සිටිනවා. ගමේ ජනතාව සමඟ සාකච්ඡා කර මාත් එන්නම් එම සාකච්ඡාවට. මාත් ඒ අයට තේරුම් කර දුන්නා. නැතිනම් ඔතන අර හවසට දැන්නම් මා දන්නේ නැහැ. ඉස්සර නම් අරක්කු බෝතල් බී ගෙන ගංජා බීගෙන ඒ වගේ දේවල් තමයි ඔතන ඇති වුණේ. ඔය කැළැවේ. ඉතිං එම නිසා මෙය පස්සට නම් දාන්න එපා. මේක කරන්න. කොහොම හරි මේක කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ අපේ ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කිවුවේ ඇත්ත. ළමයින්ගේ සම්පූර්ණ ආශිර්වාදය තමයි ක්‍රිඩාව. ළමයි එයට යොමු වුවහොත් කවදාවත් වැරදි වැඩ වලට යන්නේ නැහැ. එමනිසා ක්‍රිඩා පිටිය අත්‍යවශ්‍යයි. මේ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය හදන එකත් විශේෂයෙන්ම අත්‍යවශ්‍යයි. ඉතිං ගරු මන්ත්‍රීතුමා ඔබතුමලා ගරු මන්ත්‍රීවරු 6දෙනෙක් නියෝජනය කරනවා මේ ක්‍රිඩාංගණය ආශ්‍රිතව. එමනිසා ගමේ ළමයින් දැනුවත් කරන විට ඒ අය දැනුවත් කරන්න ඒ අයට දිනයක් හෝ දින දෙකක් අනිවාර්යෙන්ම එම දිනවල ක්‍රිඩාංගණය වෙන්කිරිම් වලට දෙන්න එපා. එම වෙන්කිරිම් නැතිව ළමයින්ට නොමිලේම ලබා දෙන්න එය.

ගමේ ළමයින්ට ක්‍රීඩා කරන්න දිනයක් එහෙම දාලා එම කරන්න . එතකොට ළමයින් එම ගැටළුව විසඳා ගන්නවා. මොකද ඒ අයට කියන්න ඕන ගමේ පිට්ටනිය දියුණු වෙනවා. ක්‍රීඩා පිටිය හැදෙනවා. එතකොට ගමේ තරුණ ඔබලා තමයි සතුටු වෙන්න ඕන ගමට හොඳ ක්‍රීඩාංගණයක් එනවිට. ඔගොල්ලන්ටත් සම්පූර්ණ සහාය දෙනවා කිවුවොත් ජනතාව විරුද්ධ වෙන්නේ නැහැ. අම්බලන්ගොඩ ඉන්නේ විශේෂයෙන්ම නුගත් කොටසක් නෙමේ. විශේෂයෙන් මහ අම්බලන්ගොඩ වගේ වෙනවිට උගත් ළමයින් ඉන්නේ. පහදා ප්‍රශ්නය විසඳන්න පුළුවන්. අනිවාර්යෙන් මෙය දියුණු කරන්න. තව තවත් දියුණු කරන්න බැඩ්මින්ටන් ක්‍රීඩාගාර ඇතිකරලා මානාන ක්‍රීඩාංගණය සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ සහායෝගය ඇතිව ගැටළුව විසඳා ගන්න. කිසිම අවුලක් වෙන එකක් නැහැ. මා එය හොඳාකාරවම දන්නවා . එය ආශිර්වාදයක් වෙයි. ඔබතුමාට වැඩය කරගෙන යන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මාත් වචනයක් හරි කතා කළ යුතුයි. අපේ සංවිධායකතුමාගේ කාර්යාලය තිබෙන්නේ පනියන්දුව කොට්ඨාශයේ නිසා. මාත් නිතරම එහි යනවා. ගරු සභාපතිවරයා ඇතුළු සියළු මන්ත්‍රීවරු ගන්නා උත්සාහය අපි අගය කළ යුතුයි. අපේ ගරු නගර සභා මන්ත්‍රීතුමා ඇතුළු නිලානි මෙනවිය ඇතුළු සියළු දෙනා ගන්න උත්සාහය අපි අගය කළ යුතුයි. විශේෂයෙන් මේ මහජන ක්‍රීඩාංගණයේ තිබෙන ගැටළුත් එක්ක අපට දියුණු කරන්න පුළුවන් හොඳම ක්‍රීඩාංගණය මානාන ක්‍රීඩාංගණය තමයි. එයට තිබෙන උපරිම පහසුකම් ලබා දෙන එක තමයි අපේ යුතුකම. එතන ලොකු ගැටළුවක් තිබෙනවා. පනියන්දුවේ එම වැඩ කිරිමේදි ලොකු ගැටළු තිබෙනවා. විවිධ පුද්ගල චරිත අනුව. විශේෂයෙන්ම සැහැල්ලු පන්දු ක්‍රීඩාව මා ඔය ගමේ කිහිප දෙනෙකුටම තේරුම් කර දුන්නා. ගමට වේග පන්දු ක්‍රීඩාව වයස අවුරුදු 15න් පහළ හා 17න් පහළ අය ක්‍රීඩා කරනවා කියන්නේ ගමට ලොකු ආඩම්බරයකි. අනිත් එක ක්‍රීඩාංගණය දියුණු කළාම ගමට ලොකු තැනක් එනවා. ඒ වගේම ක්‍රීඩාවත් දියුණු වෙනවා. විශේෂයෙන් ඔතන සිටිනවා අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විදියට ළමුන් 50ක් විතර සිටිනවා. මාත් ඔය සියළු දෙනාම අඳුරනවා. ඉතිං එම ළමයින් වෙන වෙන දේවල් වලට පෙළඹීම වැලකෙනවා ඔබතුමා කිවුව විදියට සැහැල්ලු පන්දු ක්‍රීඩාවත් සවස 4 හා 5න් පස්සේ සිදු කරනවා. ඇත්තටම ක්‍රීඩාංගණය වෙන් කළාට පසු සවස 5න් පසු එය නතර කරනවා නම් ක්‍රීඩා කරන්න පුළුවන්නේ. එමනිසා අපි ඔතන සාකච්ඡාවේදි එම තරුණ ළමයින් අපහසුතාවයට පත් නොවන විදියට අපේ වැඩය සාර්ථක වන විදියට එම වැඩය කරන්න කියා ගරු සභාපතිතුමා ඇතුළු සියළු ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු විදියට අපි උපරිම සහායෝගය ලබා දෙනවා කියන එක ප්‍රකාශ කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපට පැමිණ තිබෙන මේ මානාන ක්‍රීඩාංගණය ඉදිකිරිම සම්බන්ධව මේ 05දා පැවැත්වෙන සාකච්ඡාව අනුව මේ අම්බලන්ගොඩ නගරයට පැමිණි දෙය පිටත යන්න දෙන්න එපා. එම ස්ථානයේ නැතිනම් වෙනත් ස්ථානයක මෙය ස්ථාපනය කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**

ඕතන තමයි ස්ථානය. වෙනත් ස්ථාන නැහැනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වෙන ස්ථාන තිබෙනවා. අපි දැනටම අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා තැනක් දෙන්න කැමති වුණා. මේ ක්‍රීඩාංගණය ගැන මා කලින් කියන්න ඕන. මේ ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා මන්ත්‍රීවරයෙක් විදියට පත් වූ පසු මේ ක්‍රීඩාංගණය සඳහා හොඳ ක්‍රීඩාංගණයක් හදන්න එතුමා ගොඩක් මහන්සි වුණා. එය අපි අවංකවම කියන්න ඕන. මොකද අම්බලන්ගොඩ නගර සභාව මේ ස්ථානයේ කුණු දැම්ම තැන. මේ දැම්ම තැන අපි යම්කිසි කොටසක් සාදා තිබෙන කොට අපි ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාට මන්ත්‍රීවරයෙක්ව සිටින කාලයේ ගරු බැසිල් රාජපක්ෂ මහතා ලක්ෂ 20 , 20 දුන්නා. එතුමා සිටි මේ වසර 5ට එතුමාට ලැබුණු ලක්ෂ 20 ඒවා දැමුවේ ඕතනට. මා ඇත්තටම එක වරක් එතුමාට කතා කර අවවාද කළා. මේ පනියන්දුවට තිබෙන එකම ප්‍රශ්නය මේ ක්‍රීඩාංගණය නෙමේ. එමනිසා අනිත් සංවර්ධන වැඩ කටයුතු සඳහා මුදල් වෙන් කරන්න කියා. නමුත් එතුමාගේ අපේක්ෂාව තිබුණේ මේ ක්‍රීඩාංගණය සෑදීමම පමණයි. එතුමා එතරම් කැප වුණා. දැන් මට හිතා ගන්න බැහැ ඔබතුමා මෙයට දැන් විරුද්ධ වෙන්නේ ඇයි කියා. මෙහිදි මා මතක් කළ යුතුයි අපි නගරයේ යම් සැලැස්මක් කරන කොට අපට ක්‍රීඩා පිටි දියුණු කරන කොට යම්කිසි සැලැස්මකට අනුව යම්කිසි බිම් කොටස් අපට තෝරා ගන්න වෙනවා. එම තෝරා ගන්න කොට ඇත්තටම මේ ක්‍රීඩාංගණය තිබෙන සැලැස්ම දිහා බැලුවාම ඇත්තටම මේ ක්‍රීඩාංගණය තිබෙන්නේ එල් අකුරේ හැඩයට. මේ එල් අකුර හැඩයට තිබෙන අයි කොටසේ මේ ක්‍රීඩාංගණය හැදුවාට පසු යම් අක්කරයක පමණ කොටසක් අපට ඉතිරි වෙනවා. මා මගේ කාර්මික නිලධාරින්ට කිවුවා මේ ක්‍රීඩාගාරය ඉදිකිරිමට. අපට මේ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයට ලැබෙන්නේ කෝඩ් හතරකින් යුතු ලොකු ක්‍රීඩාගාරයකි. ඒ කියන්නේ දික් අඩි 200ක් 150ක් පළල විශාල ගොඩනැගිල්ලක්. එම හම්බ වෙන එක එම ක්‍රීඩාගාරය ඉදිකරන්න ස්ථානය වෙන්කරන්න. නාන තටාකයක් සඳහා ස්ථානයක් වෙන් කර ගන්න. නෙට් බෝල් සඳහා , ටෙනිස් සඳහා , බාස්කට් බෝල් සඳහා ආදි ඒ සියළුම ක්‍රීඩා සංකිර්ණයක් මෙයට යෝජනා වෙලා තිබෙනවා. ඉතිං දැනට මේ ස්ථාන වෙන්කරගෙන යන්න පුළුවන් පහසුම ස්ථානය මේකයි. මේයට ඉඩ දෙන්නේ නැතිනම් අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කිවුවා එතුමාගේ හල්වතුරේ ප්‍රදේශයේ තිබෙනවා එතුමාගේ අක්කර අසුවක ඉඩමක් . කලින් අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිකරන්න හැදුව තැන. එතන හදන්න කියා එතුමා යෝජනා කළා. ඉතිං මා මේ මගේ මේ යෝජනාව ඉවත් කර ගත්තේ මේ ක්‍රිඩකයන්ගේ සාකච්ඡාවෙන් පසුවයි. බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය එක තැනක සාදා ටෙනිස් ක්‍රීඩා ගාරය තව තැනක හදනවාට වඩා හොඳයි මේ ක්‍රීඩා සංකිර්ණයම එක තැනක තිබ්බා නම්. ක්‍රිකට් ගහන්නත් තිබෙනවා. බාස්කට් බෝල් ගහන්නත් තිබෙනවා. නෙට්බොල් ගහන එකත් තිබෙනවා. හැම එකම තිබෙනවා. අනිත් එක ළමයින්ට ක්‍රීඩාංගණය වටේ ගිහින් ව්‍යායාම කර ක්‍රීඩාගාරයට එන්න පුළුවන්. ඉතිං අපේ මේ විශාල සැලැස්මක වැඩ කොටසකි. ඒ කොටසේ එක කොටසක් තමයි මෙය. අනිත් එක අපට මෙය ලැබෙන පරිත්‍යාගයකි. මෙය නගර සභාවට සතයක්වත් වියදම් කර කරන්න ඕන දෙයක් නෙමේ. අපි නගර සභාව සතු ඉඩම දුන්නාම ඒ අය සාදා දිලා යනවා. ඉතිං එකයි වුණේ. මේ පිළිබඳව ඒ

ජනතාවටත් අවබෝධ කර දිලා කරන්න. මෙය ඇත්තටම මා වෙනත් නගරයක ගියපු එකක් තමයි අපි ඇඳලා මේ පැත්තට ගෙන තිබෙන්නේ. මෙය ගැනීම සඳහා මේ පළාත තුළ වෙනත් ආයතන තිබෙන බව මතක තියා ගන්න. එකත් කියන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මෙය කළ යුතුයි . නමුත් ප්‍රශ්න තිබෙන කොට මේ කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමා සිටිනවා. ගරු මන්ත්‍රීතුමියන්ලා සිටිනවා. මහජනතාවගේ විරෝධය පැමිණියාම ඔබතුමා හොඳ වැඩක් කර තිබෙන්නේ. සාකච්ඡා මේසයකට කැඳවන්න. ඒ අයට වැරදි අර්ථ කථනයන් තමයි තිබෙන්නේ. ඒ කියන්නේ ඒ ගොල්ලන්ට මේ සම්බන්ධව දැනීම නැහැ. ඒ අය හිතන්නේ මේ ක්‍රිකට් ක්‍රීඩාවටම විතරක් මෙය සංවර්ධනය කරනවා කියා. ඔබතුමාගේ ඔය යෝජනාව හොඳයි. නෙට් බොල් , වොලි බෝල් , ටෙනිස් වගේ ඒ මේවා එක හොඳයි. එමනිසා එය දන්නේ නැහැ. මා හිතන්නේ මෙතුමාගේ ඡන්ද දායකයින් ගොඩක් ඉන්නවා එතන. ඒ වගේම මෙතුමත් ඉන්නවා. මා හිතන්නේ සැහැල්ලු පන්දු ක්‍රීඩාව තමයි ජනප්‍රියම පනියන්දුවේ. එම නිසා මෙතුමාගේ ගරුත්වයත් ආරක්ෂා වන විදියට ඔබතුමා සාකච්ඡා කරන්න.  අපේ කිසි ගැටළුවක් නැහැ. ඒ මහජනතාවගේ සහායෝගය ගෙන කරන්න.

**තීරණය -**

ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් මානාන ක්‍රීඩාංගනයේ කොටසක ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ලබන මස සභාවට කල් තැබීමට ගරු සභාපතිතුමා තීරණය කරන ලදී.

- පෙරවරු 10.00 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

### 05.02 ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

**05.01.01 ගා/ පි  ද එස් කුලරත්න විද්‍යාලයේ 1 ශ්‍රේණියට පන්තියක් සක්‍රිය කිරිමට ගත් තීරණයට ගරු ආණ්ඩුකාරතුමාට අම්බලන්ගොඩ නගර සභාවේ ස්තුතිය පුදකිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගා/ පි  ද එස් කුලරත්න විද්‍යාලයේ 1 ශ්‍රේණියට පන්තියක් ආරම්භ කිරිමට ගත් තීරණයට ගරු ආණ්ඩුකාරතුමාට අම්බලන්ගොඩ නගර සභාවේ ස්තුතිය පුදකිරිම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

වසර ගණනක් සාකච්ඡා කරලා සිද්ධ වුණු සිද්ධියකි. අම්බලන්ගොඩ නගරයේ අර ඉස්සෙල්ලා ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කිවු ආකාරයට නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා එවා තිබු ලිපිය අම්බලන්ගොඩ නගරයේ දරුවන් 700ක් පමණ බඳවා ගන්න පුළුවන් කියා. වසරේ ජනවාරි මාසයේ පෙබරවාරි මාසය වන විට ළමුන් 700ක් 750ක් ඇතුළත් කර ගන්න පුළුවන් නගරයේ ඒ වෙනකොට ඉපදෙන ළමුන් 350 ගන්න බැරි තත්ත්වයක් තමයි ඇති වෙන්නේ. අපි මේ වසරේ ඉතා අමාරු අසිරුතාවයකට පත් වුණා. ප්‍රදේශයේ කොට්ඨාශය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු වශයෙන් මාත් , ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා , ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා. විශේෂයෙන් පොල්වත්ත කොට්ඨාශයේ ළමුන් 10කු අයත් වුණේ නැහැ. කුලරත්න විද්‍යාලයට. ඉතිං එම නිසා කෙරමිණිය 8කු ඕකන්ද ප්‍රදේශයේ 3කු, පෝරඹ 2කු , පෝරඹ කොට්ඨාශය පාසැල පිහිටි ප්‍රදේශය. ඒ වගේ තල්ගස්ගොඩ ළමුන් 20කු ඇතුළත් වුණා. 12ක් එළියේ. අන්න ඒ වගේ තත්ත්වයක් උඩ අපට සිද්ධ වුණා 48කු පමණ. හැමදාම නිවෙස් වලට එනවා. එමනිසා අපට සිද්ධ වුණා අධ්‍යාපන ලේකම්තුමා මුණ ගැසෙන්න. මුණ ගැසුනාම එතුමා ප්‍රකාශ කළා මට මෙය කරන්න බැහැ. ගරු ආණ්ඩුකාරතුමාගෙන් නිර්දේශයක් එනවා නම් එය අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් කියා. එහෙම කිවුවාම අපි ඒ වේලාවේම ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසුනා. ගරු ආණ්ඩුකාරතුමාට විස්තරය පැහැදිලි කර දුන්නා. ඒ අනුව අපි ඉදිරිපත් කළා සම්බන්ධිකරණ රැස්වීමේ ගත් තීරණය. ගරු විපක්ෂනායකතුමා ඒ ගැන කරුණු පැහැදිලි කර තිබුණා. එතුමා එය පැහැදිලිව තීරණය කළා. මේ පන්තිය ආරම්භ කරන්න ඕන කියා. මොකද 1986 විද්‍යාලය ආරම්භ කරන කොට තිබුණ පන්තිය තමයි නැති කර තිබුණේ. එය නැවත ආරම්භ කරන්න එතුමා තින්දුව දුන්නා. ඒ අනුව පසුව මේ මෑතකදි මේ පන්තිය ආරම්භ කළා. එමනිසා සියළුම නගරයේ ළමුන්ට කුලරත්න විද්‍යාලයට ඇතුළත් වීමට හැකියාව ඇතිවුණා. එමනිසා අපි අපේ ගෞරවය , අපේ ස්තුතිය ගෞරවණිය ස්තුතිය අපේ ගරු ආණ්ඩුකාරතුමාට පුද කළ යුතුයි. අද එතුමා එම තීරණය ගත්තේ නැතිනම් අද නගරයේ පාලකයෝ වශයෙන් තවමත් අපිට ලොකු ගැටළුවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ වගේම කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමාත් මෙයට දැඩි උනාන්දුවක් ගත්තා. දැඩි මහන්සි වුණා. මොකද අපි ගත්ත තීරණය ක්‍රියාත්මක කිරිමේදි එතුමාට ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්න සිද්ධ වුණා. කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා මේ සභාව නියෝජනය කර ගරු මන්ත්‍රීවරයෙකි. අම්බලන්ගොඩ නගරයේ පාලනය කරන්න පත්වෙලා තිබුණ ගරු මන්ත්‍රීවරයෙක් තමයි විදුහල්පති වශයෙන් පත්වෙලා තිබෙන්නේ. එතුමාට දැඩි උනාන්දුවක් තිබෙනවා නගරයේ ළමුන් වෙනුවෙනි.යම්කිසි තීරණයක් ගන්න නිසා. එතුමාටත් අපේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදි පුද කරනවා.අපේ නගරයේ පාලකයෝ වශයෙන් අපගේ වගකීමක් හා යුතුකමක් වෙනවා. නගරයේ අනාගතය භාර ගන්න සිටින දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් යම්කිසි තීරණයක් ගන්න. එකයි එදා අපට ඒ ගියවර ඒ ගමන යන්න සිදු වුණේ. මා හිතන්නේ ගරු සභාපතිතුමා එදා හිටියේ නැහැ. නමුත් ගරු සභාපතිතුමා හා ඒ සියළු දෙනාගේම සහායෝගය නිසා තමයි සම්බන්ධිකරණ කමිටුව ගත් තීරණය හරහා තමයි මේ පන්තිය වැඩි කිරිමට හැකි වුණේ. විශේෂයෙන්ම මෑත වකවනුවේ ධර්මාශෝක විද්‍යාලයට ළමයින් ඇතුළත් කිරිම නිසා තමයි අපි විශාල අර්බුදයකට ලක් වුණේ. එම නිසා එම කාරණය නිසාම ගිහිල්ලා තමයි මේ

කටයුත්ත කරගන්න පුළුවන් වුණේ. මා සමඟ සහභාගි වු ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා , ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා යන ඒ සියළු දෙනාටම ස්තුතිය පුද කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමනි, මා ඇත්තටම දන්නේ නැහැ. මාගේ ගමේත් හිටියා . මා දන්නවා නම් සහභාගි වෙනවා. මගේ ගමේත් දෙදෙනෙක් විතර හසුවි හිටියේ නැහැ. ලකුණු මදිවෙලා. ඔප්පු සම්බන්ධව. ගරු ආණ්ඩුකාරතුමාටත් , මේ සඳහා සහභාගි වු ගරු මන්ත්‍රීවරුන්ටත් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් ස්තුතිවන්ත වෙනවා. අම්බලන්ගොඩ කුලරත්න විද්‍යාලයට දෙන්න පුළුවන් උපරිම පහසුකම් දිලා ප්‍රධාන පහසුකමක් දිලා දියුණු කළ යුතුයි. මේ පන්තියක් වැඩි කිරිම සම්බන්ධව විශේෂයෙන් ගරු ආණ්ඩුකාරතුමාට විශේෂ ස්තුතිය පුද කරනවා. ගරු විදුහල්පතිතුමාටත් මේ සම්බන්ධව කටයුතු කිරිම සම්බන්ධව විශේෂයෙන් ස්තුතිය පුද කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපේ ගරු උප සභාපතිතුමා ගෙන ආ යෝජනාව කතා නොකරම බැරි යෝජනාවකි. 2002 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභාවේ ඔබතුමාගේ නායකත්වයෙන් කුලරත්න විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා නියෝජනය කළේ. එතුමා පසුගිය දිනවල දැඩි අපහසුතාවයකට පත්වෙලා තිබුණා. ළමයින් 48කු නොතෙරිම සම්බන්ධව. මොකද සුනාමි අවස්ථාව තුළ විශාල වශයෙන් ජනතාව ගියේ තල්ගස්ගොඩ ප්‍රදේශයට. ගොඩහේන ප්‍රදේශයට. ඒ පැත්තෙන් වැඩිපුර ළමයින්ගේ අයදුම්පත් පැමිණි නිසා ඒ පැත්තට ලකුණු 100න් 100ම යනවා ගොඩහේනට. මොකද ජනප්‍රිය පාසැල් වලට මෙහේ කැපෙන කොට ගොඩහේනට සියයට සියයයි. සියයට 90% ගණන් යනවා තල්ගස්ගොඩ ප්‍රදේශ වලට. එමනිසා දැඩි අපහසුතාවයකට පත්වුණා එහේ ළමයින් වැඩිපුර යනකොට. පෝරඹ, පොල්වත්ත,ඕකන්ද, කෙරමිණිය, පින්නදූව, පනියන්දූව ආදි ප්‍රදේශවලට දරුවන්ට පාසලැක් නොමැති වීම. මොකද එදා ඔබතුමා එදින මෙහෙන් කොහේද ගිහින් හිටියේ. ඒක නිසා අපටත් කතා කළා විදුහල්පතිතුමා. ගරු උප සභාපතිතුමා, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා , ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා සහභාගි වුණා. ඔබතුමා එදා කතරගම ගිහින් හිටියේ. විදුහල්පතිතුමා කතා කළා කිවුවා. ක්ෂණිකව රැස්වීමක් කැඳවා තිබුණා පාසැලේ. දෙමාපියන් සියළු දෙනා සහභාගි වෙලා හිටියා ළමයින් ගත්තේ නැති කට්ටිය. එමනිසා අපට ඉදිරිපත් කළා දිර්ඝ විස්තරයක්. එතුමා ප්‍රකාශ කළේ මේ ළමයින් ගන්න නම් මේ තිබුණ පන්තිය වැඩි කරන්න ඕන කියා. මේ පන්තිය ලබා ගන්න ඕන කියා. ඒ ලබා ගැනීම තුළ තමයි මේ ප්‍රශ්නය විසඳන්න තිබෙන්නේ. එතකොට අපේ ගරු උප සභාපතිතුමාත් එකඟ වෙලා අපි මෙය වැඩි කරගන්න ක්‍රමවේදය සාදා ගත යුතුයි. එතකොට අපි බැලුවා. අපි ස්තුතිවන්ත විය යුතුයි. හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා සම්බන්ධිකරණ කමිටුවක අපේ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා සහභාගි වු සම සභාපතිත්වයෙන් තිබුණ කමිටුවක ගත් තින්දුවක් අපට ලැබුණා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අපි ඒක ගත්තා. එහි තිබෙනවා මේ පන්තිය වැඩි කරන්න ඕන කියා. එය පිළිගෙන තිබෙනවා කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමියත්. එය පිළිගත් නිසා එය ඉතාමත් වැදගත් ලිපි ගොනුවක් වුණා. අපි හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ස්තුතිවන්ත විය යුතුයි. ඒ වේලාවේම ගරු උප සභාපතිතුමා කිවුවා අපි යන්න කියා. අපි ගියා ලේකම්තුමා මුණ ගැසෙන්න.

ලේකම්තුමා මෙය බලා කිවුවා මට තීන්දුවක් ගන්න ආමාරුයි. ඒක නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් ගන්න කියා. ඇත්තටම අපි නොසිතූ ආකාරයෙන් එතුමා අපි පිළිගෙන අවශ්‍යතාවයට අරගත්තාට පසු අර ලිපි ගොනු ටික දුන්නාට පසු මුකුත් කතා කළේ නැහැ. කියවලා බැලුවා. බලා නියෝගය ලබා දුන්නා. එයට අපි නගර සභාවේ අපි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු අප සියළු දෙනාගේම ස්තුතිය පුද කරන්න ඕන. එතුමාට ලිපියකින් හරි දැනුම් දෙන්න මේ සම්බන්ධව. නැතිනම් මෙය විශාල ප්‍රශ්නයක් වෙලා තිබුණේ. දැනට එම ප්‍රශ්නය විසඳුණා. අන්න ඒ විදුහල්පතිතුමාගේ දැනුවත් කිරීම තුළ අප එම කාර්ය ඉටු කළා. අපේ නගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ මූලිකත්වය තුළ. මෙය තමයි විය යුත්තේ. මොකද අතිගරු ජනාධිපතිතුමාගේ අදහසත් ඕක තමයි. මහජනතාවට සේවය කිරීම. මහජනතාවට ඒ අවශ්‍ය ඒ සියළු දේ ඒ අවශ්‍ය දේ ලබා දීමින් එක තමයි ක්‍රමවේදය. විශේෂයෙන්ම කියනවා මේ පන්තිය වැඩි කිරීම පිළිබඳව අපේ සියළු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිය විදුහල්පතිතුමාටත් ලිඛිතව දැනුම් දීලා එම කටයුත්ත කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූව මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම කුලරත්න විද්‍යාලයේ ඇත්තටම ඕක තිබුණ පන්තියක්. තිබුණ පන්තියක් තමයි නතර කර තිබුණේ. මේ සම්බන්ධව 2017 වර්ෂයේ සංවර්ධන කමිටුවේ ඉල්ලීමක් තිබ්බා. ඊට පසුව 2018 වර්ෂයේ මාගේ මතකයේ හැටියට මමත් ගරු හිටපු ප්‍රධාන අමාත්‍යතුමාත් හිටපු අපි දෙන්නා සම සභාපතිත්වයෙන් කරුණු පිළිබඳව විග්‍රහ කරලා එවකට හිටිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමිය කිවුවේ අලුතින් දෙන්න දෙයක් නැහැ. තිබුණ පන්තිය විදුහල්පතිතුමාට ආරම්භ කරන්න පුළුවන්. නමුත් ගැටළුවක් තිබුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට උවමනාව තිබුණත් විෂයභාර අමාත්‍යවරයා විසින් මෙයට අනුමැතිය දුන්නේ නැහැ. එතකොට ඒ කරුණ තුළ මේ සංවර්ධන කමිටුවේ තීරණයත් එතකොට මේ අපේ ගරු උප සභාපතිතුමා ඇතුළු අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් ගරු ආණ්ඩුකාරතුමා මේ ගත් තීන්දුව ඇත්තටම අගය කළ යුතුයි. මොකද කලින් හිටිය විෂයභාර අමාත්‍යවරයාට මෙය දෙන්න තිබ්යදිත් එතුමා මෙය දුන්නේ නැහැ. කුමන හෝ දේශපාලන පක්ෂයක් මත. කුලරත්න විද්‍යාලයේ පන්තියක් වැඩි කිරීම තුළින් විශේෂයෙන්ම පෝරඹ , කළුවඩුමුල්ල, පොල්වත්ත, ළමයින් ගණනාවකට එම අවකාශ ලැබුණා. ළමයින් 40කට විතර නව පන්තියකට ඇතුළත් වෙන්න. එමනිසා ඒ සම්බන්ධව ක්‍රියාකළ සියළු දෙනාටමත් විශේෂයෙන්ම අපි කොච්චර ඉල්ලා තිබුණත් එවකට සිටි පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා මෙයට අවසර දුන්නේ නැහැ. ඒ පසුබිම තුළ මෙය ලබා දුන්නු ගරු ආණ්ඩුකාරතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත විය යුතුයි. ඒ සම්බන්ධව අපේ ගරු උප සභාපතිතුමා කිවු පරිදි ඔබතුමා අපේ ස්තුතිය ප්‍රකාශ කර යවන්න. ඒ වගේම මේ පිළිබඳව මේ ඇහයිම කරන ලද ගරු උප සභාපතිතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වටිනා යෝජනාවක් ඉදිරිපත් කළ ගරු උප සභාපතිතුමණි ඔබතුමාට ස්තුතිය පුද කරනවා. පලමුවෙන්ම මා කතා කළ යුතුයි ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කිවු පරිදි අපිටත් හරි වදයක් වෙලා තිබුණා ඕකන්දේ ළමයින් පාසැල් වලට දමන එක. එය ඉතාමත්ම උග්‍ර ප්‍රශ්නයකි. හැමදාම ළමයින් දාන්න ඕන උනාම ඉදිරිපත් වෙනවා. මේ මගේ පුතාගේ දරුවා

පාසලට දමන්න අවශ්‍ය වූ විට ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ගරු නගර සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් නිසා විදුහල්පතිතුමාට කතා කරලා තමයි ළමයා දැම්මේ. විශේෂයෙන්ම ගරු ආණ්ඩුකාරතුමා එම කටයුත්ත කළ නිසා හොඳයි. නැතිනම් අම්බලන්ගොඩ ප්‍රදේශයේ දරුවන් මේ පාසැල් වලට හසුනොවෙන්න හැම වේලෙම පසුබෑමකට ලක්වෙනවා. දැන් අපි සතුටු විය යුතුයි දැන් සිටින ගරු ආණ්ඩුකාරතුමා අප සභාවෙන් ඉල්ලීමක් කළාම සංවර්ධන කමිටුවෙන් ගරු හිටපු ප්‍රධාන අමාත්‍යතුමා ෂාන් විජය ලාල් සිල්වා මැතිතුමා ගත් බුද්ධිමත් තීරණය ක්‍රියාත්මක නොවුණා නම් ඒ කියන්නේ ඕන නම් එතුමාටත් නොකර ඉන්නත් තිබුණා. නමුත් එය කර අපට ප්‍රතිඵලයක් ලබා දිමට වැයමක් කිරිම සම්බන්ධව අපේ ඕකන්ද ගම්වාසින් සියළු දෙනා වෙනුවෙන් මා විශේෂ ස්තුතිය පුද කරනවා. කොට්ඨාශ ගරු මන්ත්‍රීවරිය වශයෙන්. අපි නැවත නැවතත් එතුමාට ස්තුතිය පුද කර ලිපියක් යවන්න. එතුමාට සහ සම්බන්ධිකරණ කමිටුව නියෝජනය කළ සියළුදෙනාටත් ගරු විදුහල්පතිතුමටත් ස්තුතිය පුද කර ලිපියක් යවන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමාට ස්තුතිය පුද කළ යුතු යයි කතා කිරිමේදි කුලරත්න විද්‍යාලය සම්බන්ධව තමයි මේ යෝජනාව තිබෙන්නේ. ඒ කුලරත්න විද්‍යාලයේ නව පන්තියක් එක් කිරිම සම්බන්ධව. අපි ඉතාමත්ම සංතෝෂ වෙනවා. නගර වැසියන් විදියට , ගරු මන්ත්‍රීවරුන් විදියට. එවැනි දෙයක් කිරිම පිළිබඳව නගරයේ ජනතාවට. විශේෂයෙන්ම ගරු උප සභාපතිතුමා ඇතුළු ඒ ගරු මන්ත්‍රී කණ්ඩායම යම්කිසි උත්සාහයක් දරා ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසි මහත් පරිශ්‍රයකින් අවසානයට ගෙනා ආ යෝජනාව ක්‍රියාත්මක තත්ත්වයට පත් නොවු තිබුණ නිසා මේකියන කාරණය අනුව ක්‍රියාත්මක කිරිමට හැකිවිම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ගරු ආණ්ඩුකාරතුමාට ස්තුතිවන්ත විය යුතුයි විශේෂයෙන්ම අප කල්පනා කළ යුතුයි අපේ ගරු අම්බල්නගොඩ ප්‍රදේශයේ සිටි ගරු පාර්ලිමේන්තු මන්ත්රි අනගාරික රයිටර් තිලකසේකර මහතා ඉතිහාසයේ එක්තරා දිනයක ඔය කුලරත්න විද්‍යාලය ආරම්භ කරන කොට එතුමා ගම නගරය ගැන දේශපාලඥයෙක් විදියට ගම නගරය ගැන හිතපු විදිය. එතකොට එතුමාගේ සංකල්පය අනුව තමයි මේ නගරය 2020 වන විට මේ මට්ටමේ තියෙවි කියන එක. එතකොට අද ළමයින් 3000ක 4000ක ප්‍රමාණයක් අද කුලරත්න විද්‍යාලයට යනවා. ඒ ළමයින් 4000 කට පාසැලක් නිර්මාණය කිරිම විශාල කටයුත්තකි. අර එදා ඒ දේශපාලනඥයන්ගේ දැක්ම අපට පන්තියක් වැඩි කර ගැනිමට නොහැකි තත්ත්වයක අද සිටිනවා. ධර්මාශෝකයට අද ළමයෙක් දමා ගැනීමට නොහැකි තත්ත්වයක අද අප සිටිනවා. එම කැක්කුම තිබෙන්නේ එම තදසාන්න ප්‍රදේශවල සිටින දෙමාපියන්ට. විශේෂයෙන්ම ධර්මාශෝකය අහිමි විම තුළ දේවානන්ද විද්‍යාලය අහිමි විම තුළ ඔවුන් තුන්වෙනුව කුලරත්න විද්‍යාලය තෝරා ගන්නවා. සමහර වේලාවට දෙවනුවත් කුලරත්න විද්‍යාලය තෝරා ගන්නවා. ඒ අයට විශාල සහනයක් වෙනවා ඒ අයට විශාල රුකුලක් වෙනවා. මොකද මේ ජාතික චක්‍රලේඛයට අනුව පෝරඹ , කළුවඩුමුල්ල, පොල්වත්ත , තල්ගස්ගොඩ මේ ප්‍රදේශවල ජනතාවට විශාල අසාධාරණයක් වෙලා තිබෙනවා. ඉතිං එම අසාධාරණය යම්තම් හරි මැකිලා එම ප්‍රදේශවල දරුවන්ට යාමට තිබෙන අවස්ථාව ඉඩ ප්‍රස්ථාව වැඩිවිම සම්බන්ධව මෙහි සුවිශේෂිත්වයක් තිබෙනවා. එමනිසා විශේෂයෙන්ම ගරු ආණ්ඩුකාරතුමා විදියට නව ආණ්ඩුකාරතුමන්ගේ නව

දැක්මට අප ගරු කළ යුතුව තිබෙනවා. විශේෂ ස්තුතියක් එතුමා වෙනුවෙන් අම්බලන්ගොඩ නගරයේ ජනතාව වෙනුවෙන් පුද කළ යුතු යයි මා ඉල්ලා සිටිනවා. එම යෝජනාවේ ලිඛිතව යවන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ අවස්ථාවේ මගේත් ස්තුතිය පුද කරනවා. අපේ ගරු ආණ්ඩුකාරතුමාට. මොකද හැම අවුරුද්දේම මේ කාලය වන විට ගෙදර ඉන්න බැරි කාලයක්. මොකද අපේ පාසැල් වලට 700 ක් ගන්නවා කිවුවත් අපි දන්නවා අපේ නගරයේ සිටින හුඟ දෙනෙකුගේ දරුවන් මේ පාසැල් වලට ඇතුළත් වෙන්නේ නැහැ. එයට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ හොර සහතික මඟින් ළමයින් ඇතුළත් වීමට කරන ව්‍යායාම තුලින් අපේ සිටින නියම ගම්වැසියන්ගේ දරුවන් ඉවත් වෙනවා. එම තත්ත්වය මග හරවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා ඉතාමත්ම බුද්ධිමත්ව ප්‍රදේශයට අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඒ අවශ්‍ය අනුමැතිය ලබා දීම සම්බන්ධව අපේත් මේ අවස්ථාවේදි ස්තුතිය පුද කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලයේ 6වෙනි ශ්‍රේණියට ඇතුළත් විම සඳහා සුදුසුකම් තිබෙනවා. එක ළමයෙක්වත් අරගෙන නැහැ කුලරත්න විද්‍යාලයට. ඔය කියන පන්තියට. මෙතැන ලොකුවට කතා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පලවෙනි ශ්‍රේණිය ගැන කතා කරන්නේ. එකත් මා කියන්නම් ගරු මන්ත්‍රීතුමා. දැන් කලින් බුද්ධදත්ත විද්‍යාලය ආරම්භ වන විට කතා වුණේ කුලරත්න විද්‍යාලයට පිරිමි ළමුන් දමන්නත්, ගැහුණු ළමුන් ප්‍රජාපති විද්‍යාලයට දැම්මට කියන පරමාර්ථය උඩ. එම පරමාර්ථය උඩ ගන්න කොට බොහොම ජනප්‍රියම පාසැල බවට පත්වුණා පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය. මුදල් වලට ළමුන් ඇතුළත් කර ගැනීමේ මධ්‍යස්ථානයක් බවට පත්වුණා. දැන් සිටින විදුහල්පතිතුමා නෙමේ ඊට කලින් සිටින විදුහල්පතිතුමා. මට හොඳට මතකයි කළුවඩුමුල්ල ප්‍රදේශයේ සිටින වඩුකාර්මිකයෙකුගේ දරුවෙකු දමන්න එම විදුහල්පතිතුමා රුපියල් 30000/= ක මුදලක් ඉල්ලුවා. ඒ ළමයා තමයි අර ළඟම පාසලට දමා ගත්තේ . මොකද ඒ ළමයාට අයදුම්පත් දමා තිබුණේ ධර්මාශෝක විද්‍යාලයට පමණයි. ධර්මාශෝකේ නෙට්බෝල් කණ්ඩායමේ පහල වයස් කණ්ඩයේ සිට වයස අවුරුදු 19න් පහළ වෙනකම් කණ්ඩායම් නායක තනතුර කරලා ඒ වෙනකොට කොච් කරපු කෙනාගේ දරුවා තමයි ගත්තේ නැත්තේ. ඒ වෙනකොට වෙනත් පාසැලකට අයදුම්පත් දමා තිබුණේ නැහැ. මා කිවුවා මේ ළමයා අපේ ගමේ ළමයෙක් කළුවඩුමුල්ලේ මේ ළමයා ඇතුල් කර ගන්න කියා. ඇතුල් කර ගන්න කියා ගියාම විදුහල්පතිතුමා හා එවන්න . මා ගන්නම් කියා කිවුවා. ඇතුල් කර ගන්න ගියාම රු.30000/= දෙන්න කිවුවා. ඒ මනුස්සයා මට නැවත පැමිණ කිවුවා මහත්මයාණෙනි මා දන්නවා එම මහතා රු.30000/= ගන්නවා කියා. ඔබතුමා ළඟට පැමිණියේ මේ රු.30000/= නැති නිසා කිවුවා. මට ඇත්තටම කනගාටු හිතුණා. එතකොට කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමාට මා කිවුවා ඔබතුමාගේ ප්‍ර දේශයේ සිටින කෙනෙකුට මෙහෙම

ප්‍රශ්නයක් වෙලා . එවන්න ඔය ළමයා මා ගන්නම් කිව්වා. එතුමා එම ළමයා ගත්තා. ඔය තින්දුව පරිදි ළමයින් ගැනිම නිසාම කුලරත්න විද්‍යාලයට ළමුන් ඇතුලත් කර ගැනීමට බුද්ධදත්ත විදුහලේ විදුහල්පතිතුමා මෙය පුරවන නිසා කුලරත්න විද්‍යාලය තින්දු කළා බුද්ධදත්ත විද්‍යාලයෙන් එන කට්ටිය අපි ඇතුල් කරන්නේ නැහැ කියා. ඕක තමයි ඇත්ත තත්ත්වය.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා, ඔය බුද්ධදත්තේට ඇතුල් වෙන්නේ අම්බලන්ගොඩ ළමයි නෙමේද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා කිව්වේ . ඔබතුමා දැන් ගිහින් බලන්න . එක පොල්වත්තේ ළමයෙක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

අපි ඡන්දය ගන්න කොට කියනවා. හරි කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය බුද්ධදත්ත විද්‍යාලයේ ළමයින් 5කු සිටිනවා කියා මා හිතන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

අනිත් එක දැන් වර්තමාන විදුහල්පතිවරයා එහෙම පගාව ගන්නේ නැහැ කියා මට සහතික වෙන්න පුළුවන්. මොකද මට සහතික වෙන්න පුළුවන්. මා හොඳට දන්න කෙනෙක්.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා වරදක් වෙන නිසා තමයි කිව්වේ දැන් ඉන්න කෙනා නෙමේ ඉස්සර හිටිය විදුහල්පතිතුමා කියා කිව්වේ එකයි. ඔන්න එක තමයි බුද්ධදත්ත විද්‍යාලයෙන් කුලරත්න විද්‍යාලයට ළමුන් ඇතුළත් කර ගැනිමට තිබුණ ලොකුම බාධකය. ළමුන් මුදල් අරගෙන ගත්තා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

දැන් මේ වසරේ 98ක් පස්වෙනි ශ්‍රේණියෙන් පිටවෙලා තිබෙනවා. 6 ශ්‍රේණියට සුදුසුකම් ලබා තිබෙනවා.ඉතිං ඒ අය අපේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුව කළුවඩුමුල්ල පාසලට දැම්මා. ඒ අයගෙන් 72කු බටපොලට යනවා.19 ගාමිණියට යනවා. 7කු ශිෂ්‍යත්වය පාස්වෙලා තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉතිං 72 බටපොළට යන්න ඔබතුමාම කල්පනා කර බලන්න.72 ඉන්නේ අම්බලන්ගොඩ වටපිටේ සිටින ජනතාව නෙමේ. ආපහු ගිහින් ගමට දමනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

එතකොට පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ප්‍රාථමිකයක් කරන කෙට පොරොන්දුව තමයි කුලරත්න එම ළමයින් ගන්නවා කියන එක. අපි කියමු කුලරත්නයට දාමා ගැනිමේ බලාපොරෝත්තුවෙන් එම ළමයින් මෙතැනට ආවා කියා. එක්කෙනෙකුවත් ගන්න සුදුසු නැද්ද? කුලරත්නයට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක පාසැලෙන් ගත් තින්දුවක්. අපි ගත්ත එකක් නෙමේ. ඔබතුමාට අවස්ථාව තිබෙනවා මෙතැන නෙමේ . අපේ සම්බන්ධිකරණ රැස්විම වගේ කතා කරලා එය නැවත ඇති කර ගැනිම සඳහා නැවත යෝජනාවක් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මෙතැන කුලරත්න විද්‍යාලයට යන්න සුදුසු නැද්ද? මා අහන්නේ එකයි. මේවා වැරදියි. මේ ස්තුති කිරිම් වලට නම් මා එකඟ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා එකඟ නැති වෙන්න පුළුවන්. නමුත් මුදල් වලට ළමයින් ඇතුළත් කර ගත්ත අයට යම්කිසි දෙයක් දිය යුතුයි. පොල්වත්තේ දමා තිබෙන්නේ. ඔබතුමා ඔච්චර කතා කරන්නේ. විදුහල්පතිතුමා හොඳ වැඩක් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

කොහොම වුණත් මේ 98නාගෙන් එක්කෙනෙකුවත් නොගැනිම ගැන මාගේ විරෝධතාවය මෙතනදි මා දක්වනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනාවට විරුද්ධව කවුරුහරි ඉන්නවාද? ඒකමතිකව සම්මතයි. එම යෝජනාව යවන්න.

තීරණය

06 කාරක සභා වාර්තා

**06.01 2020.02.05 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.02.05 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.02.05 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය

**06.02  2020.02.18 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.02.18 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.02.18 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.03  2020.02.28 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.02.28 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් කමිටුවේ පොඩි දෙයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.13 පෙර පාසැල් ළමුන්ගේ ටී ෂර්ට් මැසීම සඳහා ගුණාත්මක තත්ත්වයේ අමුද්‍රව්‍ය කියන එක.පෙර පාසැල් ළමුන්ගේ ටීෂර්ට් සම්බන්ධව. එහිදී ගරු සභාපතිතුමනි, ටෙන්ඩර් මිළ ගණන් 03ක් ඉදිරිපත්වෙලා තිබුණා. රෙදි සාම්පල් සමඟ. එතකොට මේ 555 ට ඉදිරිපත් කර තිබුණ රෙදි සාම්පලය තමයි ගුණාත්මක එක. එයට සාමාන්තරව තිබුණේ මේ 440ට ඉදිරිපත් කරන ලද එක. ඒ රෙදිවල ගුණාත්මකභාවය නිසා තමයි අපි මේ 440 ගන්න කියා නිර්දේශ කළේ. 275ටත් තිබෙද්දි.275ට 325ට තිබේද්දි. ඒ රෙදිවල ගුණාත්මකභාවය අඩුයි. ඇඳගෙන ඉන්න බැහැ. පොඩි දරුවන්ට. දාහඩිය දමනවා. අර තත්ත්වයෙන් අඩු ඒවා. මේ 575,440 අතර තමයි මේ හොඳ රෙද්ද තිබුණේ. එතකොට ඒ දෙකෙනුත් අඩුම එක 440 නිසා තමයි මේ ටෙන්ඩර් කමිටුව පිළිගත්තේ. මොකද යම්කිසි දිනයක මොකක් හරි අවොත් මේ සභාව දැනුවත් කර තිබ්බේ එකයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>

රෙදි වර්ග 2ක් එවා තිබුණා. ඒ අර

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඉතිං හරි ටෙන්ඩර් කමිටුව වශයෙන් මෙයට සහභාගිවෙලා තිබෙනවා. ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රි ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා , ගරු නගර සභා මන්ත්‍රි සෝභිත රංජිත් මහතා . ඔබතුමලා ගත්ත තීන්දුවට අපි එකඟයි. ප්‍රශ්නයක් නැහැ.

**තීරණය**

2020.02.28 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.04 2020.02.24 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2020.02.24 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය  කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.02.24 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.05 2020.02.25 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය සමග ඒකාබද්ධව පවත්වනු ලබන  කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.02.25 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය සමග ඒකාබද්ධව පවත්වනු ලබන  කමිටුවේ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ වෙළඳ සංගමය සමඟ පැවති සාකච්ඡාවේ මෙහි තිබෙන සමස්ත නගරයටම ආවරණය වන පරිදි කැමරා පද්ධතියක් අපි සම්ස්ත වෙළඳ සංගමය සමඟ එකතුවෙලා අපි සවි කරනු ලබනවා. ඒ අනුව අම්බලන්ගොඩ නගරය තුළ තිබෙන සමස්ත සියළුම ආයතන, හන්දිවල තිබෙන ඕනෑම කෙනෙක් ප්‍රදර්ශනය වන පරිදි කැමරා සවි කරලා එම කැමරා නිරික්ෂණය කිරිම අම්බලන්ගොඩ පොලිසියටත් , අම්බලන්ගොඩ නගර සභාවේ බස්නැවතුම්පොළ ඉදිරිපිට උඩ තිබෙන මුරපොළටත් සවිකිරිමට බලාපොරෝත්තු වෙනවා. ඒ සඳහා යම් වියදමක් දැරිම සඳහා අපිත් එකඟ වුණා. මා විසින් සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. අම්බලන්ගොඩ පොලිසියේ සවිකරන ඒ පද්ධති සඳහා යන වියදමත්, බස්නැවතුම්පොළ සඳහා යන වියදමත් ඒ සඳහා ටෙලිකොම් ආයතනයට ගෙවිය යුතු මුදලත් සභාවෙන් දැරිය යුතු යයි මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා   කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන්ද කරන්නේ. නැතිනම් පිටස්තරින්ද කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා  කතා කරමින්</u>**

සම්පූර්ණ දත්ත එගොල්ලන්ද දමන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා  කතා කරමින්</u>**

අම්බලන්ගොඩ විවිධ ප්‍රජාව කොයි වගේ දායකත්වයක් දරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සඳහා වියදම ලක්ෂ 47ක් යනවා. අපට ඕනනම් දරන්න වෙන්නේ ලක්ෂ 7ක 8ක මුදලක් තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා  කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළ ඇතුලේත් කැමරා 4ක් සවිකරන්න ඔනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්. ඊටත් වඩා වැඩිවෙන්න පුළුවන්. බස්නැවතුම්පොළ ඇතුළෙත් කැමරා පද්ධතියක් වෙනම සවිකරන්න ඕන. එකට වියදම අපි දරන්නම් කිවුවා. එයට එකඟ වුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා  කතා කරමින්</u>**

එතන ඇවිත් දවස ගානේ ළමයින්ගෙන් මුදල් ගන්නවා. වෙනම සෙට් එකක් ඉන්නවා. පොඩි ළමයින්ගෙන් මුදල් ගන්න. අනිවාර්යෙන්ම බස්නැවතුම්පොළ ඇතුළේ සවිකළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේවා සියල්ලෙම නායකත්වය පොලිසියෙන් පොරොන්දු වුණා. පැය 24ම නගරය දිහා බලාගෙන සිටින්න. ඒ වගේම නගරයේ යම්කිසි හොරකමක් හරි යම්කිසි නිති විරෝධි කටයුත්තක් වෙනවා නම් වෙන්න ඉස්සරවෙලා ඒය වලක්වා ලිම සඳහා යම්කිසි වැඩ කොටසක් ඉෂ්ඨ කරලිම සඳහා. එමනිසා මා සභාවෙන් ඉල්ලා සිටින්නේ මුලික වියදම පොලිසියට සවි කිරිමටත් නගර සභාවේ මුරපොළේ සවිකරන පද්ධතියත් සභවෙන් දැරිමට එකඟත්වය පළ කිරිම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එය එවන්න කියන්න. එච්චර මුදලක් යන්නේ නැහැ. මොකද ඔය විෂය මාත් කරනවා. එච්චර මුදලක් යන්නේ නැහැ. ඔය අන්තර්ජාලය හරහා පොලිසියට විස්තර ටික ගනිවි. අපට ඕනනම් ඔබතුමාටත් ගතහැකි. තව කාටහරි ඕනනම් ගන්න පුළුවන්. ඉතිං ඕකට එච්චර ලොකු මුදලක් යන්නේ නැහැ. අපිට තිබෙන්නේ පොලිසියට දෙන තීරයත් සමඟ ඒ තිබෙන ඩී.බී.ආර් එකත් පමණයි. වාර්ෂිකව අපට මුදලක් ගෙවන්න වෙනවා අන්තර්ජාලය පාවිච්චි කිරිම සම්බන්ධව. අන්තර්ජාලය හරහා තමයි මෙය එන්නේ. එතකොට අතන එකටත් යයි ඒ වගේම. එතකොට කැමරා කියක්ද මෙහි සවි වන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා ඔබතුමානේ මෙයට සම්බන්ධවෙලා තිබෙන්නේ. පැහැදිලි කරන්න ඔබතුමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා කැමරා ගණන නම් හරියට මතක නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලින් කිවුවේ කැමරා 13යි. හන්දිවලයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

හැම හන්දියකටම කැමරා 4 ගණනේ සවි කරනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කැමරා 4ක් සවි වෙනවා එක හන්දියකට. මීට අමතරව අම්බලන්ගොඩ වාරායත් , අම්බලන්ගොඩ බස්නැවතුම්පොළත් එකතු කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

මෙහි ඔක්කොම බැලුවොත් සාමාන්‍යයෙන් 32 ඩි.බී. ආර් දෙකක් පමණයි යන්නේ. කැමරා 64ක් ගසන්න පුළුවන්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

මේ වයර්ලස් කැමරා සවි කරන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

කොහොමත් මෙච්චර දුර යනවිට වයර්ලස් කැමරා වදින්නේ. මැදින් මැද පෙට්ටියක අපි ඩී.බී.ආර්. එක සවි කරන්න ඕන. එතකොට ඔබතුමා කිවුව තරම් මුදලක් යන්නේ නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ ටෙලිකොම් ආයතනයෙන් දුන් ඇස්තමේන්තුව කවුද කරන්නේ. එය අපට දෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්**</u>

අපට එම ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්න. මොකද ඒවාට එච්චර මුදලක් යන්නේ නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඒ ටෙලිකොම් එකත් එක්ක වෙළඳ සංගමේ තිබුණ සාකච්ඡාවට මා සහභාගි වුවා. ඒ ලබා දීපු මේක තමයි. මා සියළු ගරු මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කරන්නම්.

**තීරණය**

2020.02.25 දින පැවති අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය සමග ඒකාබද්ධව පවත්වනු ලබන කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් , සමස්ථ නගරයම ආවරණය වන

පරිදි කැමරා පද්ධතියක් වෙළඳ සංගමය සමග ඒකාබද්ධව සවිකිරීමට ගත් තීරණය අනුව අම්බලන්ගොඩ පොලීසියේ සවිකරන කැමරා පද්ධතියට හා බස් නැවතුම්පොළෙහි උඩ ඇති මුරපොලට සවිකරන කැමරා පද්ධතියට යන වියදම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සභා අරමුදලින් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

06.06 2020.02.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.02.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, කළමනාකරණ කමිටුවේ කාරණා 2ක් තිබෙනවා පැහැදිලි කර ගන්න. අන්තිම එක තිබෙනවා. තාක්ෂණසේවා නිලධාරි සඳුන් ගුණවර්ධන මහතා කතා කරනවා. සූර්ය පැනල් සවිකිරිමත් වහල අලුත්වැඩියා කළ යුතු බවත්. ඒ අනුව ඉංජිනේරු වාර්තාවක් ලබා ගත යුතු බවත්. ඒ අනුව මට ප්‍රශ්න 2ක් තිබෙනවා. එකේම තිබෙනවා වහල සම්බන්ධව මොකක්ද ගන්න තීන්දුව. නැවත මාස 2ක් යනවාද? තින්දුව පැමිණ තිබෙනවාද? මේ වහල සාදා ගන්නේ කොහොමද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අන්න එකට පිළිතුරක් ඔබතුමාට දෙන්න පුළුවන්ද?

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

අපේ ගොඩනැඟිල්ලේ වහල සම්බන්ධව. එය අලුත්වැඩියා කිරිම සම්බන්ධව. සූර්ය පැනල් සවිකරන්න ගියාම එහි වාර්තාවක් ඉංජිනේරු මහතාගෙන් ගන්න කියා තමයි සඳුන් මහතා කියා තිබෙන්නේ. ඉතිං කොච්චර කාලයක් යනවාද ? මෙය වෙනවාද? ඇයි මෙය වෙන්නේ නැත්තේ

කියන ප්‍රශ්නය තිබෙනවා. එතකොට වහල සම්බන්ධව ප්‍රශ්නයක් නැහැ කියා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් කිවුවාද? වාර්තාවක් දෙන්නම් කිවුවාද ගොඩනැඟිල්ලේ ප්‍රශ්නයක් නැහැ කියා. ඊළඟට තිබෙනවා. බස්නැවතුම්පොළේ වහල අලුත්වැඩියා කිරීමේ අලුත්ම තත්ත්වය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහි භාණ්ඩ ගෙනත් තිබෙනවා. මේ සභාවට ටෙන්ඩර් කර තිබෙනවා. එහි ශ්‍රමය සම්බන්ධයෙන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එතකොට ශ්‍රමයෙන් කරන්න. එතකොට මේ සභාවට ටෙන්ඩර් කළාම මේ මාර්තු මාසයේ . එතකොට අපි ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන්නේ අප්‍රේල් මාසයේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අද ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙනවා. අපිට ටෙන්ඩර් කමිටුවේදි පුළුවන් එය විවෘත කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නැහැ මට මේ තිබෙන ප්‍රශ්නය අලුත් අවුරුද්දක් එක්ක තිබෙන නිසා. එතකොට අලුත් අවුරුද්දට පස්සේනේ මෙය අලුත්වැඩියා කටයුතු සිදු වන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි බලන්නම් උත්සාහ කරලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අප්‍රේල් මාසය කියන්නේ ලබන මාසයනේ. එතකොට මේ ටෙන්ඩර් කිරීමත් එක්ක මේ මාර්තු අන්තිම වන විට මෙය පටන් ගන්න ඕන. එහෙම නැතිනම් මැයි මාසයට අදින්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි ටෙන්ඩර් කමිටුව කලින් දමන්නම්. බඩුටික ගෙනත් තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අප්‍රේල් අන්තිමනේ තිබෙන්නේ. එකයි මා ඇසුවේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ටෙන්ඩර් එක දුන්න ගමන් පටන් ගන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එතකොට වෙළඳ සංගමයේ අයත් දැනුවත් කර අපට කරන්න පුළුවන්. අන්තිම පිටුවේ තිබෙනවා ප්‍රමාණවත් තරම් අන්තර්ජාල පහසුකම් නොලැබීමේ ගැටළු. ප්‍රමාණවත් තරම් පරිගණක පහසුකම් තිබුණද අන්තර්ජාල පහසුකම් පිළිබඳ තිබෙන ගැටළු සම්බන්ධව නිලධාරින්ගේ ලිපි සකස් කිරීම හා මුද්‍රණය කිරීමේදී ගැටළු පවතින බව නිරික්ෂණය කර ඇති බව. මෙයට පිළිතුරු වශයෙන් දිලා තිබෙනවා. අන්තර්ජාල පහසුකම් ඇදලා තිබෙනවා. හැබැයි ඒවා හරියට පාරිපාලනයක් නැති නිසා වැඩ කරන්නේ නැති තත්ත්වයක් තිබෙනවා කියා. එතකොට මොකක්ද මෙහි තත්ත්වය. ඇයි මෙහෙම වෙන්නේ. එතකොට මෙහි අන්තර්ජාල පහසුකම් ගැනීමේ අපරාධයක් වෙනවා නිලධාරින්ට. නිලධාරින්ට වැඩ කරගන්න බැහැ. ගියවරත් මා මොකක් හරි කමිටුවකදි විමසා සිටියාම තාක්ෂණසේවා නිලධාරින්ට වැඩ කරගන්න බැහැ. එම තාක්ෂණසේවා නිලධාරින්ගේ පරිගණකයට අන්තර්ජාල පහසුකම් නැහැ. මේ පුස්තකාලයේ යට තිබෙනවා අන්තර්ජාල පහසුකම් වේලි වේලි. ඉතිං මා අසන්නේ ඇයි එම පරිගණක සඳහා අන්තර්ජාල පහසුකම් දෙන්නේ නැත්තේ. ඒ අදාළ නිලධාරින්ට. මෙහි තිබෙන විදියට දිලා තිබෙනවා. ඒ රැහැන් වල හරියට සම්බන්ධ නොකිරීම නිසා අවශ්‍ය ආරක්ෂිත මෙවලම් නොදමා බට නොදමා ලබා දීම නිසා තමයි මෙය තාවකාලිකව වේලා තිබෙන්නේ. මේ අන්තර්ජාල පහසුකම් හරි වැදගත්. තාක්ෂණසේවා නිලධාරි මා කතා කර ඇසුවාම, සැපයුම් නිලධාරිද මන්දන්නේ නැහැ එයාටත් අන්තර්ජාලයෙන් සැපයුම්කරුවන් කිසිවෙක් අන්තර්ජාලයෙන් ගන්න විදියක් නැහැ. තාක්ෂණසේවා නිලධාරිතුමියටත් අන්තර්ජාලයෙන් යම් යම් තොරතුරු ගන්න විදියක් නැහැ. එයාට අන්තර්ජාල පහසුකම් නැති නිසා. ඉතිං මේ තත්ත්වය ඇති කරන්න එපා. මෙහි අපහසුතාවයක් තිබෙනවා නම් පුළුවන් ඉක්මනට නිවැරදි කර දෙන්න. අන්තර්ජාල පහසුකම් මේ සියළු නිලධාරින්ට ලබා දෙන්න. ලේකම්තුමියණි. අන්තර්ජාල පහසුකම් වලට රැහැන් නැහැනේ. රවුටර් එක මදි නම් ප්‍රමාණවත් නැතිනම් එය ටෙලිකොම් එකට කියා වෙනස් කර ගන්න. මහ ලොකු දෙයක් නෙමේ. මේ අන්තර්ජාල පහසුකම් කියන එක සරල කාරණාවක්නේ. ඇයි අපි වද

විදින්නේ එය කරගන්නේ නැතිව. ටෙලිකොම් එකත් එක්ක කතා කරලා පුළුවන්තරම් ඉක්මනට මෙය ස්ථාපනය කර දෙන්න.

**තීරණය**

2020.02.26 දින පැවති කළමනාකරණ කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.07 2020.02.28 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.02.28 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ක්‍රිඩා කමිටු වාර්තාවේ තමයි අර බැඩ්මින්ටන් ක්‍රිඩාගාරය මානාන ක්‍රිඩාංගණයේ ඉදිකිරිම සඳහා ඉල්ලා තිබෙන්නේ ඒ සඳහා ඉඩමක් ලබා දෙන්න කියා. බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයක් ඉදිකිරිමට යෝජනා කරනවා. ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න. මේ සඳහා කවුරුත් විරුද්ධ නැහැනේද? එකඟයි. මිළහට ටෙන්ඩර් මිළ ගණන් විවෘත කර තිබෙනවා.

**තීරණය**

2020.02.28 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් , බැඩ්මින්ටන් සංගමය විසින් බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් සෑදීමට භූමියක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කළ බැවින් ඒ සඳහා භූමියක් ලබාදීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී මන්ත්‍රී ඒ ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.08 2020.02.25 දින පැවති කාන්තා කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.02.25 දින පැවති කාන්තා කමිටුවේ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.02.25 දින පැවති කාන්තා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

07 ටෙන්ඩර් හා මිළ ගණන්

**07.02.01 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය LED විදුලි බල්බ මිලදී ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති මිළගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Asian Electrical Colombo | Green Electrical Colombo | Evergreen lighting Electrical |
|---|---|---|---|---|---|
| 01 | LED විදුලි බල්බ | | රු.800/= Green | 875(15w) | 525(20w) |

| | | | | | |
|---|---|---|---|---|---|
| | Pin Type<br><br><br>Screw Type<br>15w 18w | 400<br><br><br>100 | රු.580/=<br>panasonic<br>Green<br>රු.875/= | 1025(18w)<br>875(15w)<br>1025(18w) | 475(15w)<br>475(15w)<br>525(20w) |
| 02 | Screw Type holder | | රු.55/=China<br>රු.130/=India<br>රු.170/=kevilton | - | රු.130/=India |

තීරණය-

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය LED විදුලි බල්බ මිලදී ගැනිම සඳහා මිළගණන් ඉදිරිපත් කර ඇති ආයතනයන්හි සාම්පල් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. තාක්ෂණසේවා නිලධාරි , ගණකාධිකාරි , අභ්‍යාන්තර විගණන නිලධාරි හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා ගෙන් සමන්විත කමිටුවක් මගින් එම සාම්පල් පරීක්ෂා කර බලා තීරණය ගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02 හල්වතුර කසළ අංගනය සඳහා දියර ඉසින යන්ත්‍රයක් මිලදී ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | United Glass Lanka | Meenaban Privte Ltd | Apper Rydall privte Ltd |
|---|---|---|---|---|
| 01 | හල්වතුර කසළ අංගණය සඳහා දියර ඉසින යන්ත්‍රය | රු.295000/=<br>රු.23600/=<br>( Vat)<br>රු.318600/= | රු.338000/= | රු.365500/= |

තීරණය-

හල්වතුර කසළ අංගනය සඳහා දියර ඉසින යන්ත්‍රයක් මිලදී ගැනිම සඳහා මිළගණන් ඉදිරිපත් කර ඇති ආයතන තුනෙහි යන්ත්‍රයන් පරීක්ෂා කර බලා මිලදී ගැනීම සුදුසු බවටත් , ඒ සඳහා නිලධාරි මණ්ඩලයක් හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා යන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් මගින් මෙම යන්ත්‍රය පරීක්ෂා කිරිම සුදුසු බවට ගරු සභාව යෝජනා කරන ලදී.

08. ගෙවීම්.

08:01 ඇණවුම් අංක 2286 යටතේ ඇණවුම් කරන ලද අඟල් ¾ ගල් කියුබ් 4.20 ක් වෙනුවෙන් පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට රු.28350/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:02 ඇණවුම් අංක 2283 යටතේ ඇණවුම් කරන ලද අඟල් 1/4 චිප් ගල් කියුබ් 16.80 ක් වෙනුවෙන් අයි.ඩී.ප්‍රියන්ත මහතා හට රු.126000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:03 ඇණවුම් අංක 2374 යටතේ ඇණවුම් කරන ලද වැලි කියුබ් 01 ක් වෙනුවෙන් පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට රු.12500/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:04 ඇණවුම් අංක 2386 යටතේ ඇණවුම් කරන ලද ඒ.බී.සී ගල් කියුබ් 04 ක් වෙනුවෙන් පී.එච්.සී.සී. ද සිල්වා මහතා හට රු.27000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:05 ඇණවුම් අංක 2291 යටතේ පටබැඳිමුල්ල ළමා උද්‍යානය සඳහා ඇණවුම් කරන ලද ළමා ක්‍රීඩා උපකරණ වෙනුවෙන් Lallans sports Goods Manufactures (pvt)ltd වෙත රු.1422567.25 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:06 ඇණවුම් අංක 2377 යටතේ ඇණවුම් කරන ලද 10x10 කැනපි රෙදි 10 ක් සඳහා රු.70000/- ක් පානදුර , රන්තාරා එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි

ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:07 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳ 01 ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.44691.46 ක් නිදහස් කිරීම ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:08 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳ 02 ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.44691.46 ක් නිදහස් කිරීම ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:09 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳ 03 ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.44691.46  ක් නිදහස් තිරීම ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:10 මහජන ක්‍රීඩාංගනය  දේවානන්ද විද්‍යාලය දිශාවේ දකුණු පැති බැම්ම පළමු අදියර ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.48732.07  ක් නිදහස් තිරීම ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:11 මහජන ක්‍රීඩාංගනය  දේවානන්ද විද්‍යාලය දිශාවේ දකුණු පැති බැම්ම දෙවන අදියර ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.45768.43 ක් නිදහස් තිරීම ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:12 මහජන ක්‍රීඩාංගනය  දේවානන්ද විද්‍යාලය දිශාවේ වම් පැති බැම්ම පළමු අදියර  ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.41421.73  ක් නිදහස් තිරීම ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර  ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:13 මහජන ක්‍රීඩාංගනය  දේවානන්ද විද්‍යාලය දිශාවේ වම් පැති බැම්ම දෙවන අදියර ඉදිකිරීමේ කර්මාන්තයේ 10% ක රැඳවුම් මුදල් රු.22042.61 ක් නිදහස් තිරීම ඕකන්ද

ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:14 කාර්ය නිම කිරීමේ පත්‍ර අංක 0520 යටතේ දැන්වීම් පුවරු 60 ක් සාදා නිම කිරීමේ කාර්යය වෙනුවෙන් රු.282000/- ක් අනුර අයන් වර්ක්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:15 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අසල දිශාවේ ඉදිකරනු ලබන බැම්ම සඳහා රු.239435.68 ක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:16 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ පැති විකට්ටුව ඇති දිශාවේ ඉදිකරනු ලබන බැම්ම සඳහා රු.250637.28 ක් ඕකන්ද ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:17 කෙරමිණිය පතිරාජ පාරේ 01 අතුරු මාර්ගයේ තාර දැමීමේ කර්මාන්තය සඳහා රු.402897.08 ක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:18 කෙරමිණිය පතිරාජ පාරේ 02 අතුරු මාර්ගයේ තාර දමා සකස් කිරීමේ කර්මාන්තය සඳහා රු.120610.76 ක් කළුවඩුමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

8.19 2020 ජනවාරි මස සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය ලබාගැනීම වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත රු.297000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 09. ගිණුම් :-

**09.01** **2020 ජනවාරි මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.**

**තීරණය:-**

2020 ජනවාරි මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2020ජනවාරි මස ලැබීම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

විය.

10 ඇස්තමේන්තු :-

**10.01 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාපිටියේ දේවානන්ද විද්‍යාලය පැත්තේ තිබෙන කාණුවේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා රු.485,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාපිටියේ දේවානන්ද විද්‍යාලය පැත්තේ තිබෙන කාණුවේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා රු.485,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්,ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.02 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ බෝධි ප්‍රාකාරයේ තාප්පය බැඳීම (අදියර 02 ) සඳහා රු.550,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ බෝධි ප්‍රාකාරයේ තාප්පය බැඳීම (අදියර 02 ) සඳහා රු.550,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීමට කම්කරු වියදම සඳහා රු.180,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එහි වහලේ තිබෙන ඒවා දෙනවා කියා මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එහෙම දෙන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මොකක්ද ප්‍රශ්නය. අපි එන්න ඉස්සරවෙලා ප්‍රශ්නයකි. එය තාක්ෂණසේවා නිලධාරින් සමඟ සාකච්ඡා කර විසඳා ගත යුතුයි. අපි බලන්නම්. මටත් එහි අධ්‍යක්ෂක ජෙනරාල් කතා කළා. කොටස් වගයක්. මා බැලිය යුතුයි මොකක්ද වෙලා තිබෙන්නේ කියා.

**තීරණය-**

බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීමට කම්කරු වියදම සඳහා රු.180,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ආපන ශාලාව පැත්තේ බැම්ම කපරාරු කිරීම සඳහා රු.345,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ආපන ශාලාව පැත්තේ බැම්ම කපරාරු කිරීම සඳහා රු.345,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.05 තල්ගස්ගොඩ පෙර පාසලේ තීන්ත ආලේප කිරීම සඳහා රු.165,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

තල්ගස්ගොඩ පෙර පාසලේ තීන්ත ආලේප කිරීම සඳහා රු.165,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් ආසන ඉදිකිරීම (අදියර 01) සඳහා රු.1,100,000/- ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් ආසන ඉදිකිරීම (අදියර 01) සඳහා රු.1,100,000/- ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.07 බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ ඉදිකිරීම් (අදියර 01) සඳහා රු.1,850,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට භාගයක් ඉදිකර තිබෙන බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය ඉදිකිරිම සඳහා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඕකට වෙනත් යෝජනාවක් මේ සභාවේ අනුමත කර තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. දැනට ඉතිරිවෙනවානේ ඕන තරම්. අත්තිවාරම් දමා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඕකේ අත්තිවාරම දමා දැන් අවුරුදු 10කට වැඩියි. මා ඉතාම පැහැදිලි කරලාම මේ සභාවේ එම යෝජනාව දැම්මේ ධර්මාශෝක විද්‍යාලයේ මට්ටමට උස්සා වාහන නතර කිරිමේ ස්ථාන 30ක් සමඟ මහල් තුනකින් යුත් ගොඩනැඟිල්ලක් විශේෂඥ වෛද්‍ය සේවාව සඳහා කාමර 05ක් සමඟ ඉදිකර දෙන්න කියා. ඒ අවශ්‍යතාවය තමයි එතැන තිබෙන්නේ. උඩ තට්ටුවේ ඕනනම් බැඩ්මින්ටන් ක්‍රිඩාගාරය ගහන්න පුළුවන්. දැන් බැලුවාම බැඩ්මින්ටන් ක්‍රිඩාගාර 4ක ඒවා අපට ලැබි තිබෙනවා. එමනිසා නැවත අපේ මුදල් වලින් මෙතැන බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයක් ඉදිකිරිම ප්‍රයෝජනයක් තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට අපි කල්පනා කළ එක දෙයක් තමයි. දැනට මෙහි සම්පූර්ණ අත්තිවාරම දකුණු පළාත් සභාවෙන් දමා තිබෙන්නේ. මීට වසර 20කට ඉහත උඩදි. ඉතිං අද වනතුරු මෙය අපි හදන්න උත්සාහ කළේ නැහැ. ඉතිං මෙය හදන්න ආරම්භ කරලා අනිත් ටික කඩා දමා මේ වෙළඳ ව්‍යාපාර ක්‍රමයට යතහැකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අත්තිවාරම දැම්මේ දකුණු පළාත් සභාවෙන් නෙමේ. බැඩ්මින්ටන් සංඵවිලා. ඒ සභාපතිත්වයෙන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. දකුණු පළාත් සභාවෙන්

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

දකුණු පළාත් සභාවෙන්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එය ප්‍රායෝගික නැහැ. මොකද මේ ඉඩම පිහිටි රක්ෂිතයේ හැටියට වාහන නතර කිරිමට රථ ගාලක් අත්‍යාවශ්‍යායි. මේ කුලරත්න හන්දියේ රථ වාහන 30ක් නතර කිරිමේ ස්ථානයක් සැදිම තමයි වටින්නේ. එතන වාහනයක් ගන්න බැහැ මොන තලයෙන්වත්. පුද්ගලික ආයතන හෝ වේවා. එහෙම නම් එම රෝහල අපි වසා දැමිය යුතුයි. ළමයින්ට දෙමාපියන්ට , ජනතාවට ඔතන සවස යන්න විදියක් නැහැ. මේ වාහන තද බදය නිසා. දැනට එම ඉඩමේ රෝසෙත් රෝහලට වාහන නතර කිරිමට අපි බදු දිලා එම තද බදය අඩුකර තිබෙන්නේ. දැන් ඕකත් අයින් කලහොත් එහෙම තවත් හන්දියට තමයි එම තද බදය එන්නේ. මේ ප්‍රායෝගික තත්ත්වයක් තමයි මා මේ කියන්නේ. ඔතන බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයක් ඉදිකිරිම වැඩක් නැහැ. එහි විය යුත්තේ අත්‍යාවශ්‍යයෙන්ම වැනලින් සමඟ රථවාහන අංගණයක් ඉදිකිරිමයි. මොකද අම්බලන්ගොඩ ජනතාව විශේෂඥ වෛද්‍යවරයෙකු වැනල් කිරිම සඳහා ගාල්ල, කොළඹ ප්‍රදේශවලට යා යුතු වෙනවා. ඒ අය මෙහේ එන්නේ නැත්තේ එම රථවාහන නතර කිරිමේ පහසුකම් , වැනලින් පහසුකම් මෙහි නැති නිසා. මා කියන්නේ වෛද්‍යවරුන්ට හරි මේ කාමර 8 ඉදිකරලා මේය දිලා දමන්න. මේ වාහන 30ක් නතර කිරිමට හැකි රථගාලක් ඉදිකර දිලා. එහෙම නැතිනම් රෝගින්ට එහි වාහන නතර කිරිමට එය නියම කරලා. මොකද ගමේ අවශ්‍යතාවය එකක්. ඔතන හන්දියේ හැටියට රථගාලක අවශ්‍යතාවයක් තිබෙනවා. ඔබතුමා කියන එකේ සත්‍යතාවයක් තිබෙනවා. මීට වසර 20කට කලින් මුදල් යට කර අත්තිවාරමක් දමා තිබෙනවා. නමුත් ඕක ඔය විදියට ගොඩනැඟුවොත් අර පහළින් ඉදිකළහැකි රථගාල අපට නැති වෙනවා. එකයි මා මේ කියන්නේ. මේ අම්බලන්ගොඩ නගරයේ තිබෙන ඉඩකඩ ඉතා සිමා සහිතයි. අපි සැලසුම් හදන කොට එකත් ඔලුවට අරගෙන කළ යුතුයි. එකයි මා මේ මගින් මග ඉල්ලා සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපට දැන් බැඩ්මින්ටන් ක්‍රිඩාගාරයකට මුදල් වෙන් වෙලා තිබෙන නිසා අපේ නගරයේ අවශ්‍යතාවයත් බලා අපට හොඳ ආදායමකුත් නගර සභාවට එන නිසා අපට අර බැඩ්මින්ටන් ක්‍රිඩාගාරය අතන සාදාගෙන අවසන් වන විට තමයි නැතිනම් අපට බැඩ්මින්ටන් ක්‍රිඩාගාරය සාදා නිම වූ පසු නැතිනම් අපට සෙල්ලම් කරන්න ඉඩ නැහැනේ. නැතිනම් අපට මේ දෙන සේවාව සපයන්න බැහැනේ . අර අතන අපේ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය සාදා අවසන් වන විට මේ ගොඩනැඟිල්ල අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි මේ අපේ ජනතාවට අත්‍යාවශ්‍යායි විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවාව ලබා ගැනීමට තැනක් නැහැ. නැතිනම් ගාලු යන්න සිද්ධ වෙනවා.එක්කෝ කොළඹ යන්න ඕන. එම නිසා මා හිතනවා නගර සභාවටත් දිර්ඝකාලින හොඳ ආදායම් මාර්ගයක්. එතකොට නගරයට , ජනතාවට යම්කිසි

සේවාවකුත් වෙනවා. එමනිසා ඔය භූමිය හරි වටින භූමියක්. භූමිය යට වාහන අංගණයක් සහ ඕන නම් තවත් අංගණයක් සමඟ මහල් තුන හතරක් ගසා අපට ගොඩනැඟිල්ල ඉදිකිරීමට යන මුදල උපයාගත හැකියි. එමනිසා එකට අපි අවධානය යොමු කළානම් හොඳයි. අර බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය හැදුවාට පසුව. දැන් මෙයට වියදම් කරන එක තේරුමක් නැහැ. දැන් මේ හදන එක අංගසම්පූර්ණව නවීන තාක්ෂණය උපයෝගි කරගෙන තමයි හැදෙන්නේ. එතකොට දැන් මේකට වියදම් කරන එක තේරුමක් නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා ඉදිරිපත් කළ අදහස මාත් අනුමත කරනවා. එම ස්ථානයේ අවශ්‍යතාවය ගැන බැලුවාම එහි අවශ්‍යතාවය මතුවන්නේ වෛද්‍යවරුන්ගේ වැනලින් සේවාවක් සහ රථවාහන අංගණයක් සඳහා තමයි අවශ්‍යතාවය මතු වන්නේ. එතකොට ඒ ගරු මන්ත්‍රීවරු දේපල ප්‍රකාශ කළ ආකාරයේ ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සුදුසු කියා මාත් යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ ආකාරයට මාත් දුටු දෙයක් තමයි ධර්මාශෝක විද්‍යාලයේ පාසැල් නිම වන වේලාවට දෙමාපියන් ගියාම වාහන වලින් , විශේෂයෙන් කාන්තා පාර්ශවය වුණත් යතුරුපැදි වලින් යනවා තම දරුවා ගෙන එමට. එම ස්ථානයේ තමයි පොඞ්ඩක් හරි එය නතර කර යන්නේ. ඔබතුමා මේ ගැන සාකච්ඡා කර සුදුසුම දේ වාහන නතර කිරීමේ ස්ථානය ප්‍රධානම දේ කර ගන්න. එම ස්ථානය සැහෙන්න තදබදයක් අපි දකිනවා. බොහෝ වේලාවට සවස් වරුවේත් ඔය පාසැල අරින වේලාවටත් ලොකු තදබදයක් තිබෙනවා. එම නිසා ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එහෙම නම් එම ඇස්තමේන්තුව නැතිව අනිත් එවා සම්මත වුවා සේ සලකනවා. දැනට තාවකාලිකව මෙය ඉවත් කරනවා. මේ ඇස්තමේන්තුව සැදුවේ ක්‍රීඩා කමිටුවේ ක්‍රීඩා අයගේ ඉල්ලීම පරිදි. එගොල්ලන් දන්වන ලද දෙයක් තමයි මේ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය හදන්න කියන එක.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයත් එක්කම යන්න. ඩ්‍රෝ එකක් දමා. වැඩය ඉවරයිනේ එතකොට.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ. එක තමයි මා කිවුවේ. මේ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය ඉදිකලාම අනිත් බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය කඩා ඉවත් කළ හැකියි. එතකොට මේ හදන එකට අපට ලක්ෂ 18ක් විතර යන්නේ.

අපට අලුතින් බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් හදන්න ගියොත් එහෙම ඊට වැඩි මුදලක් යනවා. මොකද අත්තිවාරමත් දමන්න එපැයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අනිවාර්යෙන්ම සැලසුම් වලට යන්න ඕනේ. හැමතැනම ඉදිකරන්නේ නැතිව.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. දැනට බැඩ්මින්ටන් ක්‍රීඩ කරනනේ එතැන විතරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

වැදගත් වෙන්නේ මෙතැන බැඩ්මින්ටන් නෙමේනේ. මෙතැන ඉතාම වැදගත් වෙන්නේ රථ ගාල්. මේ අම්බලන්ගොඩ නගරයේ. වෙළඳ ප්‍රජාවටත් වැදගත් වන්නේ වාහන නතර කිරිමට රථගාල්. සාමාන්‍ය ජනතාවටත් වැදගත් වෙන්නේ එම රථගාල්. එහෙම නැතිව කොච්චර ගොඩනැගිලි ඉදිකළත් ඔබතුමා දන්නවා මේ නගරයේ ඉදිවෙලා තිබෙන ගොඩනැඟිලි වලට වාහන නතර කිරිමට කොපමණ ඉඩ ප්‍රස්ථා දි තිබෙනවාද කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

නැහැ. දැන් මහල් කිහිපයකින් යුත් ගොඩනැඟිලි ඉදිකරන විට අපි එම රථගාල් වලට මුදල් ගන්නවානේ සැලසුම් අනුමත කරන විට. එම රථගාලක් ලබා දිමටත් අපි බැඳි සිටිනවා. මොකද ඒක වැදගත්

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගන්න ප්‍රමාණය එක ප්‍රමාණවත් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

ඒ ප්‍රමාණවත් නැති එක අපේ මේවා එකක්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම මුදලින් පර්චස් එකක් ගන්නත් බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම කතා කරමින්</u>**

ඒ ගන්න එක සංශෝධනය කරගන්න අපි දැන ගත යුතුයි. මා කියන්නේ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයකුත් යන්න ගොඩනැඟිල්ල ඉදිකරන විට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා කියන්නේ ගරු මන්ත්‍රිවරුන්ගේ ඉල්ලිම අපි පිළි ගන්නවා.

**තීරණය-**

බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ ඉදිකිරීම් (අදියර 01) සඳහා රු.1,850,000/- ක ඇස්තමේන්තුව තාවකාලිකව ඉවත් කරන බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ ඒකමතිකව තීරණය කරන ලදී.

**10.08 පනියන්දූව පාරෙන් අතුරු මාර්ගයේ කාණු පද්ධතිය හා බෝක්කුව (සංශෝධිත) ඉදිකිරීම සඳහා රු.700,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

පනියන්දූව පාරෙන් අතුරු මාර්ගයේ කාණු පද්ධතිය හා බෝක්කුව (සංශෝධිත) ඉදිකිරීම සඳහා රු.700,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.09 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳෙහි යකඩ ආවරණය හා කොන්ක්‍රීට් පුවරුව ඉදිකිරීම සඳහා රු.230,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ ළිඳෙහි යකඩ ආවරණය හා කොන්ක්‍රීට් පුවරුව ඉදිකිරීම සඳහා රු.230,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.10 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාව ඉදිකිරීම සඳහා රු.1,400,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාව ඉදිකිරීම සඳහා රු.1,400,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.11 අම්බලන්ගොඩ නගර සභාවේ ළමා හා කාන්තා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි වර්තමාන සමාජයේ කාන්තාවගේ භූමිකාව පිළිබඳව දැනුවත් කිරීම හා සංවේදීතාවය ඇති කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා රු.66,000/- ක වියදම් ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවේ ළමා හා කාන්තා කමිටු වැඩ සහටන ක්‍රියාත්මක කිරිම. අම්බලන්ගොඩ නගර සභාවේ ළමා හා කාන්තා කමිටු වැඩ සහටනේ රැස්විමේදි සාකච්චා වු පරිදි වර්තමාන සමාජයේ කාන්තාවගේ භුමිකාව සඳහා දැනුවත් කිරිම සඳහා සංවේදිතාවය ඇතිකිරිම සඳහා දැනුවත් කිරිම සඳහා වැඩසටහනක් කමිටු සාමාජිකයන් ගාලු දිස්ත්‍රික් වනිතා කටයුතු නිලධාරි වන කාංචනා මාපලගමගේ මහත්මිය සකස් කර දි ඇති රු.66000 ක ඇස්ත මේන්තුවක් සභාව වෙත ඉදිරිපත් කර තිබෙනවා. මෙහි අරමුණ මෙකයි. මේ අපේ ගරු මන්ත්‍රිතුමන්ලා තුමියන් විසින් ඉදිරිපත් කර ඇති එක.

01. සමාජයේ කුඩාම තැනුම් එකකය වන පවුල ශක්තිමත් කිරිම.

02. කාන්තාව සාමාජයේ ග්‍රාමක බලවේගය බව අවබෝධ කර ගැනිම.

03. වර්තමාන සමාජය තුළ පවතින සමාජ ප්‍රශ්න විසඳිමෙහිලා කාන්තාවට ඇති හැකියාව පසක් කර දිම.

04. බිඳුනු පවුල් ඇතිවිම අවම කිරිම.

05. දරුවන් රැකවරණයේදි මවට පැවරෙන වගකිම අවබෝධ කර වීම.

06. දික්කාසද විම් අවම කිරිම.

07. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇතිවිම අවම කිරිම.

08. අනියම් සබඳතාවල ඇති විනාශකාරිබව පෙන්වා දීම.

09. ජංගම දුරකථන හා අන්තර්ජාලය භාවිතා කිරිම පිළිබඳ දැනුවත් කිරිම.

10. දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ දැමිම සඳහා පවුල තුළ කළයුතු දේවල් පෙන්වා දීම.

11. දරුවන්ගේ ප්‍රේම සබඳතා දෙමාපියන් කෙසේ හැසිරිය යුතු දැයි අවබෝධ කර දීම.

12. දරුවන්ගේ සිය දිවි හානි කරගැනිම අවම කිරිම.

13. කාන්තාවන්ගේ සිය දිවි හානි කර ගැනිම අවම කිරිම.

14. අඩු වයස් විවාහ සහ අඩු වයස් ගැබ් ගැනිම් අවම කිරිම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමලා මට පෙනෙනවා ඉතාමත් සතුටු මුහුණෙන් කතා කරනවා කාන්තාවන් ගැන. ඇත්තටම අපිට ආඩම්බරයක් අපේ ගරු මන්ත්‍රීවරු මේ විදියට කතා කිරිම ගැන. මා පලමුවෙන්ම ස්තුතිය පුද කරනවා. ඇත්තටම අද සමාජයේ තිබෙන ගැටළු සම්බන්ධව තමයි මේ දැනුවත් කිරිම සිදු කරන්න යන්නේ. මේ වැඩ සටහන දිගින් දිගටම කරන කොට ඔගොල්ලන් අපිට ශක්තිය දෙන්න. එතකොට පවුලේ කාන්තාව හරියට පෝෂණය වෙලා කාන්තාව ශක්තිමත් වෙනවා කියන්නේ ඒ පවුල අනිවාර්යෙන්ම ශක්තිමත්. මොකද මෙහි මේ කියන ලද කතා අද සමාජයේ වෙන දේවල්. මොකද මේ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික මහතා හිනා වුණාට නෝනලාට මුහුණු පොත හා අන්තර්ජාලය ජංගම දුරකථනයෙන් හසුරුවන් ආකාරය පුරුදු කළාට ළමයින් එයින් ආරක්ෂා කර ගැනිම තමයි එයින් අපි අදහස් කර තිබෙන්නේ. මේ වැඩ සටහනට මා සියළුම ගරු මන්ත්‍රීවරුන්ට මා ආරධනා කරනවා. මේ වැඩසටහනට ඔබතුමන්ලා පැමිණෙන්න කියා. පැමිණි පසු ඔබතුමන්ලාට තේරේවි මේ වැඩ සටහනේ තිබෙන වැදගත්කම. අපි මෙය ගාල්ලේ කළා. අපි ලංකාව පුරා දිස්ත්‍රික්ක වල කරන්න ඕන කියා යෝජනා කර තිබෙනවා. මේ වැඩසටහන දුටුවාම හිතයි මේ අය කාන්තාව මෙයට කොච්චර හුරු කරන්නද හදන්නේ කියා. ඉතිං මෙහි රු.66000/=ක වගේ මුදලක් තිබෙන්නේ. මෙයට සම්පූර්ණ සහායෝගය ලබා දෙන්න. වෙළඳ පොළක් දමා තිබෙනවා. එයට ගරු මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශයේ අය තමයි නියෝජනය කරන්නේ. ගරු වෛද්‍ය රමණී සිරිවර්ධන මහත්මිය සහභාගි වන්නේ අපගේ ඉල්ලිම මත. මා ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට මා ආරධනා කරනවා එතුමියගේ මේ වැඩ සටහන බලා අධ්‍යනය කරන්න කියා. අපි ගරු මන්ත්‍රීවරියන් 6කු සිටිනවා කාන්තාවන් වශයෙන්. 2020 වර්ෂයට තිබෙන වැඩසටහන් බැලුවාම අපි කාන්තාවන් ශක්තිමත් කිරිම , කාන්තාවන් සවිබල ගැන්විම. ළමයින් පෝෂණය කිරිම ආදි දේ තිබෙනවා. එමනිසා මෙයට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී අයිරාංගනි මහත්මිය විසින් ගෙන එනු ලැබූ යෝජනාව ඉතාම කලෝචිත , සිදුවිය යුතු යෝජනවකි . මොකද මා දන්නවා මාගේ ජීවිතයේ මා ජර්මානු කාර්මික විද්‍යාලයේ වයස අවුරුදු 16දි පුහුණුව ලබද්දි එතුමියගේ උපදේශන සංග්‍රහයකට මා සහභාගි වුවා. එහිදි සමාජ රෝග පිළිබඳ දේශනයක් අපට කළා. අපි ගමෙන් කොළඹට ගිය කොල්ලන්. අපිව විනාශ විමට තිබුණ ඉඩකඩ බොහොමයි. ඒ දැනුවත් කිරිම මාගේ ජීවිතය පුරාම

මාව දැනුවත් කළා. අපිට හිනාවෙන්න ඕන කාරනා නෙමේ. මේවා කළයුතු දේවල්. ඉතාම වැදගත් ඉතාම හොඳ යෝජනාවක්. මා හරිම අඟය කරනවා ගරු මන්ත්‍රී අයිරාංගනි මහත්මිය ගෙන ආ යෝජනාව. මේවා තමයි කළ යුත්තේ. මිනිසුන්ගේ ඔලු හදන්න ඕන. ළමයින්ගේ ඔලු හදන්න ඕන. මේවා නොකිරිමේ විපාක තමයි පුවත්පත් , රුපවාහිනියෙන් ,ගුවන්විදුලියෙන් හැම දෙයකින්ම අපට අහන්න දකින්න වෙන්නේ. දිනපතා විනාශ කාරි දේවල්. මෙන්න මේ දැනුවත් කිරිම් නොකර නිසා. මේ වෛද්‍යවරිය ස්වේච්ජාවෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා මේ කාරණාවට. එම වෛද්‍යතුමියගේ කැමැත්ත හා සහභාගිත්වයත් අපි මේ අවස්ථාවේ අඟය කළ යුතුයි. මා හරිම සතුටුයි මේ වගේ යෝජනාවක් ගෙන එම ගැන. අපිට හිනාවෙන්න නෙමේ. අපිට ඉතාම අඟය කළ යුතු යෝජනාවක්.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අපේ අනුමැතිය සියල්ලන්ගෙන්ම ලැබෙනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවේ ළමා හා කාන්තා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ජා වූ පරිදි **වර්තමාන සමාජයේ කාන්තාවගේ භූමිකාව පිළිබඳව දැනුවත් කිරීම හා සංවේදීතාවය ඇති කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ** වැඩසටහන සඳහා රු.66,000/- ක වියදම් ඇස්තමේන්තුව සහිත වාර්තාවට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.12 අම්බලන්ගොඩ නගර සභාවේ පාපන්දු සංචිතයට ක්‍රීඩකයන් 25 ක් තෝරා ගැනීමේ අරමුණින් පැවැත්වෙන පාපන්දු තරඟාවලිය සඳහා රු.60,000/- ක වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ පාපන්දු සංගමයේ පාපන්දු තරඟය . අම්බලන්ගොඩ පාපන්දු සංගමයේ ක්‍රිඩකයන් 25කු තෝරා ගැනීමේ අරමුණින් පාපන්දු සංගමය පාසැල් මට්ටමින් දක්ෂ ක්‍රිඩකයින් තෝරා ගැනිමේ අරමුණින් අමබලන්ගොඩ නගර සභාව දක්ෂ ක්‍රිඩකයන් තෝරා ගැනිමේ පාපන්දු තරඟාවලියයි. තරඟාවලිය සඳහා සහාභාගි වන වයස් කණ්ඩය වයස අවුරුදු 16න් පහළ පාසැල්.

එක් කණ්ඩායමක් නියෝජනය කරන ක්‍රිඩකයන් 20ක් පමණ මෙම තරඟාවලියට සහභාගි වෙනවා. පාසැල් 16ක් පමණ සහභාගි වෙනවා. තරඟාවලිය කාන්තා පිරිමි වශයෙන් පැවැත්වේ. තරඟය පැවැත්වෙන ස්ථානය පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණය. තරඟය දින 3ක් තිස්සේ පැවැත්වෙනවා. ඒ සඳහා යන වියදම රු.60000/= ක් වශයෙන් තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභාවේ පාපන්දු සංචිතයට ක්‍රීඩකයන් 25 ක් තෝරා ගැනීමේ අරමුණින් පැවැත්වෙන පාපන්දු තරඟාවලිය සඳහා රු.60,000/- ක වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.13 ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් අම්බලන්ගොඩ නගර සභා ළමා හා කාන්තා කමිටුව මගින් සංවිධානය කරන අවුරුදු පොළ පැවැත්වීමට සහ රු.60,000/-ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

10.13

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභා ළමා හා කාන්තා කමිටුව විසින් සංවිධානය වන අවුරුදු පොළ සඳහා වන ඇස්තමේන්තුව. දළ ඇස්තමේන්තුව රු60000/= කි. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා. මොකක්ද මෙතැන කරන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

දැන් මෙහෙමයි මෙතනින් සිදු වන්නේ ප්‍රජා මුල සංවිධාන වලින් සිදු කරනු ලැබුවේ කාන්තාවන් සවි බල ගැන්වීම. දැන් ගම්වල අයට කැවුම් ටික තම්බා දෙන්න. එදිනෙදා ගමේ කාන්තාවන් පැමිණ තමයි මේ නිෂ්පාදනය කරන්නේ. ඒ දවස්වල නගරයේ ජනතාව ඕනතරම් ගන්නවා. පිට අයගෙන් ගන්නේ නැහැ. අම්බලන්ගොඩ නගරයේ සිටින ප්‍රජා මුල සමිති හරහා. අපි දැන් ක්‍රිඩා පිටිය තමයි ඉල්ලුවේ. පිට්ටනිය දැන් වෙන් කරලා. දැන් අපි පුංචිපොළ තිබෙන තැන තමයි ගන්න ඉන්නේ. අපි එතනදි ප්‍රජා මුල සමිති හරහා කාන්තාවන්ට දෙනවා . දැන් ඕකන්ද කිවුවොත් ඕකන්දේ කැවුම් තම්බන අයට දෙනවා. නිගමණය කරන්නේ ප්‍රජා මුල සංවිධානයෙන් තමයි

නිගමනය කරන්නේ මෙයා තමයි මෙය කරන්නේ කියා. අපි එහිදි දෙන්නේ ඒ අය සවිබල ගැන්වීම. මා උදාහරණයක් කිවුවේ. අපි මුදලක් ගන්නේ නැහැ. අපි දැන් මුදලක් අය කරන්නේ නැහැ. ප්‍රජා මුල සමිතියට පුළුවන් අයදුම්පත්‍රය ලබා දෙන්න. පොඩි දරුවන්ගේ ඇඳුම් මැසීම, විකිණීමට. ලොකු නිමි ඇඳුම් නැහැ. ඇඳ ඇතිරිලි කොට්ට උර ආදිය නමුත් මේ ගමේ කොට්ට උර ඇඳ ඇතිරිලි විකුණන අය ඉන්නවානේ ඒ අයට පුළුවන් ඒ ටික විකුණා ගන්න. පාපිසි ටික මහන අයට පුළුවන්. අපි සභාවෙන් ඉල්ලන්නේ මේ මුදල් ටික. අපට අවශ්‍යයි. මොකද අපි පලමුවෙන්ම අපි ජනතාවගෙන් මෙය අකරන්නේ නැතිව මෙය දෙන්න හදන්නේ මුදලක් ගන්නේ නැහැ. නගර සභාවේ සීමාවන් ශක්තිමත් කරන්න. දැන් මේවාට තමයි මුදල් ඉල්ලන්නේ. වෙන මොනවටවත් නෙමේ. මේ ඇස්තමේන්තුවේ තිබෙන්නේ වෙළඳ කුටි 30ක් සවිකිරිම දින දෙකක් සඳහා රු.36000/= කි. ඊළඟට නගර සභාවට එම සමුපකාර තොග ගබඩා භූමිය ගැනිමට. මුදල් ගෙවන්න වෙනවනේ. ප්‍රචාරය හා ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා රු.5000/=. වෙනත් සැරසිලි සඳහා රු.4000/=.අපි හිතාගෙන හිටියේ පොල්වත්ත පිට්ටනියේ දමන්න. පිට්ටනිය ඒ වේලාවට බුක් කරලා. මෙහි බැලුවේ කොට්ඨාශ 13 නියෝජනය වන ආකාරයට වැඩය කරන්න. ඒ කට්ටිය අපිත් එක්ක එකතු විමකුත් වෙනවා. මේ කාන්තාවන් අපිත් එක්ක එකතු වෙන විට අපිට මේ වැඩය කරන්න පුළුවන්. මා යන්නේ නැහැ පාළාත් සභාවට. ඉදිරි වැඩ ටික කරන්න. නැහැ එහෙම නෙමේ පළාත් සභා යන්නේ නැහැ. අපි ඒ ටික කරන්නම්. අපිට ඔගොල්ලන් ශක්තිය දෙන්න මේ ටික කරන්න. මෙය ඒ අය සවි බල ගන්වන්න තමයි දෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිතුමිය මේ සඳහා එකඟයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් අපේ ගරු මන්ත්‍රීවරුන්ට ගෙදර කැවිලි හදන්න ඕන නැහැනේ. මෙතනින් ගන්න පුළුවන්. මෙතැනට ආවාම අරගෙන යන්න පුළුවන්.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ළමා හා කාන්තා කමිටුව මගින් සංවිධානය කරන අවුරුදු පොළ පැවැත්වීමට සහ රු.60,000/-ක ඇස්තමේන්තුගත වියදම් දැරීමට ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති

ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා ළමා හා කාන්තා කමිටුව මගින් සංවිධානය කරන අවුරුදු පොළ පැවැත්වීමට සහ රු.60,000/-ක ඇස්තමේන්තුගත වියදම් දැරීමට ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇස්තමේන්තු යටතේ මට තිබෙනවා වැදගත් දෙයක් ඉදිරිපත් කරන්න. දුම්රියපොළ ආසන්නයේ තිබෙන සාප්පු සංකිර්ණයේ අලුත්වැඩියා කිරිම සම්බන්ධව මිට මාස කිහිපයකට ඉහතදිත් කතා කළා. එම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා කියා තාක්ෂණසේවා නිලධාරිතුමා කිවුවා. මා බලාපොරෝත්තු වුණා. අද මෙයට ඇස්තමේන්තුවක් ඉදිරිපත් වෙයි කියා. තවමනම් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉදිරිපත් වුණේ නැහැ. අපි ඊළඟ පාර ඉදිරිපත් කර දෙන්නම්. මා එය පොරොන්දු වුණා ඒක හදා දෙන්නම් කියා.

11. වෙනත් කරුණු

11.01 2019 .12.31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණ වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 .12.31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණ වාර්තාව. ඒ අනුව නිගමන නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා මෙන්න මේවා ඉදිරිපත් කර තිබෙනවා. එම මණ්ඩලය විසින්.

01. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයක් සකස් කර එක් එක් නිලධාරියා පෞද්ගලික පාවිච්චි කරන ලේඛණයක සටහන් කොඩ ලබා ගන්නා භාණ්ඩ හැර අනිත් සියළුම භාණ්ඩ කාබඩ් , මේස වැනි භාණ්ඩ දිග පළල මැනිමක් සිදු කර ඉන්වෙන්ට්‍රි ගත කිරිමට යෝජනා කරනවා.

02. සවි කිරිමේ ලේඛණයක් සකස් කොට සවිකිරිම් සිවිලිම් , විදුලි පංකා , පරිගණක ජාල උපාංග ආදිය එම සවිකිරිම් ලේඛණයට ඇතුළත් කොට එම සවිකිරිමේ ලේඛණය යාවත්කාලින කරමින් පවත්වගෙන යාමට යෝජනා කරනවා.

03. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයේ භාණ්ඩ නිකුත් කිරිම් පොත්වල සටහන් කොට එක් එක් නිලධාරියා ගන්නා භාණ්ඩ බඩු වට්ටෝරු පොත් යාවත්කාලික කරමින් පවත්වාගෙන යා යුතුය එම යාවත්කාලින කිරිම නිසියාකාරව සිදු වෙන්නේදැයි පසුවිපරම් කිරිම හා වගකිවයුතු නිලධාරියෙකුට එම පොතේ අත්සන් කිරිමට සුදුසු පිළිවෙතක් අනුගමනය කළයුතු යයි යෝජනා කරනවා.

04. දැනට භාණ්ඩ වට්ටෝරු පොත යාවත්කාලින නොමැති බැවින් එම පොත නිවැරදි ආකාරයෙන් යාවත්කාලින කිරිම කළ යුතු වේ.

05. නගර සභාව සතු දේපළ සහ සියළු භාණ්ඩ, උපාංග එහි නිල නාමය අනුව වර්ගීකරණය කොට යාවත්කාලින අයුරින් පවත්වාගෙන යා යුතුයි . උප ලේඛණ අංක 01 කියා දමා ඇත.

06. මෙතෙක් විශ්‍රාම යාමේදි , සේවය ස්ථිර කිරිමේදි සියළු සේවකයන් සතු භාණ්ඩ භෞතිකව කාර්යාලය සතුව පවති. මෙම භාණ්ඩ හඳුනාගෙන අවශ්‍ය පියවර අනුගමනය කරමින් එම නිලධාරින්ගේ නම් භාණ්ඩ වට්ටෝරු ලේඛණයෙන් ඉවත් කිරිමට කටයුතු කිරිම හා භෞතික වශයෙන් භාණ්ඩ වල හිඟයක් ඇත්නම් ඒ අවශ්‍ය නිත්‍යානුකුල ගැනීමට පියවර ගැනීමට යෝජනා කරනවා. උප ලේඛණ අංක 02 කියා සඳහන් කර තිබෙනවා.

07. ඉදිරියේදි ස්ථාන මාරු යන නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු නව සේවා ස්ථානයට යැවිමට පෙර ඔවුන් භාරයේ පැවති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිසි පරිදි භාර දි ඇති බවට තහවුරු කර ගැනිම. භාරදෙන තෙක් ඔවුන් දැනුවත් කිරිම . ඔවුන් භාරදීමට නිශ්චිත කාලයක් අපොහොසත් වන්නේ නම් එම භාණ්ඩ රජයට අයවිය වටිනාකම වැටුපෙන් නොපමාව අයකර ගැනිමට කටයුතු කිරිමට යෝජනා කරනවා.

08. මෙතෙක් ලේඛණගත නොමැති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කිරිමට යෝජනා කරනවා.

09. එක් එක් නිලධාරියා භාවිත කරන එහෙත් සේවකයා භාර නොගත් භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගතකිරිමට කටයුතු කරනවා.

10. එක් එක් සේවකයා හෝ නිලධාරියා සතුව පවතින භාවිතයට ගත නොහැකි භාණ්ඩ එනම් අබලි ද්‍රව්‍ය හෝ තමන් නමින් ඇති එහෙත් වෙනත් අයෙක් භාවිතා කරන භාණ්ඩ නැවත ගබඩාවට භාරදීමට කටයුතු කිරිමට යෝජනා කරනවා.

11. වෙන්දේසිය සඳහා යෝජනා කරන ලද අබිලි ද්‍රව්‍ය පරික්ෂාකොට අවශ්‍ය නිත්‍යානුකූල පියවර අනුගමනය කිරිමට වෙන්දේසියට අවශ්‍ය කටයුතු කිරිමට යෝජනා කරනවා. උප ලේඛණ අංක 05.

12. සියළු පෙර පාසැල් ගුරුවරුන් සතුව කතන්දර පොත් හා තවත් ලේඛණ පවතින අතර ඒවා ඉන්වෙන්ට්‍රිගත කිරිම විශාල ගැටළුවකි. ඊට පිළියම් ලෙස ගුරුතුමිය සතුව පවතින ලේඛණ ඉන්වෙන්ට්‍රි ලේඛණයෙන් ඉවත්කර පෙර පාසැල් ගුරුතුමිය විසින් එම භාණ්ඩ වෙනම ලේඛණයක් නඩත්තු කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

13. සෙනෙහස පෙර පාසැල සම්බන්ධව ගැටළුකාරි තත්ත්වයක් පවතින අතර ඒ පිළිබඳව නගර සභාව මගින් පරික්ෂණ මණ්ඩලයක් පත්කිරිමෙන් ගැටව නිරාකරණය කිරිමට යෝජනා කරනවා.

14. පෙර පාසැල් වල පවතින කුඩා සෙල්ලම්බඩු , ප්ලාස්ටික් කෝප්ප වැනි නිරන්තරයෙන් පරිහරණය කරන නිසා ක්ෂ වෙන ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුළත් කර ඇති අතර මෙම භාණ්ඩ අලුතෙන් පරිභෝජනය කිරිමේ ලේඛණයට ඇතුලත් කිරිමට සුදුසු බවට යෝජනා කරනවා.

ඉහත යෝජනා ක්‍රියාත්මක කිරිමේ කමිටුවක් පත්කර නියමිත කාලසිමාව තුළ අවසන් කිරිමට වාර්තාවක් ලබා දෙන්න කියා ඉල්ලිමක් කර තිබෙනවා.ඒවා තමයි යෝජනා ටික. නිලධාරින් විසින් වෙනම ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා ලේකම්තුමිය. ස්තුතිය පුද කිරිම කියා. 2019.12.31 දිනට අවසන් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණය කිරිමේ අධික්ෂණ මන්ත්‍රි මණ්ඩලය වශයෙන් ඔබතුමා පත්කිරිම සම්බන්ධව. මේ ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික කොඩිකාර මහතාට මෙම ලිපිය යවා තිබෙන්නේ. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමික්ෂණය වඩා නිවැරදිව සාර්ථක සමික්ෂණය කිරිමට සඳහා ඔබතුමා ගන්නා ලද මග පෙන්විම් , උපදෙස් ශක්තිමත්බව ඉතා අගය කොට සලකනවා. එම කර්තව්‍යයට නන් අයුරින් සහායෝගය දුන් සමික්ෂණ මණ්ඩලයේ සභාපතිතුමිය , සාමාජික මණ්ඩලය ,නගර සභා නිලධාරි මණ්ඩලය හදවතින් පුද කරනවා කියා ලිපියක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලාත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මමත් ස්තුතිය පුද කරනවා. එහෙම අභය කිරිම සම්බන්ධව. ගිය අවුරුද්දෙත් ඔය වගේම කමිටුවක් පත් කරලා තිබුණා. හැබැයි එකක්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. කමිටුවක් පත්කරලා මේ නිර්දේශ ක්‍රියාත්මක කළහොත් මෙය සාර්ථකව කර ගන්න පුළුවන්. නැතිනම් මේක ඔය තත්ත්වයේම පවති. ඇත්තටම අපිත් හරි අමාරුවෙන් කළේ. දින ගණනාවක් ගියා. මෙය ක්‍රියාත්මක වෙන්න ඕන. නැතිනම් ඊළඟ අවුරුද්දෙත් එහෙම වෙයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කමිටුවට පත්කළ යුතු ගරු මන්ත්‍රිවරුන්ගේ නම් යෝජනා කරන්න. ගරු නගර සභා මන්ත්‍රි ලලිත් ධම්මික මහතා, ඔබතුමා හොඳ මග පෙන්වා තිබෙනවා. ඔබතුමාගේ නම මා යෝජනා කරනවා. හොඳ මග පෙන්වීමක් දිලා තිබෙනවා. මෙච්චර කල් අයාලේ ගිය එක කෙලින් අතට අරගෙන තිබෙනවා. ඒ ඉතුරු ටිකත් කර දෙන්න. ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා , තව අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රි කෙනෙකුත් ඉදිරිපත් වෙන්න. ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා හා ඔය සමානවම නිලධාරි මණ්ඩලය පත්කිරිමට අපි ලේකම්තුමියට කියනවා.

**තීරණය-**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගත යුතු බවත් එම නිගමන හා නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා පහත සඳහන් පරිදි මන්ත්‍රිවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් පත්කිරීම සුදුසු බවත් නිලධාරී මණ්ඩලය පත්කිරීම සඳහා ලේකම්තුමියට බලය පැවරීම සුදුසු බවටත් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>නිගමන හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පත්කරන මන්ත්‍රීවරුන්</u>

01. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා

04. ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා

12. **න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු :**

**12.01 තල්ගස්ගොඩ THW සුනාමි නිවාස සඳහා ඔප්පු ලබා දීමට අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමිය එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තල්ගස්ගොඩ THW සුනාමි නිවාස සඳහා ඔප්පු ලබා දීමට අනුමැතිය ලබා ගැනීම. මෙය ලියා තිබෙන්නේ පළාත් පාලන කොමසාරිස්තුමාට. ඉහත කරුණ පිළිබඳව අම්බලන්ගොඩ නගර සභා සභාපතිගේ අංක අම්/නස/02/15/03 හා 2019.10.17 දිනැති ලිපිය හා බැඳේ. එම ලිපිය මඟින් සුනාමි ව්‍යසනයට පත් ජනතාව වෙනුවෙන් දි කෙරුණු නිවාස සඳහා ඔප්පු ලබා දීමට අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර ඇත.මේ සම්බන්ධව මාගේ දැනුම් දීම පරිදි විමර්ශන නිලධාරින් දෙදෙනෙකු විසින් පරීක්ෂාවක් සිදු කරන ලද අතර එහිදි පහත කරුණු අනාවරණය විය.

i අම්බලන්ගොඩ , තල්ගස්ගොඩ THW නිවාස ව්‍යාපෘතිය සුනාමියෙන් අවතැන් වූවන් හා ධීවර කාරමිකයන් කොටසක් පදිංචි කර ඇති නිවාස ව්‍යාපෘතියකි. සභාවට අයත් තල්ගස්ගොඩ පිහිටි කොම්පෝස්ට් පොහොර සංකීර්ණ ඉඩමේ අක්කර 03ක පමණ කොටසක් සුනාමියෙන් අවතැන් වූවන් වෙනුවෙන් ජර්මන් ආධාර යටතේ ස්ථිර නිවාස 90ක් ඉදිකිරීම සඳහා ලබා දීමට අම්බලන්ගොඩ නගර සභාවේ 2005.04.06 දිනැති මාසික සභා රැස්වීමේ දි එකඟතාව පළ වි ඇත. එහෙත් මෙය විධිමත් සභා තීරණයක් නොවේ. ( ඇමුණුම් 01)

ii මේ නිවාස ව්‍යාපෘතිය පිහිටි අක්කර 5-6 පමණ වන මුව භූමිය සින්නක්කර ව මිලදී ගත් හිමිකම 1997.06.13 දිනැති විකුණුම්කර අංක 58හා 59 මඟින් අම්බලන්ගොඩ නගර සභාවට ලැබී ඇත. එහි සාධන පහ අනුව ඉඩමේ පරිහරණ කොන්දේසි කිසිවක් පනවා නො මැත. ( ඇමුණුම 02හා03)

iii සුනාමි නිවාස ව්‍යාපෘතිය ඇරඹීමට පෙර මේ ඉඩම කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් සඳහා යෝජිත ව පැවති බවත්, එහි කසළ හා ගලි අපද්‍රව්‍ය බැහැර ලීම සිදු කෙරුණු බවත් , කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් සභාව රු.ලක්ෂ 20ක වියදමක් දරා ඇති බවත් අම්බලන්ගොඩ නගර සභා සභාපතිවරයාගේ දින රහිත ලිපියකින් හා ලේකම්ගේ 2016.10.06 දිනැති ලිපියෙන් පැහැදිල් වේ ( ඇමුණුම 04 හා 05 ) . මේ වන විට අම්බලන්ගොඩ නගර සභාවේ කසළ කළමනාකරණ කටයුතු හල්වතුර ප්‍රදේශයේ භූමියක සිදු කෙරේ.

iv THW නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කෙරුණු දෙමහල් හා බද්ධ නිවාස 76ක් ඇත. 2006 හා 2007 වර්ෂවල දි අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් මේ නිවාසවල සුනාමියෙන් අවතැන් වූවන් පදිංචි කර ඇත්තේ මෙහි ඇමුණා ඇති ( ඇමුණුම් 06) ලේඛනයට අනුව යැයි කියනු ලැබේ. මොවුන් සඳහා ඉඩම් හිමිකම් ප්‍රදානය වෙනුවෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟීන් 2006.05.05 දිනැති ව සහතික පත්‍ර ලබා දී ඇතත් මේ දක්වා මේ නිවාසවලට සින්නක්කර ඔප්පු ලබා දී නැත. ( ඇමුණුම් 07)

v උක්ත නිවාස ව්‍යාපෘතියේ නිවාසලාභීන්ට නිරවුල් ඔප්පු ලබාදීම සඳහා එහි හිමිකම් පැවරීමට තීරණය කොට අම්බලන්ගොඩ නගර සභාව මේ සමඟ අමුණා ඇති නාමලේඛණය ඉදිරිපත් කර ඇත. මේ සඳහා බලයලත් මිනින්දෝරු පී. එන්.රබින් චන්ද්‍රසිරි විසින් අදාළ භූමිය මැන සකස් කරන ලද අංක 3771 හා 2009.03.11 නැමැති පිඹුර පදනම් කරගෙන ඇත.

vi එහෙත් ඇමුණුම් 06 ලේඛණයේ ඇති නම් 30ක් වෙනුවට ඇමුණුම් 08 ලේඛණයේ වෙනත් නම් 30ක් ඇතුළත්ව ඇති බව නිරික්ෂණය වෙයි. එම නම් 30හි මෙහි වර්ණ ගන්වා ඉදිරිපත් කරන අතර ඔවුන් විවිධාකාරවලින් මේ නිවාස පසුකාලයකදි හිමි වූ එම නිවාස වල වත්මන් පදිංචිකරුවන්ය. එහෙයින් මෙකී නිවාස 30 සඳහා ඔප්පු ලබා දීමේදි එහි වත්මන් පදිංචිකරුවන්ට එම නිවාස වලට ඇති හිමිකාරිත්වය පිළිබඳව නෛතික කරුණු සලකා බැලිම අවශ්‍ය වේ.

vii නගර සභා ආඥා පණතේ 37ඊ. I වගන්තිය අනුව සභාව සතු ඉඩම් විකිණිම , හුවමාරු කිරිම, කුළියට දීම හෝ බදු දීම සඳහා බලය ලබා දී ඇතත් සභා දේපලක අයිතිය නොමිලේ පැවරිමට බලය ලබා දී නොමැත. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභාව සභා ඉඩමක ඉදිකෙරුණු සුනාමි නිවාස සඳහා හිමිකම් ඔප්පු ලබා දිම ඉල්ලා ඇත්තේ කවර නෛතික පදනම යටතේද යන්න පැහැදිලි නොවේ.

viii සමෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ අංක 8/03/04/99 හා 2015.06.30 දිනැති ලිපිය මඟින් සභාදපත්‍ර ක්‍රමය මඟින් ඉදිකළ සුනාමි නිවාස වලට ඔප්පු ලබා දිමට නම් එකී ඉඩම් වල හිමිකම ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පවරන ලෙස උපදෙස් ලබා දි ඇත. එහෙත් ඒ අනුව මේ දක්වා කටයුතු ඉටුවී නොමැත.

ix උක්ත THW නිවාස ව්‍යාපෘතියේ නිවැසියන්ට හිමිකම් ඔප්පු ලබා නොදිමෙන් ඔවුන් වසර 12ක කාලයක් අපහසුතාවයට පත් වි ඇති බවත් මේ නිවාස ව්‍යාපෘතිය පිහිටි භූමිය වෙනත් පොදු කටයුත්තක් සඳහා යෙදවීමේ හැකියාව නොමැති බවත් නිරික්ෂණය වේ. උක්ත නිරික්ෂණයන්ට අනුව අම්බලන්ගොඩ නගර සභා ගරු සභාපතිගේ අංක අම්/නස/02/15/03 හා 2019.10.17 දිනැති ලිපිය හා එමඟින් යොමුකර ඇති සියළු ලේඛණ මේ සමඟ ඉදිරිපත් කරන අතර මේ සම්බන්ධව ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව කාරුණික උපදෙස් පතනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේක තමයි දැනට තිබෙන තත්ත්වය. ඒ අනුව නිත්‍යානුකූල පදනමක් නැහැ කියා තිබෙනවා. එම පදනමට ගැනීම සඳහා මෙහෙම නැහැ කිවුවාට හල්වතුර නිවාස ක්‍රමයේ මේ විදියටම අපි ඔප්පු ලබා දුන්නා. ඒ වගේම ඕකන්ද නිවාස යෝජනා ක්‍රමයේත් මේ වගේම අපි ඔප්පු ලබා දී තිබෙනවා. ඇයි මේකට ඒ වගේ නීතියක් නැත්තේ කියන එක අපිට ගැටළුවක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය ලිපිය සභාවෙන්ද ලේකම්තුමියද ඉදිරිපත් කර තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක කරන්නේ කොහොමද කියා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එක තමයි ගරු සභාපතිතුමනි, ඔකේ මුලික ගැටළුව තිබුණේ ඔප්පු ලබා දීමට කට්ටිය මුලික දේවල් සපුරා තිබෙද්දි මුල්ම ගැටළුව තිබුණේ මෙහි ඔප්පුවේ තිබෙන්නේ වෙන නමක් . පිඹුරේ තිබෙන්නේ වෙන නමක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ . දැන් ඒ ගැටළු දැන් නිරාකරණය ඉවරයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් දිගින් දිගටම තිබෙන්නේ මේවා දීලා දැන් ජනතාවට මේවා කියා හරියන්නේ නැහැ. මේ කතා කියා හරියන්නේ නැහැ ජනතාවට. 2006 සිට මේ ජනතාව පදිංචි වෙලා සිටිනවා. මේ වනවිට ළමයින්ට පාසැලකට දාගන්න නැහැ. අදත් ළමයින්ට පාසැල් යන්න නැහැ. මොකද ඔප්පු නැහැ. ලකුණු 15 කැපෙනවා. දිගින් දිගටම. මුලිකවම කලින් එවා තිබුණේ වෙන කතාවක්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ සම්බන්ධව තීන්දු ගැනීමට ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට ඔප්පු ලබා දෙන්න කියා යෝජනාවක් ඉදිරිපත් කරනවා. එතැනින් දිස්ත්‍රික් කමිටුවලට දමා අනුමත කරලා වැඩය කරන්නම්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එහෙනම් මෙතැන යෝජනාවක් කරන්නද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

මෙයට කැබිනට් අනුමැතියක් ගත්තානම් හරි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කැබිනට් අනුමැතියක් ගත්තානම් හරි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තල්ගස්ගොඩ THW නිවාස සංකීර්ණයේ ඔප්පු ලබා දීම සඳහා තීරණයක් ගැනීම සඳහා සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මේක තේරුම් ගන්න. නිලධාරි මට්ටමින් නිලධාරින්ටත් නීතියෙන් බාධාවක් තිබෙනවා නම් එම බාධව ඉවත් කර දෙන්නේ නැතිනම් එම නිලධාරින්ට එය අනුමත කරන්න බලයක් නැහැ. එම බලයක් තිබෙන්නේ කැබිනට් එකට. කැබිනට් එකේ අනුමැතියක් ගන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපට බලයක් තිබෙන එක්තරා ස්ථාරයක් තිබෙනවා. 99අවුරුද්දේ බදු.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

බදු දෙන්න පුළුවන්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

අනුමැතියක් ලැබෙන්නේ නැතිනම් මා දන්නේ නැහැ. ප්‍රදේශවාසින් කැමති වෙන එකක් නැහැ බදු කියන වචනයට.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක වෙලා තිබෙන්නේ එපාර බදු අයකරන්න වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

කැබිනට් අනුමැතියකින් පුළුවන්

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ දිනවල ගරු ආණ්ඩුකාරතුමාට පුළුවන් නේද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක තමයි මා කියන්නේ මෙතැනින් සම්බන්ධිකරණ කමිටුවට දමා මෙය ගාල්ලේ සම්බන්ධිකරණ කමිටුවට යෝජනාවක් වශයෙන් දෙන්න. ඔය ලිපියම.

**තීරණය-**

**තල්ගස්ගොඩ THW සුනාමි නිවාස සඳහා ඔප්පු ලබාදීමට අනුමැතිය ලබාගැනීම** යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් එවා ඇති ලිපිය අනුව එම නිවාස සඳහා ඔප්පු ලබාදීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.02 මාදම්පා ගඟේ පිහිණුම් තටාකය වටා අලෝකරණය කර දෙන ලෙස ඉල්ලා ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මාදම්පා ගඟේ පිහිණුම් තටාකය වටා අලෝකරණය කර ගැනිම සම්බන්ධවයි. ශ්‍රී දේවානන්ද විද්‍යාලයීය පිහිණුම් පුහුණු කටයුතු සඳහා මාදම්පා ගඟේ පිහිණුම් තටාකය යොදා ගන්නා අතර රාත්‍රි 8.00 පමණ වනතුරු පුහුණු කටයුතු සිදු කරයි. අම්බලන්ගොඩ සහ අවට පාසල් කිහිපයක්ම තටාකය පුහුණු කටයුතු සඳහා යොදා ගන්නා අතර සිසුන් 150 පමණ පෙ.ව.4.30 සිට රාත්‍රි 8.00 පමණ වනතුරු තටාකය පුහුණු කටයුතු සඳහා යොදා ගනී. පිහිණුම් අංශයෙන් බොහෝ ජයග්‍රහණ ලබා ගන්නා විද්‍යාලයක් ලෙස කීර්තියක් ලබා සිටින දේවානන්ද විද්‍යාලයට පුහුණු කටයුතු සිදු කිරිමට වෙනත් පිහිණුම් තටාකයක් නොමැති අතර සිසු ආරක්ෂාව පිළිබඳව සලකා LED Flasher අවම වශයෙන් 04 හෝ සවිකර තටාකය වටා අලෝකරණය සිදු කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සකසා දෙන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටි. පිහිණුම් තටාකයක් නොමැතිව පවා අප පාසලට මෙතරම් ජයග්‍රහන ලබා ගත හැකි වුයේ මාදම්පා ගඟ මගින් ඔබ විසින් අප වෙත ලබා දුන් පහසුකම් හේතුවෙන් වන අතර ඉහත අවශ්‍යතාව සපුරා ලීම මගින් තවදුරටත් අප වෙත අනුග්‍රහය දක්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බව දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉල්ලා ඇත.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම එය ලබා දෙන්න . මොකද අපි පොඩි කාලේ මෙතැන සිටින මන්ත්‍රිවරු දන්නවා ධර්මාශෝක දේවානන්ද විද්‍යාලයෙන් හැර වෙන පාසැල් වලින් පිහිණුම් ශුරයන් බිහි වුයේ නැහැ අම්බලන්ගොඩින්. අම්බලන්ගොඩින් තමයි එක්කෝ ධර්මාශෝකයෙන් නැතිනම් දේවානන්දයෙන්. හැබැයි මේ ස්ථාන දැන් ඔක්කොම පිටට යනවා. දැන් මැතක වන විට දේවානන්ද විද්‍යාලයේ ක්‍රිඩකයෙක් විතරයි සිටින්නේ සටනක් හරි දෙන්න. එමනිසා එය ඉතා ඉක්මනින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එම ඉල්ලීම ඉතාමත් කලෝචිතයි. මොකද ප්‍රධාන ප්‍රශ්නය අද උදේ ඔබතුමාගේ කටින් කියවුණා. ධර්මාශෝක විද්‍යාලයේ පිහිණුම් තටාකය ලබා දෙන්නේ නැහැ කියා. එතන පොඩි ප්‍රශ්නයක් තිබෙන්නේ දැන් වෙනකොට ලොකු ප්‍රවනතාවයක් තිබෙනවා 1 වසරේ සිට පාසල තුළ පිහිණුම් පුහුණු කිරීම් කරනවා. ඒ තුළ ළමුන් 300කට වැඩි ප්‍රමාණයක් පාසැලෙන්ම බිහිවෙලා තිබෙනවා පිහිණුම් ක්‍රීඩාව සඳහා. එතකොට ඒ ළමයින්ට කරන වේලාවෙන් අමතරව පිට ළමයින්ට දෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නය එතැන තිබෙනවා. එම ළමයින් කොටස තමයි මේ ඉල්ලීම කරන්නේ. ඒ අය වැඩි පැත්ත පුහුණු වීම් සඳහා මාදම්පා ගඟේ. එමනිසා මෙය ලබා දීම ඉතාමත් කලෝචිතයි. එමනිසා මීට සමගාමීව මා පොඩි යෝජනාවක් කරන්න ඉන්නවා. දැන් අපේ මෝදර පාලම හදපු දා සිට කළුවරේ. දැනට වසර 15කට වැඩියි මේ පාලම සාදා. සුනාමියටත් කලින් මෙය හැදුවේ. තාමත් කළුවරේ. අපට තිබෙන්නේ පාලම.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පාලමේ විදුලි බිල ගෙවීම සඳහා ප්‍රශ්නයක් තිබුණා. අපේත් රත්ගම ප්‍රාදේශිය සභාවත් අතර. රත්ගම ප්‍රාදේශිය සභාව විසින් එය ගෙවිය යුතුයි කියන මේවා එකට තමයි ඇවිත් තිබෙන්නේ. ප්‍රාදේශිය සභාව අපි ගෙවන්නේ නැහැ කියා පැත්තකට දමා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙහි අයිතිය තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාවට. නෛතිකව පාවිච්චි කරන්නේ නැතිනම් මෝය ඔක්කොම අපිටනේ අයිති.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එකක් අපි බිල ගෙවන්න ඕන මෙකේ. අනිත් ප්‍රශ්නය තමයි අපි ගාව එතරම් උසට උස්සන්න පුළුවන් මේවා එකක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, නැහැ. අපට එය සි/ස විදුලි සමාගමෙන් හරි ඉල්ලා බල්බ් ටික දමන්නනේ තිබෙන්නේ. ඕක මහ ලොකු දෙයක් නෙමේ. අනිත් එක එය අන්ධකාරයේ තිබ්ච බරපතල වරදකි. අනිත් දැන් අපි ගත්තොත් රත්ගම ආසනය පුරාම එල්ඊඩී විදුලි ලාම්පු සවිකර තිබෙනවා. විශාල එළියක් තිබෙනවා. අපෙත් ඒ අඳුරු ස්ථාන විශේෂයෙන්ම මේ පාලමට එම විදුලි ලාම්පු 4 සවි කරන්න. විදුලි සමාගමෙන් අපට එම අවශ්‍ය යන්ත්‍රය ලබා ගන්න පුළුවන් එම විදුලි ලාම්පු 4 සවි කරන්න. එක කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අනිත් එක දැන් පාලමෙන් එහා පැත්තේ බෝඩ් එක ගසා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඌරවත්ත පැත්තේ බෝඩ් එක ගසා තිබෙන්නේ. එක්තරා කාලයක හිටපු සභාපති ගරු ජී.එම්. එස් මහතා පුෂ්ප කුමාර මහතා සමඟ විශාල අරගලයකටත් ගියා පාලමෙන් මෙහා පැත්තේ බෝඩ් එක ගසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට මේ සම්බන්ධයෙන් ගරු සභාවත් හික්කඩුව ප්‍රාදේශීය සභාවත් නඩුවක් කියා තිබෙනවා බලපිටිය උසාවියේ. මේ පාලම අයිති කාටද කියා. එතකොට නඩුවෙන් ලබා දී තිබෙන්නේ හික්කඩුව ප්‍රාදේශීය සභාවට. එතකොට පාලමෙන් මේ පැත්ත කොටස තමයි අපිට අයිතියි කියා තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

එතකොට බෝඩ් එක ගසා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බෝඩ් එක ගසා ඒ අය දෙන්නැති. අපේ බෝඩ් එකේ හැටියට මාදම්පා ගඟේ මැද්දෙන් තමයි රේඛාව යන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එහෙම නම් පාලම මැද්දෙන් තමයි යන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පාලම මැද්දෙන් තමයි යන්නේ. ගං ඉම තමයි මායිම වෙලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහජනතාවගේ පොඩි මේවා එකක් තිබෙනවා. ටවුමේ එළිය මදියි කියා. අපේ විදුලි ලාම්පු දාපුවා රත්ගම ප්‍රාදේශීය සභාවේ දාපුවා මීට වඩා එළිය තිබෙනවා කිව්වා. හුඟක් එළිය මදි කිව්වා . ඒ ගැන පොඩ්ඩක් බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය එළියෙන් තමයි රත්ගම ප්‍රාදේශීය සභාව හැමදාම තිබ්බේ. දැන් අළුතින් විදුලි ලාම්පු ගෙනවිත් සවිකර තිබෙන නිසා එළියක් තිබෙනවා ඇති. එකයි වෙලා තිබෙන්නේ. අපි එළිය ඔයිට වැඩියේ තියුනු කරන්නම්. කමක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නැහැ. එල්ඩී.ඩී. විදුලි ලාම්පු ක්‍රමයක් දැන් සවි කර තිබෙනවා. කණුවලට බල්බ් 7ක් 8ක් වෙන විදියට. ඔබතුමා රාත්‍රියට ගිහින් බලන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේක කරන්න තීන්දු කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එතැන නීතිවිරෝධී වැඩත් සිද්ධ වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැන් මෙහෙමයි. මට තිබෙන ගැටළුව මෙකයි. රාත්‍රී කාලයේ බල්බ දමා ළමයෙකුට අනතුරක් සිදු වුණොත් එහෙම මොකද කරන්නේ. මා ඕක අපේ පිහිණුම් කරන පුහුණුකරුවන් සමඟ කතා කළා. අපේ ක්‍රීඩා කමිටුවේදි. එතුමාලා කිවුවේ එලිවෙන්න 4.00ටත් අපි පොඩි කාලයේ පිහිණුපු වේලාවේ මොන විදුලි ආලෝකයක් වත් නැහැ. කවුරුවත් අපි ගැන බැලුවේත් නැහැ කියා. ඕත තිබුණත් නැතත් එළිවෙන්න 4.00 ක්‍රීඩාව පටන් ගන්නවා කිවුවා. දැනු අඩුම ගණනේ රාත්‍රී 8.00 වෙනකම් මෙය කරන්න ඉඩ දෙන්න. අපි එයට අවස්ථාව දෙනවා. මේකට ඇස්තමේන්තුවක් දෙන්න අපිට.

**තීරණය-**

මාදම්පා ගඟේ පිහිණුම් තටාකය වටා ආලෝකකරණය සිදුකර දෙන ලෙස ඉල්ලා ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය අනුව එය ඉටුකරදීම සුදුසු බවටත් ඇස්තමේන්තුවක් ලබාගන්නා ලෙසටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.03 අම්බලන්ගොඩ ප්‍රජාපති බාලිකා විදුහලේ ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරිම පිළිබඳ කරන ඉල්ලිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ ප්‍රජාපති බාලිකා විදුහලේ ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කිරිම පිළිබඳ කරන ඉල්ලිමයි. අප විද්‍යාලය සඳහා විධිමත් ශ්‍රවණාගාරයක් දැනට නොමැති අතර , විද්‍යාලයේ තිබෙන එළිමහන් රංග ශාලාව , ශ්‍රවණාගාරයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණෙන් , 2020 අප්‍රේල් මස 04 වනදින විද්‍යාලයීය දරුවන්ගේද සහභාගීත්වයෙන් සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට අපේක්ෂා කරනවා. ඒ සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරිමක් සිදු කරනු ලබන අතර , මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ

පත්‍ර පහත පරිදි වේ. වටිනාකම රු.1000/= බැගින් ටිකට් 600 , වටිනාකම රු.1500/= බැගින් ටිකට් 100. මෙම ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීම සිදු කරනු ලබන්නේ පාසලේ දෙමාපියන්ට , ගුරුභවතුන්ට හා ආදී ශිෂ්‍යාවන්ට පමණක් වන අතර, දැන්වීම් ප්‍රචාරණය සිදු කරනු ලබන්නේ අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉදිරිපිට පමණි. අනෙකුත් සියළු දැන්වීම් අප විද්‍යාල භූමියේ පමණක් ප්‍රදර්ශනය කරනු ලැබේ. මෙම ප්‍රසංගයෙන් උපයා ගන්නා සියලු මුදල් ඉහත සංවර්දන කටයුත්ත සදහා යොදා ගන්නා අතර, ඒ සඳා මෙම ප්‍රසංගයෙන් ලැබෙන මුළු ආදායම ද ප්‍රමාණවත් නොවන බැවින් , මෙම ආදායම විනෝද බද්දෙන් නිදහස් කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

අපි අර අලුත් තින්දුව අනුව ඕන නිදහස් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

හැම පාසලකටම දෙන විදියට නිදහස් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

හැම පාසලකටම දෙන විදියට නිදහස් කරන්න. ඒ දෙන විදියට අයකරගෙන පස්සේ නිදහස් කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. මේ ඉල්ලීම විදුහල්පතිතුමාගේ වුණාට අත්සන් කර තිබෙන්නේ ලේකම් හා සභාපති. එමනිසා අපේ අර නීතිය අනුවම කටයුතු කරන්න වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නැහැ අළුත් ක්‍රමයටනේ අය කරන්නේ. එතකොට අඩුයිනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ඕක පාසැල් සංවර්ධන සමිතියද . ආදි ශිෂ්‍යාවන්ද

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පාසැල් සංවර්ධන සමිතිය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

පාසැල් සංවර්ධන සමිතිය නම් විදුහල්පතිතුමා අනිවාර්යෙන්ම අත්සන් කළ යුතුයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

සභාපති කියා අත්සන් කර තිබෙනවා. එයාගේ ලිපි ශීර්ෂයක තමයි අත්සන් කර තිබෙන්නේ. මෙන්න මේ ආදායම් පරික්ෂකගේ වාර්තාව මේකයි. ප්‍රජාපති ගෝතමී බාලිකා විද්‍යාලය පාසැල් සංවර්ධන සමිතිය 2020.04.04 දින විද්‍යාලයීය දරුවන්ගේ සහභාගීත්වයෙන් සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට නියමිත අතර රු.750,000/= කුත් ප්‍රවේශ පත්‍ර විනෝද බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටින අතර එම ප්‍රසංගයෙන් උපයන ආදායම විද්‍යාලයිය ශ්‍රවණාගාරය සංවර්ධනය කරන බවට වැඩි දුරටත් දන්වා ඇත. විනෝද බදු ආඥා පණත අනුව මෙවැනි ප්‍රසංගයක් නිදහස් කළ හැකි බැවින් විනෝද බදු නිදහස් කිරිමට සභාවට යොමු කිරිමට සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය-**

විද්‍යාලයේ තිබෙන එළිමහන් රංග ශාලාව ශ්‍රවණාගාරයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණෙන් 2020.04.04 දින පැවැත්වෙන ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ ලේකම්ගේ හා සභාපතිගේ අත්සනින් යුතුව එවා ඇති ලිපිය අනුව විනෝද බදු ආඥා පනතට අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.04 අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ලේ උඩු මහලේ අලුතින් සාදන ලද ජනෙල් , උළුවහු, ජනෙල් පියන් , දොර සදහා අවශ්‍ය ද්‍රව්‍ය ඉල්ලා වැඩ පරිපාලක මඟින් යොමුකරන ලද ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන ගොඩනැඟිල්ලේ උඩු මහලේ අලුතින් සාදන ලද ජනෙල් , උළුවහු, ජනෙල් පියන් , දොර සදහා අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් දි තිබෙනවා. කොස් ලී. විදුරු ජනෙල් සඳහා ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, දැන් කොච්චර කාලයක් වෙනවාද ඕක.

**තීරණය-**

නගර සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ උඩු මහලේ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය කර ඇති කොස් දැව , වීදුරු කොටස් සහ අමතර උපාංග ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.05 කොස්ගොඩ , ගල්කන්ද, ශ්‍රී විජයාරාම දායක සභාව විසින් දූමාරය සජීවී සංගීත සන්දර්ශනයෙන් ලැබෙන මුදලින් කොටසක් විහාරස්ථ සංවර්ධනය සඳහා ප්‍රදානය කිරිම පිළිබඳ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කොස්ගොඩ , ගල්කන්ද, ශ්‍රී විජයාරාම දායක සභාව විසින් දූමාරය සජීවි සංගීත සන්දර්ශනයෙන් ලැබෙන මුදලින් කොටසක් විහාරස්ථ සංවර්ධනය සඳහා ප්‍රදානය කිරිම සම්බන්ධවයි. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයිය ශ්‍රවණාගාරයේ 2020 මාර්තු මස 20 වන දින පැවැත්වීමට යෝජිත දූමාරය සජීවී සංගීත සංදර්ශනය සඳහා ලැබෙන මුදලින් කොස්ගොඩ, ගල්කන්ද ශ්‍රී විජයාරාම විහාරස්ථ සංවර්ධන කටයුතුවලට ලබා දිමට අපේක්ෂා කරන බව අප විහාරස්ථ දායක සභාව දැනුවත් කර ඇත. දූමාරය සජීවී සංගීත සංදර්ශනයේ සංවිධායක මණ්ඩලයේ එම යෝජනාව නගරාධිපතිතුමා ඇතුළු නගර සභාවට ප්‍රකාශ කිරිමට කැමතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් සභාපතිතුමා අළුත් ක්‍රමයට අඩු කළාම මේ අයට අඩු වෙනවානේ. දැන් අනුමත කරලානේ තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

නිදහස් කරන්න එපා. පිටනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නැහැ මේකේ මොකක්වත් ඉල්ලා නැහැ. මේ ලිපිය කියා තිබෙනනේ මේකයි. මේය නැවත කියවන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ අළුත් මේව එක අනුවනේ දැන් අය කරන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ලේකම් මහත්මිය කියන්නේ වාචිකව මෙය දිලා කිවුවාලු විනෝද බද්ද අඩු කර දෙන්න කියා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපේ ලේකම්තුමියගෙන් ඉල්ලීමක් කර තිබෙනවානේ . එතුමිය ඉන්නවානේ මෙතැන. ඒ හින්දා අපේ අර ක්‍රමයටම දෙන්න. බෞද්ධ විහාරස්ථානයක් නිසා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපේ ජගත් කුමාර මහතා කරන්න කියපු යෝජනාවට අනුව කරන්න .

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ලිඛිතව ඉල්ලිම ඉල්ලාගෙන අවශ්‍ය පණත ප්‍රකාරව කටයුතු කරන්න. නිදහස් කිරිම අනුමත කරනවා.

**තීරණය-**

සංගීත සංදර්ශනයෙන් ලැබෙන මුදලින් කොටසක් විහාරස්ථ සංවර්ධනය සඳහා ප්‍රදානය කිරීම සම්බන්ධව කොස්ගොඩ, ගල්කන්ද, ශ්‍රී වියාරාම විහාරස්ථානයේ දායක සභාව විසින් එවා ඇති ලිපිය අනුව , එම ලිපියේ ඉල්ලීමක් සඳහන්ව නොමැති හෙයින් නැවත ඉල්ලීම් ලිපියක් ලබාගෙන ආඥා පනත ප්‍රකාරව  කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.06 නගර සභාව සතු වාහන හා යන්ත්‍ර සුත්‍ර කඩිනමින් අළුත්වැඩියා කිරිම කඩිනමින් සිදු කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නගර සභාව සතු වාහන හා යන්ත්‍ර සුත්‍ර 25කට ආසන්න ප්‍රමාණයක් පවතින අතර එකී වාහන හා යන්ත්‍ර සුත්‍ර සියල්ල පහේ සේවා කිරිම නගර සභා ගරාජය තුල සිදු කරනු ලබයි. එපමණක් නොව ඉලෙක්ට්‍රොනික් වැඩ ලියවන පට්ටල් වැඩ හැර අනෙකුත් අලුත් වැඩියා කටයුතු නගර සභා ගරාජය තුල සිදු කරනු ලබයි. සෞඛ්‍ය අංශයේ ට්‍රැක්ටර් 11කට ආසන්න ප්‍රමාණයක් දෛනිකව සේවයේ යොදවා ඇත. දෛනිකව සේවයේ යොදවන බැවින් නිතර අලුත් වැඩියා කිරීමට සිදුවේ . ඉතා කඩිනමින් මෙකී වාහන අලුත් වැඩියා කිරීම සිදු කරගත යුතු බැවින් ඒ සඳහා අමතර කොටස්

ද කඩිනමින් ලබාදිය යුතු වේ. වාහන අලුත් වැඩියා කළයුතු අවස්ථා වලදි සේවා අවශ්‍යතාවය මත හැකි ඉක්මනින් සිදුකර ගත යුතු වුවත් පවත්නා නීති තුල නිර්දේශ අනුමැතියට ඉදිරිපත් කර සභාව වෙත ඉදිරිපත් කළයුත අවස්ථා වලදී වාහන අලුත් වැඩියාව සඳහා බොහෝ කාලයක් ගතවේ. එබැවින් විධිමත් පරිදි නියමිත ක්‍රමවේදයට අනුව වාහන අලුත් වැඩියාවක් සිදුකළ යුතු අවස්ථාවකදි එය කඩිනමින් සිදු කර ගැනීම සඳහා රු.100000.00 සීමාව දක්වා අලුත් වැඩියා සඳහා ලේකම් හා ගණකාධිකරි නිර්දේශයන් සභාපතිතුමාගේ අනුමැතියෙන් ඉහත කාර්යය ඉටු කිරිමට සුදුසු බව යෝජනා කරනවා( නගර සභා ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව)

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක හොඳයි. එක අනුමත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගැටළුවක් නැහැ. දැන් ලක්ෂයක් දක්වාම දුන්නාම මෙහි යම් රියදුරු මහතෙකු හරි යම් කෙනෙකු ගරාජයකට ගිහින් මෙහි අලුත්වැඩියා කටයුතු කිරිමට අපිත් දන්නවා. අපිත් වාහන පාවිච්චි කරනවා. මෙතැන සිටින අනිත් අයත් වාහන පාවිච්චි කරනවා. රු.27000/=. මේ ඇත්තටම ආයතනවල වෙන දේවල්. ඕකට කියනවා රු.47000/=ක් දමා දෙන්න. මෙතුමිය දන්නේත් නැහැ. අර ගණකාධිකාරිතුමිය දන්නේත් නැහැ. එතකොට මෙතුමා දන්නේත් නැහැ. මේ අනුමත කරන අපි දන්නේත් නැහැ. විගණන විමසුමක් කොහොත් හරි පෙත්සමක් ඇවිත් අවොත් එහෙම මේ සියළු ගරු මන්ත්‍රිවරු ඕකට වගකිව යුතු වෙනවා. දැන් මොකද කරන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු විපක්ෂනායකතුමනි, අපිට මෙහෙම ගැටළු වෙලා තිබෙන්නේ. අපි එහෙම අලුත් වැඩියා කටයුතු සඳහා අපි ගරාජ වලට යන්නේ නැහැ. සභාවෙන් අලුත්වැඩියා කටයුතු කිරිම සඳහා මිළ ගණන් කැඳවා ඉතා ඉක්මනින් බඩු මිලදි ගැනිම සඳහා තමයි මෙය සිදු කළේ. නැතිනම් හරි අමාරුයි කරන්න. මාස ගණන් තියාගෙන ඉන්නවා වාහන හදන්න. දැන් ඔබතුමා කියන කතාව මා සියයට සියයක්ම පිළිගන්නවා. කිසිම ගැටළුවක් නැහැ. මොකද ඔය ඒවාට යන්නේ නැහැ. අපේ ගරාජය ඇතුලේ තමයි හදන්නේ. කවුරු හරි අපි මිළ ගණන් කැඳවා ගිහින් බඩු අරගෙන ඇවිත් මේ කැලි ටික සවිකරන්න විතරයි තියෙන්නේ. ඔය බඩු වලට යන මුදල තමයි අනුමත කර දෙන්න කියන්නේ. අපි හරි ගැටළුවකට මුහුණ දෙනවා. ගණකාධිකාරිතුමියට කතා කරලා තමයි මේ ළඟදි කර ගත්තේ. ඔහොම දේවල් සිද්ධ වුණා. මාස ගණන් ඇදි ඇදි තිබුණා. වාහන හදාගන්න බැරිව. ඕක තමයි තිබෙන ගැටළුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකට නියම ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔබතුමා කිවුවා අත්‍යවශ්‍ය කම්ටු මාසයකට දෙපාරක් හරි තියන්න කියා. දැන් මෙහෙමයි රු.100,000/= මුදලක් වැඩියි. මොකද හේතුව දැන් පසුගිය දිනවල විදුලි බඩු ගන්න ගියාම එහි යවපු කෙනා කියනවා ගණනක් තියා දමන්න කියන්න. ඔය තත්ත්වයන් තියෙනවා. එක නිසා සැපයුම් නිලධාරි ගිහින්

ගන්නවා නම් ඕක ගැටළුවක් නැහැ. අරින පුද්ගලයාත් හොඳ වෙන්න ඕන. මොකද අපිට ඒවා සාක්ෂි පිට තිබෙන දේවල්. ලේකම්තුමිය මැදිහත්වෙලා එය කරනවානම් අපිට කිසි ගැටළුවක් නැහැ. අපි විශ්වාසය කරන්නේ ඔබතුමියයි, ගණකාධිකරිතුමියයි. සැපයුම් නිලධාරි හොඳයි. පසුගිය දිනවල මා දැක්කා බඩු ගෙන්නුවේ නැහැ කියා එතුමියට බැන්නා. ටෙන්ඩර් කමුටුවේදිත් කිවුවා එක දිනයක. කම්කරුවත් බනිනවා. බඩු ගෙනවිත් නැහැ කියා. එහෙම සේවකයන්ගෙන් බැණුම් අහන්න ඕන නැහැනේ නිලධාරින්. එමනිසා එය ඉක්මනින් කරන්න ඕන. මා හිතන්නේ එයට වෙනත් ක්‍රමවේදයක් හදන එක හොඳයි. මෙය හදනවා නම් ඔබතුමිලාගේ වගකීම අර ගන්න. මොකද අපි දන්නේ නැහැනේ මෙහි වගකිම. ඔබතුමිලාට ඒ අවසරය ලබා දෙන්න පුළුවන්. නැතිනම් මේ වංචාවල් සිදුවන තැන් මාර්ග අහුරා වැඩය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ සංවිධායකතුමා හා ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කිවූ දේවල් වලට මාත් එකඟයි. ටෙන්ඩර් කමිටුවේ හා මුල්‍ය කමිටුවේ මාත් සම්බන්ධ වෙලා සිටිනවා. යම්කිසි විගණන විමසුමක් ආවොත් එහෙම අපිටත් ඔය ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. එම නිසා ලේකම්තුමිය හා ගණකාධිකාරිතුමිය විශ්වාස කර මේ පිළිබඳව විනිවිදභාවයකින් හරියට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා කියන්නේ වැඩ කුළිය සඳහා මුදලක් අනුමත කර ගත්තාත් අමතර කොටස් සඳහා ඔය වැඩය කරන්න එපා කියා. අමතර කොටස් අදාල ආයතනයෙන් ලබා ගන්න. මැසිබුෂන් නම් එම ආයතනයෙන් ලබා ගන්න. මොකද අපි හිඟන ආයතනයක් නෙමේනේ. මිළ පොඩ්ඩක් වැඩි වෙයි. කාටවත් අතර මැදි නැහැනේ. වගකිම තිබෙනවා. විශ්වාසය තිබෙනවා. ඊළඟට ටෝයෝටා නම් ටෝයෝටා වාහන අනුව. ඔබතුමාගේ වාහනය ටෝයොටා නම් මික්ෂුබිසි සමාගමේ. ඒ අමතර කොටස් ගත්තානම් ඉවරයි. ඒ වගේ වාහනයක් නම් පෞද්ගලික ආයතනයකට දමා හදන එක හොඳයි. මිළ කියක් හරි වැඩි වුණත්. නමුත් මෙහේ වෙලා තිබෙන්නේ මේ අපේ සිටින කාර්මික නිලධාරිගේ දැනුමෙන් තමයි මේ සියල්ල කරන්නේ. ඒ අයගේ සාමාන්‍ය දැනුම ට්‍රැක්ටර් වගේ දේවල් හදා ගන්න පුළුවන්. හැබැයි වාහන තුනක් කැඩුණොත් එහෙම කොහොමද එතුමා හදන්නේ. එමනිසා මේ අමතර කොටස් ඒ අදාල ආයතන වලින්ම ලබා ගන්න.එතකොට ඔය අදාල මුදල් ටයර් එකට පැච් එකක් එහෙම දාන්න අවශ්‍ය වුණොත් , ටයර් එකක් එහෙම දාන්න අවශ්‍ය වුණොත් එහෙම එම මුදල අනුමත කර තියන්න. එය අපට ගැටළුවක් නැහැ. අර ගිය සභාවේත් කිය වුණා. කැබ්එක හදන එක. අර ගිය සභාවේත් කියවුනා කැබ් එකක් තියෙන එකේ වාසිය. එහෙම යෝජනා ආවාට ප්‍රායෝගිකව යම් යම් දේවල් තිබෙනවා. එතකොට ඒ අදාල ආයතන වලින් හෝ එම කැබ් රථයක් අපට ගන්න පුළුවන්. අලුත්ම එකක් ලැබෙනවා. ෂීට් පවා අපට ගහන්න ඕන නැහැ. ඒ සියල්ල එකේ තිබෙනවා. මුළු කැබ්රථයම එනවා. ඉතිං ඒ වගේ දේවල් එදිරිසිංහ වගේ පිළිගත්ත ආයතන තිබෙනවා. මේ එන්ජිම මෙහේ ගලවා ගෙන දඟලන්න ඕන නැහැ. උදේ දුන්නාම හවස හම්බ වෙනවා. මේ එන්ජිම ට්‍රක්එකට පටවා ගෙන උදේ එදිරිසිංහ එකට දුන්නාම හවස 6.00ට එන්ජිම ලබා දෙනවා.

උදේට සවි කළා . වාහනය දිවුවා. මේ විදවා විදවා අරකෙන් මේ කැල්ල ගෙනවා. මේ කැල්ල ගෙනවා. විපාකයක් මේ කරන්නේ. මේ සභාව. එහෙම අවශ්‍ය නැහැ. අද වගකීම් සහිතයි. එන්ජින් අලුත් වැඩියා කටයුතු නම් මේ සභාවෙන් කරන්නම එපා. කිසිම එන්ජිමක් අලුත් වැඩියා කටයුතු කරන්න එපා. සම්පූර්ණයෙන් යවන්න ඒ ඉදිරිසිංහ වගේ පිළිගත් ආයතන වලට. ඒවා හොර ආයතන නෙමේ. අපිත් පුද්ගලිකව එම ආයතන ගැන සහතික කරනවා නම් අපිත් එම ආයතන වලින් එම සේවා ලබා ගන්නවා. ඒවාගේ වංගු මුකුත් නැතිනම් ඒ අය දිනකට මුළු ලංකාවේම එන්ජින් 200ක් 300ක් නැවත තබනවා. ඉතිං මා කියන්නේ ඒවා. ඊළඟ අමතර කොටස් සියල්ලම එම වාහන ආයතන වලින් ගන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ටෙන්ඩර් කරන්න ඕනෙත් නැහැනේ. අපි ඕනේත් නැහැ. කෙලින්ම මිෂුබිෂි ආයතනයෙන් එම කොටස් ගන්න ටෙන්ඩර් එකක් ඕන නැහැනේ. ඒ අදාල සමාගම. පිළිගත්තු සමාගම් රටේ. ඒ අනුමැතිය අපි සභාවෙන් ලබා දෙන්නම්. ඒ අනුව කටයුතු කරන්න. ඊටත් වැඩි මනක්ව ප්‍රායෝගිකව අපි දන්නේ නැහැ කොයි මෙහොතේ කොයි දේ වෙනවාද කියා. එතකොට ඔබතුමි බලයේ තියා ගන්න ඒ අවශ්‍ය ප්‍රමාණයක් රු.30000/= ක හරි අවශ්‍ය ප්‍රමාණයක් අනුමත කර තබා ගන්න. ඒ කටයුතු සඳහා. රු.100,000/= අනුමත කර ගත්තාත් කමක් නැහැ. මා එකගයි. මට කමක් නැහැ. මා අනුමැතිය දෙනවා. හැබැයි මේය කිරිමේදි මේ කාරණා ටික සිහියේ තබා ගන්න. මේ අලුත්වැඩියා කටයුතු කිරිමේදි අදාල ආයතනවලින් අමතර කොටස් ගෙන්වන්න. පලවෙනි එක දැන් අපේ ට්‍රැක්ටර් 10ක් තිබෙනවා නම් එම 10ම එකම වර්ගයේ හෝ වර්ග දෙකක. මේ වර්ග වල අමතර කොටස් ගෙන්වන ආයතන තිබෙනවා වෙනමම. වෙනමම ගෙන්වනවා ඒක. එම ආයතනවලින් අමතර කොටස් ගෙනාවම කිසිම ප්‍රශ්නයකුත් නැහැ. වගකිමකුත් තිබෙනවා. මෙහි වැඩිම මුදලක් යන්නේ අමතර කොටස් වලටනේ. සේවක කුළිය නෙමේ. එය මහින්ද ගරාජයෙන් හරි අත්‍යවශ්‍ය තැනකින් කර ගන්න. සභාව කොට උඩ යන්න බැහැනේ. කැබ් එක හරි ට්‍රැක්ටරයක් හරි කැඩිලානම් මේ අයට හදා ගන්න බැරිනම් ඒ අදාල ආයතනයට දමා ක්ෂණිකව හදාගන්න පුළුවනි. සභාව වියදම් කරලා. නමුත් අර මට්ටමේදි එන්ජිම අලුත්වැඩියා කටයුතු කිරිමට අදාළ පිළිගත් ආයතනයකටත් . අමතර කොටස් සඳහා ඒ වාහනය අදාළ සමාගමෙන් ලබා ගන්නා ලෙසත් කරන ඉල්ලිම කරනවා. නැතිම වුණොත් විතරක් ටෙන්ඩර් කර ගන්න කියන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ කොන්දේසි සභාව දක්වපු විදියට අනුව මෙය ඉල්ලා සිටින්නේ ලේකම්තුමියගේ හා ගණකාධිකාරිතුමියගේ නිර්දේශය පරිදි සභාපතිතුමාගේ අනුමැතිය යටතේ කරන්න කියා. ඒ අනුව කටයුතු කරන් බලය ලබා දෙන්නම්.

**තීරණය-**

වාහන අලුත්වැඩියාවන් සිදුකළ යුතු අවස්ථාවකදී එය වියීමත් පරිදි නියමිත ක්‍රමවේදයකට අනුව කඩිනමින් සිදුකර ගැනීම සඳහා රු.100,000/- ක සීමාව දක්වා අලුත්වැඩියාව සඳහා ගරු සභාපතිතුමාගේ අනුමැතියෙන් එම කාර්යය ඉටුකිරීමට සුදුසු බවට විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව , ලේකම්තුමියගේ,ගණකාධිකාරිතුමියගේ නිර්දේශයෙන් සහ ගරු

සභාපතිතුමාගේ අනුමැතියෙන් එම කාර්යය සිදුකිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:07 මහ අම්බලන්ගොඩ, එම්.ඩබ්.මානෙල් කාන්ති මහත්මියගේ ගෙවත්තේ කසල ඉවත් කිරීම සඳහා කාර්යාලයට ගෙවන ලද රු.1620/-ක මුදල එම සේවය ලබා නොගැනීම හේතුවෙන් නැවත ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එම්.ඩබ්.මානෙල් කාන්ති මහත්මිය , මහ අම්බලන්ගොඩ , අම්බලන්ගොඩ . මුදල් ලබා ගැනිම සම්බන්ධවයි. මාගේ ගෙවත්තේ කසළ ඉවත් කිරිම සඳහා රු.1620ක මුදලක් තැන්පත් කරන ලදී.එම කසල් ඉවත් කිරිම සිදු නොකරන ලදී. මුදල් ලබා දෙන ලෙස ඉල්ලිමක් කරනවා. ආදායමට ලබා ගත්ත බැවින් එම මුදල් ගෙවිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය-**

මහ අම්බලන්ගොඩ, එම්.ඩබ්.මානෙල් කාන්ති මහත්මියගේ ගෙවත්තේ කසල ඉවත් කිරීම සඳහා කාර්යාලයට ගෙවන ලද රු.1620/-ක මුදල එම සේවය ලබා නොගැනීම හේතුවෙන් නැවත ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම මුදල නැවත ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:08 2020 ජනවාරි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ආයතනයෙහි සායන තැබු දින ගණන 22 ½ , ආයතනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව 472, රෝගින් පැමිණිමේ දෛනික සාමාන්‍ය ගණන 21, මාසය සඳහා වැය වු ඖෂධවල මුළු වටිනාකම රු.44702.33, එක් රෝගියෙක් සඳහා වැය වු මුදල රු.94.71

**තීරණය-**

2020 ජනවාරි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**12:09 අම්බලන්ගොඩ වෙරළ පිවිසුම පිරිසිදු කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍ර දේශයට අයත් වෙරළ තීරය හිරේවත්ත , පටබැඳිමුල්ල සහ හෙප්පුමුල්ල යන ග්‍රාම නිලධාරි වසම් තුන යටතේ පරිපාලනය වන අතර සංචාරක ව්‍යාපාරය, හෝටල් සහ ධීවර කර්මාන්තය සිය ජීවනෝපාය කරගත් ප්‍රජාවක් මෙහි වාසය කරනු ලැබේ. ඒ හේතුවෙන් මෙම වෙරළ තීරය අපිරිසිදු විමට ඇති අවස්ථාව වැඩි අතර එබැවින් එය පිරිසිදුව පවත්වා ගෙන යාම සඳහා වැඩි අවධානයක් සහ පරිශ්‍රමයක් දැරිය යුතුව ඇත. වෙරළ සහ වරායන්හි අපද්‍රව්‍ය කළමනාකරනය සඳහා 2020/02/26 දින අම්බලන්ගොඩ නගර සභා , සභාපතිතුමාගේ මුලිකත්වයෙන් නගර සභා ශ්‍රවණාගාරයේ පැවති රැස්විම අනුව අම්බලන්ගොඩ නගර සිමාවට අයත් වෙරළ තීරය පිරිසිදුව සහ ආකාර්ෂණියව පවත්වා ගැනීම සම්බන්ධව අවධානය යොමු කරන ලදී. එහිදි වෙරළ තීරය වරින් වර ශ්‍රමදාන ආදිය පවත්වා පිරිසිදු කරන නමුත් අඛණ්ඩව එහි පිරිසිදු බව පවත්වා ගැනීම ගැටළුවක් බවක් එම නිසා අඛණ්ඩව වෙරළ පිරිසිදුව පවත්වා ගැනීම සඳහා වෙනම කණ්ඩායමක් යොදවා ගැනීම කාලෝචිත බවත් අනාවරණය විය. තවද එම කමිටුවේදි රු.6,000/= ක මාසික දිමනාවක් ගෙවිමට යටත්ව ග්‍රාම නිලධාරි වසම් එකකට දෙදෙනෙකු බැගින් නියෝජනය වන පරිදි අර්ද කාලීනව ( Part Time) සේවකයින් හය දෙනෙක් යොදවා ගැනීම සහ එකතු කරනු ලබන නොදිරණ කසල එම අයටම විකුණා ගැනීමට අවස්ථාව ලබා දීම සුදුසු බවත් ගරු සභාවට යෝජනා කරනවා. අපි මේ කමිටුව ගත්ත තීන්දුවක් තමයි. ඒ කමිටුව තමයි ප්‍රාදේශිය වෙරළ බඩ පළාත් කමිටුවෙන් ක්‍රියාත්මක වෙනවා. ශ්‍රී ලංකා වෙරළබඩ වරායෙන් අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරිම පළාත් පාලන එකේ. ඒ අනුව පළාත් ආයතනයේ සභාපති පළාත් පාලන ආයතනයේ ලේකම් , පළාත් පාලන ආයතනයේ තාක්ෂණ නිලධාරි, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, ප්‍රදේශයේ පරිසර අංශයේ ස්ථානාධිපති, සමුද්‍ර පරිසර ආරක්ෂක නිලධාරි කැඳවුම්කරු වෙන්න ඕන. මධ්‍යම පරිසර අධිකාරයේ නිලධාරියෙකු , වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක නිලධාරියෙකුත්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියෙකුත් , ධිවර හා ජලජ සම්පත් නිලධාරියෙකුත් , ශ්‍රී ලංකා වරාය නිතිගත සංස්ථාවේ නිලධාරියෙකුත් , ප්‍රදේශයේ පරිසර

සංවර්ධන නියෝජිතයන් දෙදෙනෙකුත් අයත් වෙන සේ මෙම කමිටුව ගොඩ නගා තිබෙනවා. එ මඟින් තමයි තීන්දු කළේ . මේ යෝජනාව කරනවා. මෙය අනුමත කරන්න. ස්ථිර කරන්න මුලින්ම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ඉගෙන ගන්න ළමුන් උදේ 7.00ට බැස්සාට පසු ඔය දිගටම සුද්ද කරනවා. බෑග් වල දමා අරගෙන ඇවිත් එක ගොඩකට ගසා දමා යනවා. මා දන්නේ නැහැ ඌරවත්තේ සිට කහව දක්වා විදේශිකයන් බැහැලා. 10ක් 20ක් විතර යනවා බෑග් අරගෙන. බෝතල් එහෙම බෑග්වල දමාගෙන ඇවිත් ඔක්කොම ගෙනවිත් දමන්නේ ඌරවත්තේ පාලම ගාවට ගොඩ ගසනවා. ඉතිං ඔය රු.6000ක් වගේ තුන් හතර දෙනෙකුට පඩි ගෙවන්නේ අපාරාදයක්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදී අප අපේක්ෂා කළේ සමහර වේලාවට විතරක් විදේශ ළමයින් ඇවිත් ඒ දේ කරනවා. ඒ කරන්නේ ඔබතුමාගේ වෙරළ පැත්තේ විතරයි. මේ අපේ හිරේවත්ත , පටබැඳිමුල්ල, හෙප්පුමුල්ල කියන කොට්ඨාශ තුනම ආකර්ෂණීය ලෙස සංචාරක කලාපයක් ලෙස දියුණු කිරිමට උනාන්දු කිරිමට තමයි මෙය කරන්නේ. කලින් අපි කල්පනා කළේ එක සේවකයෙක් යොදන්න. ඒ එක සේවකයා යොදන්න අපට රු.36000/= ක වියදම යනවා. නමුත් මේ කමිටුව මඟින් යෝජනා කර තිබෙනවා. මෙය දැනට තංගල්ල නගර සභාව කරනවා. තංගල්ල නගර සභාවේ මේ විදියට බඳවා ගත් සේවකයින් 24කු සිටිනවා. ඒ ගොල්ලන්ට මෙය රැකියාවට අමතරව කරන රැකියාවක්. මෙය රැකියාවක් නෙමේ. එයාට කොටසක් භාර දීලා තිබෙනවා. එයා මේ කොටස හැමදාම පිරිසිදුව තබා ගත යුතුයි. රු.6000/= ක් ගෙවනවා මාසයකට. එතකොට අපි බැලුවේ එක් කෙනෙකු යොදවනවාට වඩා හය දෙනෙකු යොදවන්න. එක් අයෙකුගේ පඩිය තමයි යන්නේ. නමුත් මෙය සම්පූර්ණ රැකියාවක් නොවන නිසා එයාට භාරදීලා තිබෙනවා මෙතැන සිට මෙතැනට ඔයා පිරිසිදු කරගෙන ඉන්න ඕන. එතකොට ඒ ටික කරනවා. ගෙදර කන බොන උයන ගමන් කරන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔය රු.6000/= ගෙවන්නේ කී දෙනෙකුටද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක්කෙනෙකුට රු.6000/= යි . රු.36000/= ක් යනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, කලාපය අපි බැලුවොත් එහෙම අපිට අයිති වෙන්නේ හිරේවත්ත පාලම මොදර දේවාල එතැන කොනේ සිට වරාය ගාවටත් , ඊළඟට ෂැන්ග්‍රිල්ලා එක ළඟ සිට සොහොන ගාවටත් සොහොන ගාව සිට ආපසු පොලිසිය පිටු පසටත් . එතකොට කලාප වල බැලුවාම වරාය කලාපය අපිට අයිති නැහැ. වාරාය වාරාය විසින් පිරිසිදු කර ගන්නවා. වරාය සියළුම බෝට්ටු වලින් මුදල් අය කරනවා. වරායට ඇතුල් වෙන්නත් අය කරනවා. වැලි අඳිනවටත් අය කරනවා. ඒ කරන ගමන් අපට දමනවා වියදම් යන ඒවා වාරාය. ඒක වැරදියි. ඒක මා කොහොත්ම අනුමත කරන්නේ නැහැ. හැබැයි අපේ කලාපය පිරිසිදු කර ගැනිමට ඔබතුමා සමඟ එකඟයි. අනිවාර්යෙන්ම එය අපි පිරිසිදු කරන්න ඕන. හැබැයි ඕක දවල් රෑ දෙකක් අවශ්‍ය නැහැ. රෑ කවුද ඕක පිරිසිදු කරන්නේ. දවාල්ට විතරයිනේ. සේවා මුරයක් අවශ්‍ය නැහැනේ. අනික තමුන්නාසේගේ ඔය ගමේ නැති බැරි කෙනෙකුට ඔය රක්ෂාව දෙන්න. එකට කමක් නැහැ. ඒ මනුස්සයා ගෙදර වැඩ කරගෙන ඉන්න ගමන් හරි පිරිසිදු කරගෙන ඉන්න කියන්න. මේ අමුතුවෙන් මේ කොහේවත් යන මිනිසුන්ට රක්ෂාවල් දෙන්න යන්න එපා. එතකොට හෙප්පුමුල්ල කැල්ලේ ඔය බැරැක්කේ බලාගෙන සිටින එහි පදිංචි කාට හරි ඔය රක්ෂාව දෙන්න. ඔය ආටලා හරි ඒ වගේ ඉන්නවානේ වෙරළේම ඉන්න අය. එහෙම කෙනෙකුට කිවුවාම ඒ අය එය වගකිමෙන් කරනවා. ඔය සංචාරක ව්‍යාපාරයට අයිති කෙනෙකුට ඕන ඕක දෙන්න. ආවාට ගියාට නෙමේ. එයාටයි කැක්කුම තිබෙන්නේ. ඒ අය තමයි සංචාරකයින් සමඟ එන්නේ. ඔය කිවුවා වගේම අර එන්ජී.ඕලා වගේ ඔය තරුණ ළමයින් ගෙන්වන ආයතන 10කට වඩා තිබෙනවා. වරින් වර. මේ දිනවල ඔවුන් පැමිණෙන කාලය නෙමේ නිසා තමයි නැත්තේ. ඒ අය නිරන්තරයෙන්ම මෙය පිරිසිදු කරනවා. ඒ අය ගෙන්වා ඔය කැප්ටන්ලා ඒ අයගෙන් අහන්න අපි නගර සභාවෙන් කෙරෙන්න ඕන මොනවාද කියා. මේ ටික ඇඳ ගන්නනේ ඔනේ. ඉතිං ඒ අය ඉතිරි ටික කරනවා. එමනිසා අපි සභාවේ මුදල් වියදම් කරන්න ඕන නැහැ. සම්බන්ධිකරණයයි අවශ්‍ය . අර මා කිවු ආකාරයට ඔබතුමාගේ ප්‍රදේශයේ දෙදෙනෙකුට රක්ෂාවල් දෙකක් දෙන්න. උදේ 6.00 සිට සවස 6.00 වෙනකම් මෙය පිරිසිදු කර තියා ගන්න. මාසයකට රු.10000/= ගෙව්වාත් කමක් නැහැ . එතකොට දෙදෙනෙකුට රු.20000/= යන්නේ. එතකොට ගෙදරක කාන්තාවකට රෙදි ඒවා විකුණා ගන්න බලපත්‍රයකුත් එක්ක ඒ මනුස්සයා එකත් කරනවා. අරකත් කරනවා. කවුරු හරි තැඹිලි ගෙඩිය කාලා ගියානම් ඒ මනුස්සයා එය අස්කර කසළ බඳුනට දමනවා. බෑග් එකට. අපට අවශේෂ වශයෙන් පොහොර බෑග් ටිකක් දෙන්න වෙයි. ඉල්ලිම කරන කොට. එතකොට එයා කසළ බෑග් එක ට්‍රැක්ටරයට දමයි. තංගල්ල වගේ ලොකු සංචාරක තීරයක් අපට නැහැනේ. හෝටල් 10ක් 15ක් තිබෙන්නේ. ඒ අය සමඟ සාකච්ඡා කළත් ඒ අයත් උදවු කරයි. ඔය කසළ බෑග් දිම ඒ අය අනිවාර්යෙන්ම දෙයි. අපි මාස්පතා සභාවක් විදියට ජාතික අපරාදයක් වෙනවා අනිත් පැත්තෙන්. අනිත් එක ඔහොම දුන්නාම ඒ අය එය කරන්නේ පැයයි. ගණන්වත් ගන්නේ නැහැ. ඕක දෙන්න ඕන වැල්ලේ සිටින මනුස්සයකුට. වැල්ලේ සංචාරකයින් සමඟ ඒ අයගේ පස්සෙන් යන මනුස්සයකුට තමයි මෙය දිය යුත්තේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එහෙම අය තමයි තෝරාලා දෙන්න බලාපොරෝත්තු වෙන්නේ. දැන් කමිටුවක් වශයෙන් අපි මාසිකව රැස්විමක් තියෙනවා. එම රැස්විම තියෙන කොට මේ සියළු දෙනා ඇවිත් වෙරළ පවිත්‍රතව තියා ගැනිම , වෙරළ සාමාන්‍යයෙන් දූෂණ වෙන තැන් ඒ වගේ දේවල්. දැන් ගිය සුමානේ ගියා වැඩ සටහනක් එහෙම නිලධාරින් එකතු වෙලා. ඉතිං අපි මෙය අනුමත කරලා වැඩය කරන්නම්. හොඳ වැඩක්.

**තීරණය-**

වෙරළ තීරය පිරිසිඳු කිරීම සඳහා කණ්ඩායමක් බඳවා ගැනීම සම්බන්ධව පරිසර විෂය නිලධාරී විසින් ඉදිරිපත් කළ ලිපිය අනුව වෙරළ තීරය පිරිසිඳු කිරීම සඳහා කණ්ඩායමක් බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:10 යෙහන්සා ඇඩ්වර්ටයිසින් සොලියුෂන් ආයතනය මගින් බස් නැවතුම්පොළ ඉදිරිපිට ඇති භූමියේ ඩිජිටල් දැන්වීම් පුවරුවක් ස්ථාපනය කිරීමට අවසර ඉල්ලා එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

යෙහන්සා ඇඩ්වර්ටයිසින් සොලියුෂන් ආයතනය. මා මේ කියන්නේ එම වාර්තාව. මෙම ව්‍යාපෘතිය මගින් අඩි15*08 LED දැන්විම් පුවරුවක් අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ඉදිරිපිට ස්ථාපනය කිරීම. ඒ සඳහා ආදයම් පරික්ෂක වාර්තාව. බස්නැවතුම්පොළ ඉදිරිපිට ත්‍රි රෝද රථ ගාලක් ඇති අතර . ගාල්ල දෙසට මායම්වෙන්න පුවරුව ස්ථාපනය කිරිමට සුදුසු බවට යෝජනා කරනවා. එම පුවරුව ස්ථාපනය කිරිම හා නඩත්තු කිරිම ආදිය සියළු වියදම් එම ආයතනය මඟින් දරණ අතර මාසිකව ලැබෙන ආදායමෙන් 10% ක ප්‍රමාණයක් නගර සභාවට ගෙවිමට ඔවුන් එකඟ වි ඇත. ඔවුන්ගේ යෝජිත අවම පැකේජය අනුව ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇති අනුව රු.35000/= ක මුදලක් නගර සභාවට ගෙවිමට නියමිත ඇත. ඒ අනුව වර්ෂයකට රු444000/= ක මුදලක් නගර සභාවට ලැබේ. එම මුදල ඉදිරිපත් කර ඇත්තේ ඔවුන්ගේ අවම පැකේජය මසකට දැන්විම් 15ක් සඳහා වන අතර වර්තමානයේ පෝස්ටර් හා කටවුට් සිමා නිසා මෙම දැන්වීම් ප්‍රමාණය ඉහළ යා හැකි බැවින් මෙවැනි දැන්විම් පුවරු සඳහා මහජනතාව වැඩි ප්‍රවණතාවයක් දක්වන බැවින් නගර සභාව වෙත ලැබෙන ආදායම ඉහළ යා හැක. දැනට නගර සභාව විසින් දැන්විම් පුවරු සඳහා අවසර ලද ක්‍රමවේදය අනුගමනය කළහොත් නගර සභාව වෙත ලැබිය හැක්කේ රු.120000/= ක් පමණි. එබැවින් ඔවුන් විසින් යෝජිත ආදායම 10%ක ප්‍රමාණයක්

අයකිරිම වඩා වාසිදායක බැවින් අයකිරිම සුදුසු බවට යෝජනා කරන අතර බිම් බද්දෙන් වාර්ෂිකව රු.30000/= මුදලක් අයකිරිම සුදුසු බවට යෝජනා කරනවා. එම කොන්දේසි වලට අනුව ගිවිසුම්ගත කිරිම සුදුසු බවට යෝජනා කරනවා. බස්නැවතුම්පොළ ඉදිරිපිට.

01. දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන සියළු දැන්වීම් ප්‍රදර්ශනය කිරිමට නගර සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

02. නගර සභාව විසින් මහජනතාව දැනුවත් කිරිම සඳහා දැන්වීමක් පලකිරිමේදි එම දැන්වීම් සියළු ගාස්තු අයකිරිම් වලින් නිදහස් විය යුතුය.

03. මාසයක් තුළ ප්‍රදර්ශනය කරන දැන්වීම් සංඛ්‍යාව ඒ සඳහා අයකරන මුදල් කොපමණද යන්න පිළිබඳ සවිස්තර විස්තර වාර්තාවක් නගර සභාවට එවිය යුතු අතර ඊළඟ මාසයේ 10වෙනිදිනට පෙර නගර සභාවට ගෙවිය යුතුය.

04. අනුයාතික මාස තුනකදි නගර සභාවට මුදල් ගෙවිම පැහැර හැරියොත් දැන්වීම් පුරුවේ සම්පූර්ණ අයිතිය නගර සභාව සතු වන අතර මෙම දැන්වීම් පුවරුව නගර සභාව මඟින් කළමනාකරණය කළ යුතුයි කියා දමා තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි. මෙම දැන්වීමකට කියක් දෙනවාද

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

10% ක් පමණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

අපේ දැන්වීමකට අය කරන්නේ කොහොමද ? වර්ග අඩි ගණනට.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේ ඔයාගේ රු.30000/= තිබෙනවා නේද? ඔයා අහලා බලන්න බස්නැවතුම්පොළ ඉදිරිපිට තිබෙන බෝඩ් එකට කියක් අය කරනවාද කියා. ඔයාගේ තක්සේරුව සම්පූර්ණ වැරදියි.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ආර්.එම් . ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

බිමට තක්සේරු කරන්නේ කොහොමද?

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒක තමයි. අම්බලන්ගොඩ බස්නැවතුම්පොල ඉදිරිපිට දැන්වීම් පුවරුවකට ලක්ෂ 1 ½ ක් ගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම් . ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ලක්ෂ 1 ½ ටත් වැඩියේ ගන්න පුළුවන්.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මෙහි ආදායමක් අපට දෙනවා කියන නිසා ප්‍රශ්නයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , ඒ අය අපගෙන් දැන්විම් අරගෙන කරන ආරංචියක් තිබෙනවා. ඊට පරිබාහිරව මා මතක් කර සිටිනවා දේශපාලන දැන්විම් වලට අවසර දෙන්න එපා කියා. විශාල ප්‍රශ්නයක් වෙනවා මෙය ඒ පාර. එය අයින් කරන්න කියන්න. ඊළඟට ඒ අයගේ තාක්ෂණික ප්‍රශ්න නිසා වෙළඳ දැන්වීම් වල ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. එක අපට අදාළ නැහැනේ. එතකොට මෙයට සහන ඉල්ලන්න එපා. නිදහස් කිරිම් ඉල්ලන්න එපා කියන්න. වෙළඳ දැන්වීම් වල එක දෙන්න ගියොත් එහෙම.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා කියන්නේ ඕක හොඳ දෙයක්. මේ වගේ ලස්සන දෙයක් එන එක. නැතිනම් නගරයේ හැම තැනම පෝස්ටර්, බැනර් එල්ලනවා. අපට සමහර ආයතන වලින් බෝඩ් ගහනවා . අපට සතයක වත් මුදලක් ලැබෙන්නේ නැහැ. දැනටමත් අපේ භූමියට රුපියලක්වත් ගෙවන්නේ නැහැ. ඇත්තටම මෙය නගරයට ලස්සනයි. ඕනෑම පුද්ගලයෙකුට වුණත් බස්රථයකට නැග්ගාම වුණත් බලන් ඉන්න පුළුවන්. එයට මේ මහත්වරුන් අපට 10%ක මුදලකුත් ගෙවනවා. මා නම් කැමතියි මේ ආයතනයට මේ බෝඩ් එක දෙන්න. මෙය සැලැස්මක් ඇඳ අයිනකින් සකස් කර දෙන්න. මෙය ලස්සනයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි දෙන්න. බස්නැවතුම්පොළ ඉදිරිපිට ත්‍රී රෝද රථ ගාලට දිලා අපි තවමත් එය අයින් කර ගන්න බැහැ. අර සපත්තු මහන තුන් හුලස් තැන අන්න එතැන දෙන්න. අපට එතැනට මොකකටවත් යන්න බැහැ. අපේ ඉඩම් කැල්ලේ දෙන එක නෙමේ. අතන හොඳට නාම පුවරුව

හොඳට පෙනෙනවා. මොකද එතැන දැන් අනවශ්‍ය විදියට වෙළදාම් කරනවා. එම ස්ථානය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හරි ගිවිසුම් අත්සන් කරනවා නම් අපට පිටපත් ලබා දෙන්න. මොකද හේතුව යම් යම් ගිවිසුම් අත්සන් කර දැන් ගැටළු ඇතිවී තිබෙනවා. දැන් උදාහරණයක් විදියට තනායමේ ගිවිසුම අත්සන් කරලා දැන් උතුර දකුණ හොයා ගන්න බැරිව ඉන්නේ. එමනිසා ගිවිසුමක් අත්සන් කරන විට පිටපතක් අපට දෙන්න. අපි කැමතියි. හැබැයි උපරිම දායකත්වය නගර සභාවට ලැබෙන්න ඕන. මොකද මේ වෙළඳ වටිනාකමක් තිබෙන ස්ථානයකි. එක්කෙනෙකුටම දෙන්න කියා එකක් නැහැ. මෙය මිල ගණන් කැඳවා තව ආයතනත් ඕක ගන්නවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ වෙනුවෙන් තීන්දුවක් ගැනිමට අපි කමිටුවක් පත් කරනවා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ නායකත්වයෙන් අපි කමිටුවක් පත් කරනවා. ඔගොල්ලන්ම තීන්දු කර දෙන්න සභාවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම් . ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔතැන ගොඩනැඟිල්ලක් ගහන්න  ඉඩ තියා ලබා දෙන්න. නැතිනම් අයින් කරන්න බැරි වුණොත් එහෙම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ත්‍රිවිල් වලින් එන්නේ නැහැ සතයක්වත්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අර කලින් කමිටුවක් පත් කළානේ. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා හා මාත් දෙදෙනෙකු පමණයි ඉන්නේ. එය තුන්දෙනෙකු කරන්න. එයට ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාත් ඇතුළත් කරන්න. දෙදෙනෙකු සිටියාම මෙය හරියට කරන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මොකක්ද කමිටුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අර ප්‍රචාරක දැන්වීම් පුවරුව දමන එකට.

**තීරණය-**

යෙහන්සා ඇඩ්වර්ටයිසින් සොලියුෂන් ආයතනය මගින් බස් නැවතුම්පොළ ඉදිරිපිට ඇති භූමියේ ඩිජිටල් දැන්වීම් පුවරුවක් ස්ථාපනය කිරීමට අවසර ඉල්ලා එවා ඇති ලිපියට අනුව තීරණයක් ගැනීම සඳහා පහත නම් සඳහන් මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කරන බවත් ඉන් පසු තීරණයක් ලබාදීම සුදුසු බවත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

01. ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා
02. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා
03. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා

**12:11 2019.12.31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මණ්ඩලයක් පත්කිරිම සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.12.31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මණ්ඩලයක් පත්කිරිම. ගරු මන්ත්‍රිවරු තිදෙනෙක් නම් කරන්න. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා, ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මියත් මෙයට සහභාගි වෙන්න. මා මේ බලන්නේ මේ වගේ දේවල් විනිවිදභාවයක් ඇතිව සිදු කරන්න. වැඩිපුරම විපක්ෂයේ ගරු මන්ත්‍රිවරු සහභාගි වුණාම හොඳයි. මොකද එතකොට අපිට චෝදනාවක් එන්නේ නැහැ. වරදක් තිබෙනවා නම් එතැනම නවතිනවා. එම මන්ත්‍රිවරු තිදෙනා අපි නම් කරනවා. එතකොට විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරිමට ඒ නම්කරන ලද ගරු මන්ත්‍රිවරු තිදෙනාම අපි නම් කරනවා.

**තීරණය-**

2019.12.31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත්කිරීම සුදුසු බවට ගරු

සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>භාණ්ඩ සමීක්ෂණයට අදාලව වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා පත්කරන මන්ත්‍රීවරුන්</u>

01. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රිනී චම්පා සුමුදු කුමාරි මහත්මිය

12:12

**තීරණය-**

2019.12.31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම සඳහා මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත්කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

<u>භාණ්ඩ සමීක්ෂණයට අදාලව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම සඳහා පත්කරන මන්ත්‍රීවරුන්</u>

01. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා

02. ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා

03. ගරු නගර සභා මන්ත්‍රිනී චම්පා සුමුදු කුමාරි මහත්මිය

**12:13 මෝදර දේවාල පාර යෝජිත හෝටල් ව්‍යාපෘතියේ මූලික සැලසුම් නිරාකරණ පිළිබඳව එවා ඇති වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෝදර දේවාල පාර යෝජිත හෝටල් ව්‍යාපෘතියේ මූලික සැලසුම් නිරාකරණ පිළිබඳව එවා ඇති වාර්තාව. මෝදර දේවාල පාර අංක 35. මේ අම්බලන්ගොඩ තනායම සම්බන්ධයෙන්. මෙන්න මේ කොන්දේසි දමා තිබෙනවා. ඒ කොන්දේසි අනුව

01. යෝජිත සංවර්ධන කාර්ය සඳහා සැලසුම් අනුමත කිරිම නාගරික සංවර්ධන අධිකාරියේ 392 මුලික සැලසුම් නිරාකරණය කිරිම. කියන එක. 392 නම් දරණ අතිවිශේෂ රෙගුලාසි

නම් දරණ සංශෝධිත ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතු අතර ඉදිකිරිම් හා සංවර්ධන බලපත්‍රයක් නාගරික සංවර්ධන අධිකාරිය , ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන් ලබා ගත යුතුය.

02. පහත සඳහන් නිර්දේශ මධ්‍යම පරිසර අධිකාරිය පරිසර සංවර්ධන අධිකාරිය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, විදුලි බල මණ්ඩලය, ජාතික ජලපාවහන මණ්ඩලය.

මෙන්න මේ යෝජනාව සම්බන්ධයෙන් තමයි සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. මෝදර දේවාල භූමියට ඊසාන දිගින් පවතින මෝදර දේවාල පාර අඩි 30 ක් වන සේ පුළුල් කිරිම සඳහා යෝජිත භූමියෙන් ඉඩමට වෙන්කළ යුතු අතර එම ඉඩමට අදාල අනුබෙදුම් සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමත කර ගත යුතුය. ඒ අනුව ඉඩම සතු නගර සභාවට. අපේ මේක අනුව තිබෙන්නේ අඩි 20කි. එය අඩි 30 දක්වා පුළුල් කරන්න කියා ඉල්ලිමක් කරනවා නාගරික සංවර්ධන අධිකාරියේ හොටල් ව්‍යාපෘතියෙන්. ඒ අනුව එයට සභාවේ අනුමැතිය ලබා දිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න. එක හොඳයි . එම පාර පුළුල් වන එක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දෙන එකට ගැටළුවක් නැහැ. දැන් මේ සභාවේ ගන්න තින්දු පිළිබඳ මා බලවත් කනගාටුව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. දැනට මාස 4කට ඉහත දි මා හිතන්නේ අපි සභාවේදි මේ සියළු මන්ත්‍රිවරු කතා වෙලා එකඟ වෙලා යෝජනාවක් සම්මත වුණා. මේ තානායම පිළිබඳව අධ්‍යනය කිරිම සඳහා අම්බලන්ගොඩ නිතිඥ මහතුන් තිදෙනෙකුගේ නම් සමඟින්. මා ගරු ලේකම්තුමියගෙන් අහන්න කැමතියි . අද වෙනකොට ඒ නිතිඥවරු තිදෙනා දැනුවත් කිරිම පිළිබඳව. මොකද සභාවේ මේ මන්ත්‍රිවරු ගෙන එනු ලබන යෝජනා හැල්ලුවට ලක් කරනවා නම් අපි සභාවට යෝජනා ගෙන එන්නෙත් නැහැ. මේ සභාවේ අත්සන ගසා පිටවෙලා යන තත්ත්වයට පත් කරන්න එපා. අපි හැමදේටම එකතුවෙලා එනවා. හැබැයි සභාවේ යම්කිසි වැදගත් දෙයකට තින්දුවක් ගත්තාම ඒ තින්දුව අකර්මරණ කරන්න එපා. ඔබතුමිය කියන්න මොකක්ද ගත්ත තින්දුව. එතකොට මේ නිතිඥවරු ලිඛිතව දැනුවත් කර තිබෙනවාද? කවුද මේ දැනුවත් කිරිම කළ නිලධාරිනිය. මොකද මාත් , ගරු උප සභාපතිතුමාතේ මේ තින්දුව ගෙන එනු ලැබුවේ. මොකද

මාස 4කට වැඩියි. මේ මාස 4කට වැඩි තින්දුවක්. මා බලාගෙන හිටියේ මේ මොකක් හරි තනායමේ එකක් එනකම්. ගත්ත තින්දුව ගැන අහන්න. එතකන් මා මෙය කතා කරන්න නැතිව හිටියේ. මොකද මේහෙම තින්දු ගෙන ක්‍රියාත්මක නොවුණාම ගරු මන්ත්‍රිවරු හැල්ලුවට ලක්වෙනවා. අපි තින්දුවක් ගන්නවා . සම්මත කරනවා. අපි පක්ෂ විපක්ෂ කිසි භේදයක් නැහැ. හොඳ දේවල් වලදි අපි එකඟ වෙනවා. හැම දේටම එකඟ වෙනවා. එතකොට ගෙන එනු ලබන තින්දුවක් ක්‍රියත්මක කරන්නේ නැතිනම් සභාවේ අපේ තිබෙන ගරුත්වය මොකක්ද? මේ මන්ත්‍රී ධුරය නිකං සුදු ඇඳගත් පිඩොරයක් ගහා ගත්ත අපි විතරද? සභාවේ රූකඩද අපි? මෙතනින් එහාට යන්න බැහැ. ගත්ත ක්‍රියා මාර්ගය අවශ්‍යයි. නිතිඥවරු තිදෙනාම මා පුද්ගලිකව හඳුනනවා. මා අද කතා කර බැලුවා. එක්කෙනෙකු පමණයි සම්බන්ධ නැත්තේ. අපේ ගරු මන්ත්‍රී තුමා යෝජනා කළ බලපිටියේ නිතිඥ මහතෙකු. ඔබතුමා කතා කර අහන්න . එතුමාට කතා කළාද කියා. අනිත් කෙනා අපි කිවුවා අපේ සමන් තාබ්‍රෙව් නිතිඥතුමා. අනිත් කෙනා ලූෂාන් වඩුතන්ත්‍රි. එතකොට මේ ඔක්කොම දන්න මිනිසුන්. නගරයට ආදරය මිනිසුන්. තනායමට ආදරය මිනිසුන්. එතකොට පිටින් ගෙනවිත් අපි මෙය කරන්න ඕන නැහැ. දැන් මෙතුමා ගරු සභාපතිවරයා විදියට නිතිඥයෙක් වුණත් එතුමාට මෙය දුන්නා නම් එතුමාට මුළු කුණුගොඩවල් ඔක්කොම ටික එනවා. එමනිසා එහෙම ගාවන්න ඕන නැහැ කවුරුවත්. අපි මේ සභාවේ සියළු මන්ත්‍රිවරුන්ට මෙය බලපානවා. අම්බලන්ගොඩ මිනිසුන් කෙළ ගසනවා යම් දිනයක. මේ වැරදි තින්දු මෙතැන අනුමත කරලා. එමනිසා තමයි ගරු උප සභාපතිතුමාත් මාත් මේ ගැන කතා කළේ. ඇත්තටම අවංකවම මේ පිළිබඳව කනගාටු වෙනවා. මේ පිළිබඳව කිසිදු දැනුවත් කිරිමක් මේ සභාව කළේ නැහැ. ලේකම්තුමිය මේ පිළිබඳව ඔබතුමිය ගැන මාගේ බලවත් අප්‍රසාදය ප්‍රකාශ කරනවා. මෙතැන මේ ගරු මන්ත්‍රිවරු ගන්න තින්දු තීරණ පිළිබඳව ලේකම්තුමිය විදියට ඔබතුමිය වගකිව යුතුයි. එවාට ගන්න ක්‍රියාමාර්ග පිළිබඳව ඔබතුමිය වගකිව යුතුයි. ඔබතුමිය දන්නේ නැතිනම් මේ ආඥා පණත් කියවන්න. ආඥා පණත් වල තිබෙනවා බොහොම පැහැදිලිව. ඒ තත්ත්වයට අපි පත් කරන්න එපා. අපිටත් කේන්ති යනවා මේවාට. අපි ඔක්කොටම දෙනවානේ අනුමැතිය. හැම දෙයටම ලබා දි තිබෙනවා. මෙය නගරයට බලපාන සිද්ධියක්. නගරයේ මිනිසුන් බලාගෙන සිටිනවා මේ සිද්ධිය පිළිබඳව. මලගෙදරකදි, කොළම මලගෙදරකදි, මාතර මලගෙදරකදි මෙය අහනවා. තාම නැද්ද ? මොකක්ද වෙලා තිබෙන්නේ. අපෙන් අහනවා. අපි හැමතැනම යන මිනිසුන්. එමනිසා ගරු ලේකම්තුමිය මේ පිළිබඳ ගත්ත ක්‍රියා මාර්ග ගැන අද කතා කරනවා අනිත් නිතිඥ මහත්වරු දෙදෙනාට. හැබැයි බොරු කියා තිබුණොත් ඔය නිලධාරිතුමිය ඊළඟ සභාවට

වහාම ගෙන්වන්න. මෙතැන මේ තනායම පිළිබඳ කිසිම දෙයකට මාගේ ගරු මන්ත්‍රීවරු අපි අනුමැතිය දෙන්නේ නැහැ. ඔය දේවල් ඉටු වෙනකම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා තිබෙන්නේ පාර පුළුල් කිරීම සම්බන්ධව. දැන් නාගරික සංවර්ධන අධිකාරිය පාර පුළුල් කරන කොටස සම්බන්ධව අපි දැනුවත් වීමක් නැහැ. විස්තර ලබා දෙන්න. කොහොමද පළල් වන ආකාරය, කොහොමද යන විදිය කියන ආකාරය. ඔහේ නිකන් දමා. නාගරික සංවර්ධන අධිකාරිය ගැන අපේ කිසිම විශ්වාසයක් නැහැ. මොකද හේතුව මේ අම්බලන්ගොඩ නගරයේ ඔබතුමා සැලසුම් කමිටුවේ සිටිනවා. මා හිතන්නේ ගරු උප සභාපතිතුමාත් සිටිනවා. මේ සැලසුම් කමිටුවට සහභාගී වෙනවා නගර සභාවේ දායකත්වය තුළ . පසුගිය වකවානුවේ මුහුදු කරයේ සැලසුම් අනුමත කිරීම නාගරික සංවර්ධන අධිකාරියට දමා තිබුණා. බලන්න ගරු සභාපතිතුමනි, ඔබතුමාට තමයි බනින්නේ. ඔබතුමා මේක දන්නේ නැහැ. ඔබතුමාට කරන්න දෙයකුත් නැහැ. නමුත් නාගරික සංවර්ධන අධිකාරිය කරන වැඩ පසුගිය සභාවේදිත් කතා වුණා. ගොඩනැඟිලි හදනවා. සුසාන භූමිය පාරේ එකක් හදා තිබෙනවා. කොහොම හදලාද මන් දන්නේ නැහැ. මේ නීති වලට ගැලපෙන්නෙම නැහැ. එමනිසා මා ඉල්ලා සිටිනවා මේ නාගරික සංවර්ධන අධිකාරිය කරන කාර්යයන් පිළිබඳව ඔබතුමා මීට වඩා අවබෝධයක් අරගෙන කරන වැඩපිළවල සම්බන්ධව අධික්ෂණය කර ගන්න. මෙතැන සමහර වේලාවට හරියට පෙන්වා දීලා යනවා ඇති. නමුත් වෙන්නේ වෙන කතන්දරයකි. ඒවා මිනිසුන් කතා වෙනවා. දැන් ඔබතුමාටත් දොස් කිවුවාම අපිත් පැහැදිලි කර දෙනවා. මේ ආකාරයෙනුයි කෙරෙන්නේ කියා. නමුත් ජනතාවගේ දැඩි මතයක් තිබෙනවා නගර සභාව සම්බන්ධව. මේ නගර සභාව සම්බන්ධව වැරදි මතය යන්නේ මේ පිළිබඳව නිසි දැනුවත් වීම යි. මේ පෙනි පෙනි ජේන එවා. මේ සැලසුම් අනුමත කර ගොඩනැඟිලි හදන එවායේ නිති විරෝධි තැන් තිබෙනවා කියා. මා දන්නේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරියෙන් වාර්තාවක් ගන්න. ලබන සභාවේදි හරි මා ඉල්ලන්න ඉන්නේ. මෙතෙක් මේ බලය ගියාට පසු මේ ගොඩනැඟිලි සඳහා කොච්චර අනුමත වෙලා තිබෙනවාද? මොකද අපිත් අනුමත කරනවා ඔබතුමාලගේ සැලසුම් කමිටුවට මුදල් දීමනා ගෙවීමට. එක නිසා. ඔබතුමාට කරන්න දෙයකුත් නැහැ. නමුත් බැණුම් අහන්නේ නගර සභාව.මේ ක නිසා. මා හිතන්නේ අපේ තාක්ෂණසේවා නිලධාරිත් සම්බන්ධ වෙනවා. මේ ගොඩනැඟිලි ඉදිකිරීම සම්බන්ධව අපිට ගොඩක් ප්‍රශ්න ගැටළු තිබෙනවා. ඔය අනුමත කළාට . ඔය කරන වැඩපිළිවල අපේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම දැනුවත් කරන්න. පාර පළල් කිරීම

පිළිබඳව.කොහොමද පළල් වන ආකාරය , කොච්චර දිගද? මොකද මෙතනින් අපි අනුමැතිය දුන්නාම කරන්න ගියාම වෙන්නේ වෙන දෙයකි. ඒ පාර මිනිසුන් ඇවිත් ප්‍රශ්න ගැටළු දමනවා. එමනිසා ඒ සම්බන්ධවත් මේවා කරන්න. ඒ වගේ ම අපේ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා කිවූ පරිදි තානායම සම්බන්ධව අපේ යෝජනාව සම්මත වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා කිවූ දෙයට ලේකම්තුමිය පිළිතුරු දෙයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව අපි පුද්ගලිකව කතා කළ යුතුයි. මොකද ඒ දැනුවත් කිරීමක් කිසි දෙයක් කළේ නැහැනේ. දැන් මාස 4ක් වෙනවා. ඔය කියන දේ කිවුවේ නැහැනේ. දැන් මේ අහනකම් මේ මාස 5කට කලින් ගත්ත තින්දුව. ඔන්න නගර සභවේ තින්දුව ක්‍රියාත්මක වන ආකාරය.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි මා විසින් සභාවට එකක් කියන්න ඕන. මෙතැන ලුෂන් වඩු තන්ත්‍රි විතරයි මේ ගමට අයිති කෙනෙකුට සිටින්නේ. අනිත් දෙන්නාම මේ ගමට අයිති අය නෙමේ. මේවා එකක් තිබෙනවා නම් ගමේ කට්ටිය යොදා ගන්න. අපේ කමල් ජයසේකර සිටිනවා. ආනන්ද සිල්වා ඉන්නවා. හිටපු සභාපතිවරු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්</u>**

හරි ඒ අය යොදා ගන්න. නිතිඥ ලුෂාන් වඩුතන්ත්‍රි මහතා, නිතිඥ  කමල් ජයසේකර මහතා ,නිතිඥ ආනන්ද මහතා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ නිතිඥ මහත්වරු දමා මොකක්ද යෝජනා කළේ සභාව. මා එදා හිටියේ නැහැ. එදා අපි කිවුවේ ගරු සභාපතිතුමා මේ ගිවිසුම් වල තිබෙන නිත්‍යානුකුලභාවය පිළිබඳව මේ සභාවේ ගරු මන්ත්‍රීවරු අපිව දැනුවත් කරන්න. වෙන අපි කිසි දෙයක් ඉල්ලුවේ නැහැ. මා ලිඛිතව මා අද යෝජනා කරනවා මේ අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් , අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් අපි ඉල්ලීමක් කරන්න . අම්බලන්ගොඩ ජන්ම අයිතිය තිබෙන මේ නිතිඥවරු තිදෙනාට මෙන්න

මෙහි තිබෙන අම්බලන්ගොඩ ජනතාවට තිබෙන නගරයට තිබෙන යහපත අයහපත පිලිබඳව සභාවට ලිඛිතව අපි දැනුවත් කරන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙම දෙයකුත් තිබෙනවා. නිතිඥ තුන්දෙනා කවදාවත් එක තැනක වාඩිවෙලා කතා කරන්නේ නැහැ. සරලව ගමේ කෙනෙකු නම් තමන්ගේ ගමේ වැඩය කියා ඒවි. එන්නේ නැහැ ඒ විදියට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

අපි ලියුම් තුනක් ගසා දෙන්න ඒ විදියට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඊට වැඩියේ හොඳයි. මේ තිදෙනාට මේ ගිවිසුම යවා මේ ගිවිසුමේ තිබෙන යම්කිසි දෝෂ සහගත තිබෙනවා නම් ඔබතුමාගේ ලිඛිත නිරික්ෂණ එවන්න කියා. ඔබතුමා අයකරන ගාස්තුවක් තිබෙනනම් එකත් දන්වා එවන ලෙසටත් දැනුම් දෙනවා. අන්න එක තමයි ක්‍රමය. නැතිව තුන්දෙනාම එකට වාඩි කරන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඕක තමයි ගරු උප සභාපතිතුමායි මායි ඉල්ලුවේ. හැබැයි එදා තව එකක් අපි කිවුවා. මෙය යවද්දි ගිවිසුම් තුන පමණක් නෙමේ. නගර සභාවේන් ගසන ලද ලිපිත් , එම සමාගම නම් මාරු කර එවන ලද ලිපිත් සියළු ලිපි ගොනුවේ ඇතුළත් විය යුතුයි. අපි එවා සටහන් කලේ. මේවා ඔක්කොම එකතු කරලා යවන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගිවිසුම කවුරු හරි කඩ කර තිබෙනවාද? කවුද එය කඩ කර තිබෙන්නේ. කියන එකත් අපිට දැන ගන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය ඇත්තටම යැවිය යුත්තේ සිවිල් සම්බන්ධ දන්න කෙනෙකුට. ඔය එක්කෙනෙකුටවත් නෙමේ. ඔය එක් කෙනෙකුවත් සිවිල් කරන එක් කෙනෙක් නෙමේ. මේ අම්බලන්ගොඩ කරනවා නම් කමල් ජයසේකර තමයි සිටින එකම එක්කෙනා. ආනන්ද මහතා සිවිල් කරනවා. එතකොට හිටපු සභාපති කෙනෙක්. ඔබතුමාලාට ඕන නම් ඒ කෙනාට යවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ඔය ඔක්කොටම වඩා ලේහේසි නැද්ද? නිතිඥ ආනාන්ද වික්‍රමසේකර මහතා ජනාධිපති නිතිඥ . සිවිල් වලට සිටින හොඳම කෙනා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගාලු දිස්ත්‍රික්කයට සිටින හොඳම කෙනා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

අපි නිතිඥ ආනන්ද මහතාට යම් මුදලක් ගෙවා කවුරුහරි අතේ මා විපක්ෂනායකතුමා වුණත් කමක් නැහැ. මා වේලාවක් අරගෙන දෙන්නම්. එය ගිහින් දි එතුමාගෙන් අපි උපදෙසක් ගන්න. ඕක නැතිනම් කෙරෙන්නේ නැහැ. දැන් ඔය ගොඩක් නිතිඥ මහත්වරු කරන්නේ නැහැ. ඒ අය සිවිල් ගන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්**

ඉතිං මේ දෙදෙනා සිටිනවා නම් අපි ලිඛිතව ලිපියකින් ඒ දෙදෙනාට දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ඒ දෙදෙනාටම වඩා හොඳයි ජනාධිපති නිතිඥ ආනාන්ද වික්‍රම සේකර මහතා. දකුණු පළාතටම සිටින නිතිඥ මහතෙකි. එතුමාට දුන්නොත් ගිවිසුමේ වචනයෙන් වචනය හොඳට කියාවාවි. අපිට යම්කිසි ගෙවිමක් කරන් වෙයි. එය හරිම පිරිසිදුයි. මා එතුමාට කතා කර වේලාවක් අරගෙන දෙන්නම්. අපි කවුරු හරි එක්ක යන්න. ගිහින් එතුමාට ගිවිසුම භාර දිලා කෙරෙන්න ඕන ඒ අරමුණ කිවුවාම ඒ අරමුණ මොනවාද ? එයට හරියන දේ අපිට එතුමා කියයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ  මහතා කතා කරමින්**

ඔබතුමියට යන්න බැරිද?

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

මා විතරක් යන්න බැහැ. එහෙම නම්.අපි මේ පිළිබඳ එතුමාට කතා කරලා මෙහි තිබෙන වලංගුභාවය මොනවාද ? එය කඩ වේලා තිබෙනවාද කියා ඒ ටික බලන්න. අපි ඒ ටික දෙන්න. එහෙම දි එතුමාට යම් ගාණක් අපි ගෙවනවා. ගෙවා එය හරියටම

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපි එයට අපේ ගරු උප සභාපතිතුමායි, ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතාත්, ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මී මෙනවියත් යන තිදෙනා ගොසින් ඒ අවශ්‍ය උපදෙස් ලබා ගන්න.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්__

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාත් සහභාගී කරවන්න. මා එතුමාගෙන් වේලාවක් ගෙන කියන්නම්.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

එක ලබා දෙන්න. ඒ පාර පළල් විය යුතුයි. එතැන පටුයි.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ඕක නොදුන්නොත් එහෙම අපට ප්‍රශ්නයක් වෙනවා.

**තීරණය-**

මෝදර දේවාල පාර යෝජිත හෝටල් ව්‍යාපෘතියේ මූලික සැලසුම් නිරාකරණ පිළිබඳව එවා ඇති වාර්තාවට අනුව අංක 03 කොන්දේසිය යටතේ ඇති **යෝජිත භූමියට ඊසාන දෙසින් පවතින මෝදර දේවාල පාර අඩි 30 ක් වන සේ පුළුල් කිරීමට** අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:14 හල්වතුර කසල අංගනයට Rydal OE නමැති රසායනික දියර ඉසීම සඳහා Mixed bowler යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

හල්වතුර කසල අංගනයට Rydal OE නමැති රසායනික දියර ඉසීම සඳහා Mixed bowler යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම. අම්බලන්ගොඩ නගර සභාව. හල්වතුර කසල අංගනයට දුගඳ ඉසින යන්ත්‍රය මිලදී ගැනීම සම්බන්ධයෙන් 07.02.02 2020.02.11 දින සභා තීන්දුව හා බැදේ. ඉහත මහජන සෞඛ්‍ය පරීක්ෂක තාක්ෂණ සේවා නිලධාරී , පරිසර නිලධාරී , ලේකම් ගණකාධිකාරී ඇතුළු ගරු මන්ත්‍රීවරුන් ඇතුළු කමිටුවක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මිල ගණන් කැඳවීම සුදුසු වේ. ඒ අනුව පහත සඳහන් මිල ගණන් වලට යන්ත්‍රය ගරු මන්ත්‍රීවරුන් විසින් පරීක්ෂා කරන ලදී. ඒ අනුව මිල ගණන් කැඳවීමට සභාව තීරණය කරන ලදී.

**තීරණය-**

හල්වතුර කසල අංගනයට Rydal OE නමැති රසායනික දියර ඉසීම සඳහා Mixed bowler යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා පරිසර විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.15 අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල, අංක 04 ලිපිනයේ පදිංචි එච්.ගර්ලි ෆෝන්සේකා මහත්මියට වෙළඳාම් කටයුතු කරගෙන යාම සඳහා කඩකාමරයක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බස්නැවතුම්පොළේ තිබුණ එක කඩයක් ඉවත් කළා. ගර්ලි එච්.ගර්ලි ෆෝන්සේකා මහත්මිය . හේතුව අනවසර කැලි වැඩියෙන් තිබුණ නිසා. එය නැවත ලබා ගැනිමට ඉල්ලිමක් කර තිබෙනවා. ඒ අනුව පහත කොන්දේසි වලට යටත්ව එම මහත්මිය නගර සභාවට ගෙවිය යුතු මුදල . එම මහත්මියගේ හිඟ මුදලක් තිබුණා රු.14750ක මුදලක්. ඒ අනුව එය මාසයකට රු.2000/= බැගින් වාරික සමඟ ගෙවිලා යන්න දෙන්නත් ඒ වගේම ගිවිසුම් කාල සිමාව වසර 03ක් ලබා දෙන්නත් , නගර සභාවට සංවර්ධන කටයුත්තක් කිරිමේදි ඕනෑම අවස්ථාවක ඉවත් කිරිමට අවශ්‍යයි කියා හිතෙන විට ඉවත් කිරිමටත් , කඩ කාමරයේ කසළ ඉවත් කිරිම නගර සභාවට භාරදිය යුතවේ. කලින් තිබුණ කොන්දේසි වලට යටත්ව ලබා දෙන්න සභාව තින්දු කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, කළුවඩුමුල්ල, අංක 04 ලිපිනයේ පදිංචි එච්.ගර්ලි ෆෝන්සේකා මහත්මියට වෙළඳාම් කටයුතු කරගෙන යාම සඳහා කඩකාමයක් ඉල්ලීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය අනුව බස් නැවතුම්පොළ ඇතුළත පිහිටි අංක 02 වෙළඳ කුටිය ගිවිසුම්ගත කොන්දේසිවලට යටත්ව වෙළඳ කටයුතු කරගෙන යාම සඳහා ලබාදීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:16 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ කාණුවේ ජලය නොබැසීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මහජන ක්‍රිඩාංගණයේ කාණුවේ ජලය නොබැසිම සම්බන්ධව. උක්ත කරුණ සම්බන්ධයෙන් කාණුවේ මට්ටම් කර ගැනිම සිදු කරයි. පුද්ගලික ඉඩම් කෙළවරේ සිට නගර සභාව වෙත ජල බැස්මක් පවති. මට්මක් ලෙස 190 මිලි ලිටර් මෙම පෞද්ගලික ඉඩම කෙළවරේ සිට ක්‍රිඩා ගාරයේ මතුපිටින්ද ජල බැස්ම පවතී. මට්ටමේ වෙනස මිලි ලිටර් 200 ජලය බැසිමට නොහැකි වි ඇත්තේ ජලය බැස යන කාණුවේ අපද්‍රව්‍ය , පස් හා කොළ රොඩු විශාල ලෙස එකතු වි ජලය ගමන් කිරිමට බාධාවක් වි තිබිම. එමනිසා කාණු සුද්ද කර කාණුවේ රැදි ඇති අපද්‍රව්‍ය ඉවත් කර නඩත්තු කර දිනපතා සිදු කිරිම කර යන්නේ නම් මෙම ජලය රැදි නොසිට ගලා යන බව නිගමනය කළ හැක. එබැවින් කාණුව සුද්ද කර නගර සභා භුමියේ පවතින දෝබ ගසේ සහ සියඹලා ගසේ ක්‍රිඩාංගණය වන්නට පිහිටා ඇති අතු කපා ඉවත් කිරිම සුදුසු බව වාර්තා කර තිබෙනවා. තාක්ෂණසේවා නිලධාරි වාර්තා කර තිබෙනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ කාණුවේ ජලය නොබැසීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය අනුව තාක්ෂණ සේවා නිලධාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:17 ගා/පී ද එස් කුලරත්න විද්‍යාලය විසින් විනෝද බදු වශයෙන් තැන්පත් කර ඇති මුදල නිදහස් කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

2020.02.11 දින සභා රැස්විමේ සභා තීරණ අංක 12.13 යටතේ ප්‍රසංග විනෝද බද්දෙන් නිදහස් කොට ඇත.2020.02.23 දින ප්‍රසංගය පැවැත්වුණ කුලරත්න විද්‍යාලයේ සුබ සාධක සංගමය මගින් රු.346000/= ක ලාභයක් ලැබි ඇති බවට වාර්තාවෙන් ලබා දි ඇත. කුලරත්න විද්‍යාලයීය ගුරු සේවක සංගමය ලංකා බැංකු ගිණුමට බැර කර ඇති බවට ලබා දි ඇත. ටිකට් පත් මුදා තැබිමේදි රු.385000/= ක මුදලක් තැන්පතුවක් කර ඇති අතර එම මුදල නිදහස් කිරිම සුදුසු යයි යෝජනා කරනවා. දැන් මෙහිදි ගරු මන්ත්‍රිවරු සලකා බැලිය යුතු කාරණයක් තිබෙනවා. මේ ප්‍රසංගය කර පාසැලට බැදලා තිබෙනවා රු.346000/= ක මුදලක් . අපට බැඳලා තිබෙනවා රු.385000/= ක්

විනෝද බදු වශයෙන්. ඒ විනෝද බද්ද නිදහස් කිරිමට තමයි අනුමැතිය ඉල්ලන්නේ. සභාව අනුමත කර තිබෙනවා විනෝද බදු නිදහස් කරන්න. දැන් අපේ පණත අනුව අපිට බදින්න එපැයි. එම බැදපු මුදල ආපසු නිදහස් කිරිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.තත්ත්වය ඔන්න ඔක තමයි. අවබෝධ කර ගන්න. මේ කරන පිරිස් ඒ දෙනවා කියන ආයතනයට දෙනවා කියන ප්‍රමාණයට වඩා වැඩි මුදලක් අපි දෙනවා. මේන්න මේ තත්ත්වය තිබෙන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, දැන් අලුතෙන් ගත්ත තින්දුව අනුව ගියාම හරි. දැන් අපි විනෝද බදු අයකරන ක්‍රමවේදයක් ඇති කළානේ. අඩු නොකර එම ක්‍රමයට ගියාම හරි. ඔන්න ඒපාර එම ක්‍රමයට ගියාම හරි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

නැහැ. අදත් ඔගොල්ලන් 3ක් විතර අඩු කලානේ. මේකයි මා දකින්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

දැන් අපි අලුතින් හැදුවානේ 1000 ටිකට් එකට 10%.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අපි දැන් පාසලකට කියා විහාරස්ථානයට මෙය දුන්නානම් . විහාරස්ථානයට රු.310000/= දිලා අපි. රු.385000/= ක් නිදහස් කරනවා. අන්න එතනයි තිබෙන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමා කියන කතාව හරි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__

අපි එහෙනම් විහාරස්ථානයට දුන්නානම් හරි. හැබැයි ඉතිං එහෙම ක්‍රමයක් නැහැ. අපි දෙන්න ඕන මෙතැන නම තිබෙන එක්කෙනාට.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මෙහෙම කරන්න. අපි අලුතින් සංශෝධනයක් ඇති කලානේ.1000 ටිකට් එකට 10% 1500 එවාට 15% නේ. ඒ ක්‍රමය අපි අඩු නැතිව හැමෝටම පැහැදිලි කර දෙන්න. අපි

නගර සභාවට ගන්න. මොකද නගර සභාව කියන්නේ පොදු ආයතනයක්. එක නිසා මෙකටත් එකක් තිබෙන්න එපායි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මේ විදියට නිදහස් කරන ප්‍රමාණය ලක්ෂ 25000/= කට වැඩියි. අවුරුද්දට ලක්ෂ 25000/= පනිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සේවකයෙක් යනවානේ. මේ විදියට රාත්‍රියට හරි ගෙනහින් එවාට යවන්න ඕන. ඒවත් තිබෙනවානේ. ඒ ගෙවිම් ගිහින් තිබෙනවා නම් ඒ ගෙවිම් අඩු කර ගන්න. නැතිනම් බැහැනේ. අපිට පාඩුවක් වෙනවා. අපි සභාවෙන් තින්දුවක් ගත්තා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා කරන්නේ මට එන ඒවා සභාවට ඉදිරිපත් කරනවා. එතකොට සභාව විසින් කල්පනා කර බලන්න ඕන මෙකෙන් නිදහස් කිරිම. අඩුම ගණනේ එක ප්‍රතිපත්තියකට එන්න ඕන. මොකෙන් වුණත් සියයට සියයම නෙමේ. සියයට 50ක් නිදහස් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි අපි සභාවෙන් මෙය අඩු කළේ මොකද? ගරු සභාවට හැමදාම ලියුම් එන නිසා තමයි ඔය අඩු වීමට කළේ. එමනිසා එම මුදල ගත්තා කියා ප්‍රශ්නයක් නැහැ. නගර සභාවේ පැවැත්මට තිබෙන්න එපැයි මොනවා හරි. එමනිසා රු.1000/= ටිකට් එකට 10%

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි ඔය කට්ටිය ඇවිත් සභාවේ පිටුපස වාඩි වෙලා සිටිනවා. එතකොට ගරු මන්ත්‍රිතුමලා මුකුත් කියන්නේ නැහැ. දැන් කොස්ගොඩ එකට දුන්නා. ඒ වේලාවේ ලියුම දුන්නා. එය අනුමත කලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඔය අලුතෙන් හදපු ක්‍රමයට එගොල්ලන්ට අවාසියක් වෙන්නේ නැහැ.රු.1000/= ප්‍රවේශපත්‍ර මුද්‍රණය කළාම 10% දෙන්න වෙන්නේ. ඒ ක්‍රමයක් අනුගමනය කළ හැකියි ඒ අයට. මා නම්

කියන්නේ එය කරගෙන යන එක හොඳයි. ආදායමක් එන්නේ නැති නිසා. දැනට ඕක ඔහොම යන්න. දැන් අපි සභාවේ කට්ටිය එක්ක සාකච්ඡා කරලා තින්දුවක් ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් හුඟාක් ආදි ශිෂ්‍ය සංගම් කියා අම්බලන්ගොඩ නම් හොර වැඩ කරන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා අදම මා යෝජනාවක් ගෙන එනවා. නව බදු සංශෝධන අනුව පාසැල් වලට විදුහල්පතිවරුන්ට දැනුම් දෙන්න. මින් ඉදිරියට ඒ බදු ක්‍රමය යටතේ අය කරනවා. ඒ අනුව බදු මුදල් නිදහස් කරන්නේ නැහැ කියා. අදම ගරු සභාපතිතුමනි පාසැල් වලට යවන්න. අපි මේ පාසැල් හින්දානේ අඩු බදු මුදලක් අයකළේ. ඇත්ත කතන්දරය එකනේ දැන් මෙතැන සාකච්ඡා කළේ. එකවත් ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් සභාව තුළ . මා යෝජනා කරනවා .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, මේ සභාවට නෙමේ ලබන සභාවට දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

මේ ලාභය ඔක්කොම එක පුද්ගලයෙකු අතට යනවා. නගර සභාව නිකන් නමක් දමා ගන්නවා. ඕකට මොකක් හරි ක්‍රමවේදයක් හදන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සියළු ගරු මන්ත්‍රීවරු මෙය දැන ගන්න. දැන් මෙහෙම දෙයක් තිබෙනවා. කුලරත්න විද්‍යාලයට වුනත් නිදහස් කරනවාට වැඩියේ හොඳයි අපි කුලරත්න විද්‍යාලයට නගර සභාවෙන් මොනවාහරි දෙයක් කරනවා නම්. එම ආදායම එම ප්‍රතාලාභ ලැබෙන විදියට එම පාසැලට අපි දෙන්න පුළුවන්. මෙය යන්නේ අම්බලන්ගොඩ ගා/ පි ද එස් කුලරත්න විද්‍යාලයේ සුබ සාධක සංගමයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, අපි සභාවේ එකමතික තින්දුවක් ගන්න. මෙය එක එක්කෙනාට ඕන විදියට වෙනස් කරන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි මුදල් බැඳ තිබෙන්නේ එම්.එම් අජිත් නන්දන කියන මහතා. එතකොට අජිත් නන්දනට තමයි යන්නේ. නැහැ සුබ සාධක සංගමයට දීලා තිබෙන්නේ. මෙය අනුමත කර තිබෙන්නේ ඔගොල්ලන්. දැන් නිදහස් කරන්නයි තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඒ වුණාට විදුහල්පතිතුමාගේ අත්සන නැතිනම් නිදහස් කරන්න එපා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් වෙලා තිබෙන්නේ මෙකයි. විදුහල්පතිතුමාගේ නමින් දැම්මාට උදාහරණයක් වශයෙන් සිරස කඩ මණ්ඩියේ අපි විනෝද බදු අයකිරිම සම්බන්ධයෙන් අපිට වංචා කරපු ලොකුම එක්කෙනා වංචා කරපු එක්කෙනා තමයි සිරස. සිරසෙන් වංචා කළා. ඒ වංචා කළාම ක්‍රිඩා පිටිය වෙන් කර තිබෙන්නේ බැලුවාම සිරස නෙමේ. දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා. අපි එහෙනම් විදුහල්පතිතුමාම උසාවි ගෙනියන්න ඕන. මේ කරන කට්ටිය සුක්ෂම එය මග හරින්න ලෙඩ ඔක්කොම ඇද ගන්න තමයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා, විදුහල්පතිතුමාගේ අත්සනින් එන ලිපියට නිදහස් කරලා එතුමාගේ නමින් වෙන් කරන්න කිවුවාම ඉවරයි. අපිට අදාල නැහැනේ වෙන්නේ මොකක්ද කියා.එතකොට එම පාසැලට තමයි ඒ අදාල මුදල් යන්නේ. එතකොට ඔය කියන වංගු වලට යන්න විදියක් නැහැ. විදුහල්පතිතුමාගේ නිර්දේශය මත තමයි යන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහි චෙක්එක ලිවිය යුත්තේ කාටද කියා කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා , එකමතික තින්දුව දෙන්න. නගර සභාවෙන් කිසිම කෙනෙකුට දෙන්නේ නැහැ කියා. යාළුවෙකු පැමිණියත් අපිට කියන්න පුළුවන් අනේ තරහා වෙන්න එපා දෙන්නේ නැහැ. සභාව තීරණය කර තිබෙන්නේ. මා යෝජනා කරනවා මේ සභාවෙන් එකමතිකව තින්දුවක් ගන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් අපි සභාවෙන් බදු මුදල අඩු කළා. එක අය කළාට ගැටළුවක් නැහැ. මොකද එක කෙරෙන්න ඕන එකක්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

සුබ සාධක සංගම් වලට නම් නිදහස් කරන්න එපා. අපි නම් විරුද්ධයි. මා විරුද්ධයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාව විසින් නිදහස් කරපු එකක් . මා ඉල්ලන්නේ මේ නිදහස් කරපු එක රු.10000/= ට වැඩි වෙනකොට ඔගොල්ලන්ට ගිහින් මුදල් නිදහස් කරන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

සභාවට ලිපිය එන්නේ අර පාසැලට , අහවල් දේට කියා සභාගත කරන්නේ. අපි දන්නේ නැහැනේ පුද්ගලයෙක් කියා මෙය කරන්නේ. අපි අනුමැතිය දෙන්නේ පාසැලට. පුද්ගලයින්ට නෙමේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

පුද්ගලයින්ට නිදහස් කරන්න ඉස්සර වෙලා විදුහල්පතිතුමාගෙන් ලිපියක් ගෙන එන්න කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

නිදහස් කරන්න ඉස්සර විදුහල්පතිතුමාගෙන් ලිපියක් ගෙන්න කියන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කාටද නිදහස් කරන්න ඕන. කවුද මුදල් බැඳ තිබෙන්නේ මේකට. බැඳපු කෙනාගේ නම කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ඒ වුණාට සංගමයට නිදහස් කරන්න. තුන්දෙනෙක් අත්සන් කර තිබෙනවානේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මෙය නිත්‍යානුකූලව නිදහස් කළ හැකිද? මේ නිදහස් කරන විට මෙය නිදහස් කළ හැක්කේ පාසැල් සංවර්ධන සමිතියේ ගිණුමට විතරයි. වෙන කිසිම එහකට යන්න බැහැ. එතකොට සියයට සියයක් අපි බලා පොරොත්තු වෙන දේ පාසැලේ වෙනවා. ආදි ශිෂ්‍ය සංගමෙන් කළත් උන් කරන කොටසිස් කොටස පාසැලට අයිතියි. ආදි ශිෂ්‍ය සංගමේත් එකින් එක වෙනස්. ආදි ශිෂ්‍ය සංගමෙන් උත්සවය කළා. එම මුදල දුන්නා. උන් එක එක පාටි දමන්න. පුළුවන්. මටයි කියා එහෙම සහතික දෙන්න බැහැනේ. නමුත් විදුහල්පතිතුමාගේ ලිපිය අනුව විදුහල්පතිතුමාට ලිපිය

දෙන්න බැහැනේ. මේ මුදල් තැන්පත් කළානම් මේ මුදල් යා යුත්තේ පාසැල් සංවර්ධන සමිතියට. කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. කාටවත් මුකුත් කරන්න බැහැ. එතකොට ඕනම සමිතියකට.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ චෙක්පත විදුහල්පතිතුමා නමට ලියන්න හැකියාව තිබෙනවාද? ඒ වුණාට ඔගොල්ලන් පුද්ගලික නමකට මුදල් ගෙන තිබෙන්නේ. අන්න එතනයි ප්‍රශ්නය තිබෙන්නේ. කවුද මෙයට මුදල් බැඳ තිබෙන්නේ. මුදල් බැඳපු එක්කෙනාගේ නම කියන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , කවුද මුදල් බැඳ තිබෙන්නේ. කියක් බැඳ තිබෙනවාද?

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මුදල් පාසැලට ලබා දී තිබෙනවා

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ඒ වුණාට පාසැල් සංවර්ධන සමිතියට නිදහස් කරන්න ලිඛිතව දෙන්න මෙම මුදල් පාසැල් සංවර්ධන සමිතියට භාර ගන්න කියා. එතකොට අජිත් නන්දන කියන කෙනාට අපිට සභාවට ලිපිය දෙන්න පුළුවන් මෙම මුදල් පාසැලේ සංවර්ධනය සඳහා පාසැලේ පරිහරනයට ලේකම්ට හෝ පාසැලේ විදුහල්පතිතුමා නමට තැන්පත් කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ පුද්ගලික නමකට ලබා දී ඇති බැවින් එම පුද්ගලයා විසින් මෙම මුදල පාසලට මුදල් ලබා දෙන ලෙසට එකඟතාවය හා පාසැලේ විදුහල්පතිතුමා එම මුදල් භාර ගැනිමට කැමති බවට එකඟතාවය සහිතව ලිපියක් ලබන සභාවට ඉදිරිපත් කිරිමට තින්දු කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ ගා/පී.ද එස්.කුලරත්න විද්‍යාලයේ සුහසාධක සංගමය මගින් පැවැත්වූ නුරාවී සංගීත ප්‍රසංගයේ ටිකට්පත් මුද්‍රා තැබීමේදී කාර්යාලයට ගෙවන ලද රු.385000/- ක මුදල නැවත ලබාදෙන ලෙස ඉල්ලා සුහසාධක සංගමයේ සභාපති,ලේකම්,භාණ්ඩාගාරිකගේ අත්සනින් යුතුව එවා ඇති ලිපිය අනුව , ඉහත මුදල තැන්පත් කර ඇත්තේ පුද්ගලික නමකට බැවින් එම පුද්ගලයා

විසින් එම මුදල පාසලට ලබාදෙන බවට එකඟතාවය සහ පාසලේ විදුහල්පතිතුමා එම මුදල භාරගැනීමට කැමති බවට එකඟතාවය සහිත ලිපියක් සහිතව ලබන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- වෙනත් කරුණු

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වෙනත් කරුණු යටතේ මා අසනවා ගරු ලේකම්තුමියගෙන් අර ප්‍රජා ශාලාව පවරා ගැනීමේ ලිපිය යැව්වාද කියා. එකට තාම පිළිතුරක් නැහැ. ධීවර සංකීර්ණය. අනිත් කරුණ නම් අපේ කාර්මික නිලධාරි දෙදෙනෙකු බඳවා ගැනිම සඳහා ඔබතුමා පෞද්ගලිකව කතා කර යොමු කළා. මොකද එය දිගින් දිගටම අසන විට ඒ අදාළ නිලධාරිණිය පැමිණ ඔබතුමාට කිවුවා දෙසැම්බර් මාසයේ ලබා දෙනවා කියා. මේ තාක්ෂණසේවා නිලධාරින් දෙදෙනෙකු බඳවා ගන්න. කොන්ත්‍රාත් පදනම යටතේ. මේ වනකම් එම කාර්ය කෙරුණේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කාර්මික නිලධාරින් බඳවා ගන්න බැහැ අපට. පුහුණුව සඳහා ලබා ගත හැකියි. ඉතිං අපිට ලැබුණා. අපි එම විදුහල්පතිතුමාට දන්වා තිබෙන්නේ. එය ලැබුණාම අපි එය දමන්නම්. දෙන්නම් කියා පොරොන්දු වෙලා තිබෙන්නේ. එගොල්ලන් නිතරම බලා පොරෝත්තු වන්නේ මේ ප්‍රදේශයට ආශ්‍රිතම එක්කෙනෙකු සේවය යෙදවිමට.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එක තමයි දෙසැම්බර් මාසයේ දෙන්නම් කියාපු එකනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එක තමයි ඒ අය ඇත ඉන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත සිටියත් පුහුණු කට්ටිය ගන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා ඕන වේලාවක එන්.ඩී එස් හරි එන්.ටී . එස් හරි කරපු කෙනෙකු සිටිනම් ගන්නම්. අනිත් එගොල්ලන්නම් එවන්න එපා. කාර්මික විද්‍යාල වලින් ඉගෙන ගත්ත කට්ටිය මෙතැනට ඇවිත් ඉන්නේ ඉගෙන ගන්න. ඉගෙන ගත්ත කෙනෙකු ආවොත් ගන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු සභාව සම්බන්ධ කරගෙන දින 7ක වැඩ පිළිවළක් ගියා ගම්වල වැඩ කරන්න. අවස්ථා ගණනකදි වෙනත් කරුණු යටතේ කතා කරන්න හිටියා. සභාව නැවැත්තුවා . මට දැනගන්න පුළුවන්ද මෙය ක්‍රියාත්මක වෙනවාද? විශේෂයෙන් මාගේ ගමේ මාස 6කට පසු මොනවත් කළේ නැහැ.ඒ අපේ ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා යෝජනා කරන ලද ප්‍රශ්න වෙච්ච නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපේ ගමට තවම ආවේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඒක ගන්න එක ගරු මන්ත්‍රීවරයා දැන ගත යුතුයි. මෙය ක්‍රියාත්මක වෙනවාද? නැද්ද ? නැතිනම් අපිට සියළු ගම්වලට කාණු පද්ධති සුද්ද කරලා , තණකොළ කපලා ඒ වගේ වැඩ සටහනක් තිබෙන්න එපැයි. කොට්ඨාශ 12 ,13 තණකොළ කපන්න බැහැ. සියළු කොට්ඨාශ වල කාණු පද්ධතිද , තණකොළ ටිකද සේවකයන් යොදවා ක්‍රියාත්මක කරන්න කියා මා ඉල්ලා සිටින්නේ. මා දින 6ක් 7ක් ඉල්ලුවා . වැඩ පරිපාලකතුමාට කිවුවා. විෂය කරන සෞඛ්‍ය අංශයේ නිලධාරිතුමාට කිවුවා. දින 6ක් විතර කිවුවා. ලේකම්තුමිය නම් දැනුවත් කරන්න බැරි වුණා. සභාවේ වැඩ තියෙනවා කිවුවා. මේ සුමානේ වැඩටික අපි ලස්සනට කළා. ගරු මන්ත්‍රීවරයා සම්බන්ධ වෙන්න ඕන. මොකද මාගේ වැඩ පාඩු කරගෙන තමයි මා එම සුමානයේ සිටියේ. අපි එය හරියට කරනවා නම් අනිත් කොට්ඨාශයේ මන්ත්‍රීවරුත් දැන ගන්න ඕන එය හරියට කරන්න.කරන්නේ නැතිනම් මාගේ සුමානය හරි මට අරගෙන දෙන්න. අනිත් අයට එපා නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒවා ඉවරයි. දැන් ඊළඟ මාසයට. ඇත්තටම ඔබතුමාටත් , අනිකුත් සියළු ගරු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙනවා. ඕකන්දේ වසර 15ක් පමණ ජලය නොමැතිව තිබුණා. ප්‍රජා ශාලාවේ. එය ලැබුණා. ඒකට මැදිහත් වුණා අපේ ලේකම්තුමිය. අපි ස්තුති වන්ත වෙනවා.

ඉන්පසු දැන් සම්බන්ධතාවයක් ඇති කරලා මේ ඊයේ පෙරේදා එය ලබා දුන්නා. ලේකම්තුමිය හොයා බලා එම වැඩය කළා. එයට ස්තූතිය පුද කරනවා. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික මහතාට කොහොමත් වෙනම ස්තුති කර ගන්න . එක ප්‍රශ්නයක් නැහැ. අපි දෙන්නා මිත්‍රයෝ දෙන්නානේ. එක කිසි ප්‍රශ්නයක් නැහැ. දැන් අපේ සපිරි ගමක් යටතේ යෝජනා කරන ලද පාර . පාරේ කොනේ යන්නම බැහැ. පාරේ පැච් ටිකක් හරි දමන්න. යන්නම බැහැ. එතැන යන්නම බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

වැඩ සටහන කෙරෙනවා. ඉතිං එතැනින් කෙරෙනවා නම් මා නැවත මුදල් දෙන්න ඕන නැහැනේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මේ පැත්තේ අපේ නගර සභාවෙන් බැඳපු එකක්. දැන් කොයි වේලාවේ හරි කැඩෙනවා. පාස්වෙලා තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ . එක ප්‍රශ්නයක් නැහැ. හදලා දෙන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, කනද් මාවත කාණුව කොන්ක්‍රිට් කිරිම . ඇස්තමේන්තු හදලා ගාල්ලෙන් අනුමත වෙලා ආවා ගිය වසරේ 7වෙනි මාසයේ. තාම හදලා නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේක යටතේ කරනවා කියා එම කාණුව කඩා දැම්මා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ඒ ප්‍රාදේශිය සභාවෙන් ආවේ පොඩි කැල්ලක් කැඩුවා. එය දැන් නතර කරලා. ඒ කැල්ල වෙන්නේ නැහැ. එතැන සිට උඩහට මේ ඇස්තමේන්තුව තිබෙන්නේ. ඒ ජනතාවගෙන් හරි කරදරේ. තාප්ප කඩන් වැටෙනවා. ප්‍රධාන කාණු පද්ධති දෙකක් මෙයට සම්බන්ධ වෙලා තිබෙනවා. විශාල ප්‍රශ්නයක් එතැන. එමනිසා මේ කාණුව සෑදිම ඉතාම අත්‍යාවශ්‍ය වෙලා තිබෙනවා. මේ ඇස්තමේන්තුව ලක්ෂ 8 ගණනක්. මෙය අනුමත වෙලා තිබෙන්නේ. මේක කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නොවැම්බර් මාසයේ එන්න ලැබුණේ නැහැ. අර නිවාඩු අනුමත කර ගැනිමට මා ඉල්ලිමක් කරනවා. ගරු මන්ත්‍රිවරුන්ගෙන් විමසා බලා මට එම නිවාඩු ලබා දෙන්න. මට නොවැම්බර් මාසයේ සභාවට එන්න බැරි වුණ එකට නිවාඩු අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා. විරුද්ධ කවුරු හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මහ අම්බලන්ගොඩ පාර කාපට් කරන්න කලින් අර ජල සම්පාදනයට දැම්ම ලිපියක් යවන්න. මොකද ජලනල පරණයි. ඕක කළාට වැඩක් වෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ පාර දැනට කඩන්න නියමිතයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් . ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර අපේ නිවෙස් අසළ කාණුවක ප්‍රශ්නයක් තිබෙනවා. අපි කාපට් එක දමන්න කලින් අපි හරි බෝක්කුවක් දමා දෙනවාද එතැනට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ඕන වේලාවක කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත් කර කරන්න. මා මුදල් ලබා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

අසල් වැසි නිවසේ කුමාර මල්ලි ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාට කියා තිබෙනවා එය. දැන් මොකක්ද කරන්නේ එකට.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉතිං එකට අපි ඕන වේලාවක මුදල් දෙන්නම් වැඩය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් . ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

කොහොම හරි කාපට් එක දමන්න කලින් එය මොකක් හරි කරලා අවසන් කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අසල් වැසි නිවසත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉතිං අසල් වැසි නිවසත් සමඟ ඔබතුමිය ප්‍රශ්නය විසඳා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය   කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ ගොල්ලන් කියන්නේ පාර මැද්දෙන් දමන්න කියා. බටයක් අරගෙන දෙන්නම් කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාණුව තිබුණ තැනින් කාණුව දමා ගන්න. එච්චර ප්‍රශ්නයක් වෙන එකක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා    කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළේ කාණුවල අර මේවා දමන්න. ලේකම්තුමියගෙන් අහන්න කොන්ත්‍රාත් එක දුන්නා ද කියා. දැන් සභාව වාර කිහිපයකට කලින් තමයි මෙය අනුමත වෙන්නේ. යකඩ මේවා දමන එක. අපෙන් ජනතාව අහනවා. මොකද සංවර්ධන කමිටුවේත් කතා කළා. මේ පාරත් කතා කලාවි

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය පිළිතුරු දෙනවා ඇති.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා    කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කලිනුත් කිව්වා. බස්නැවතුම්පොළේ කාණුවලට  පස් වැටිලා. මෙය සුද්ද කළා.  පස් අරගෙන ගියේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා    කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කිලෝමීටර් 500 ගණනේ පාරවල් හදන එකේ . දැන් අම්බලන්ගොඩ නගර සභාවේ පාරවල් කාපට් කරන්න දමා තිබෙනවා නේ. ඒ දැම්මාම මා එදත් කිව්වා ලිපියකින් දැනුම් දෙන්න ජලසම්පාදන මණ්ඩලයට. අපි මේවා කාපට් කරනවා. ආපහු මේවා කඩන්න බැහැ. එයින් කියනවා ඔගොල්ලන්ගේ මාර්ග අයිනකට දමා ගන්න කියා. සමහර වායු සමීකරණ තියෙද්දි  වායු සමනය කරලා අපි කඩනවා. කැඩුණාම ආපහු හදනවා. දැන්මම ඒක අනිවාර්යෙන්ම ලිපියකින් දැනුම් දෙන්න. ජලසම්පාදන ඔණ්ඩලයට. මෙන්න මේවා කර ගන්න කියා. අපිට ගාණක් ඕන නැහැ. ජල නල මාර්ගය දමා ගන්න කියන්න. නැතිනම් අපිට ප්‍රශ්නයකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.